// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2355/28 - 2023 ඔක්තෝබර් මස 25 වැනි බදාදා - 2023.10.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව

1996 අංක 27 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතින් සංශෝධිත 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතේ 17 සහ 18 වන වගන්ති ප්‍රකාරව නිකුත් කරන ලද පද්ධති බලපත්‍ර නිකුත් කිරීම, අළුත් කිරීම, හිමිකම් පැවරීම, සංශෝධනය කිරීම සහ ප්‍රත්‍යාදිෂ්ට කිරීම පිළිබඳ නව මාර්ගෝපදේශ සහ පටිපාටි.

ඒ අනුව 2006 මාර්තු 10 දිනැති අංක 1435/20 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද, 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ (සංශෝධිත) පනතේ 17 සහ 18 වන වගන්ති ප්‍රකාර ව නිකුත් කරන ලද පද්ධති බලපත්‍ර නිකුත් කිරීම, අළුත් කිරීම සහ සංශෝධනය කිරීමේ මාර්ගෝපදේශ සහ පටිපාටි මෙයින් අවලංගු කරනු ලැබේ.

**මධුශංක දිසානායක,**
අධ්‍යක්ෂ ජනරාල්,
ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව.

2023 ඔක්තෝබර් මස 23 වැනි දින,
ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව,
276, ඇල්විටිගල මාවත,
කොළඹ 08.

## පටුන


1. **පොදු**

2. **උපලේඛනය 1: අ** කොටස - පහසුකම් පාදක කරගත් විදුලි සංදේශ ක්‍රියාකරු (FBO) බලපත්‍ර නිකුත් කිරීම

   2.1. නව බලපත්‍ර අයැදුම් කිරීමේ මාර්ගෝපදේශ
   2.2. නව බලපත්‍ර අයැදුම්පත් ඇගයීමේ නිර්ණායක
   2.3. අයදුම්පත්‍රය
   2.4. ව්‍යාපෘති ශක්‍යතා වාර්තාව පිළියෙල කිරීමේ මාර්ගෝපදේශ
   2.5. ප්‍රකාශය

   **උපලේඛනය 1: ආ** කොටසඃ සේවා පාදක විදුලි සංදේශ ක්‍රියාකරු (SBO) බලපත්‍ර නිකුත් කිරීම

   2.6. නව බලපත්‍ර අයැදුම් කිරීමේ මාර්ගෝපදේශ
   2.7. නව බලපත්‍ර අයැදුම්පත් ඇගයීමේ නිර්නායක
   2.8. අයැදුම්පත
   2.9. ව්‍යාපෘති ශක්‍යතා වාර්තාව පිළියෙල කිරීමේ මාර්ගෝපදේශ
   2.10. ප්‍රකාශය

3. **උපලේඛනය 2: අ** කොටස : පහසුකම් පාදක කරගත් විදුලි සංදේශ ක්‍රියාකරු බලපත්‍ර අලුත් කිරීම

   3.1. 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ (සංශෝධිත) පනත ප්‍රකාරව නිකුත් කරන ලද පහසුකම් පාදක කරගත් බලපත්‍ර අලුත් කිරීමේ මාර්ගෝපදේශ
   3.2. අයැදුම්පත

   **උපලේඛනය 2: ආ** කොටස : සේවා පාදක කරගත් විදුලි සංදේශ ක්‍රියාකරු බලපත්‍ර අලුත් කිරීම

   3.3. 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ (සංශෝධිත) පනත ප්‍රකාරව නිකුත් කරන ලද සේවා පාදක කරගත් බලපත්‍ර අලුත් කිරීමේ මාර්ගෝපදේශ
   3.4. අයැදුම්පත

4. **උපලේඛනය** 3

   4.1. විදුලි සංදේශ ක්‍රමයක් පවත්වාගෙන යන සමාගමක හිමිකාරිත්වය පැවරීම සඳහා කොමිෂන් සභාවේ පූර්ව අනුමැතිය ලබා ගැනීමේ පටිපාටිය
   4.2. අයැදුම්පත

5. **උපලේඛනය** 4

   5.1. 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත ප්‍රකාරව නිකුත් කරන ලද බලපත්‍ර/ බලපත්‍ර කොන්දේසි (පහසුකම් /සේවා පාදක) සංශෝධනය කිරීමේ පටිපාටිය

6. **උපලේඛනය** 5

   6.1. 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ සංශෝධිත පනත ප්‍රකාරව නිකුත් කරන ලද බලපත්‍ර (පහසුකම් / සේවා පාදක) ප්‍රත්‍යාදිෂ්ට කිරීමේ පටිපාටිය
   6.2. බලපත්‍ර ප්‍රත්‍යාදිෂ්ට කිරීමේ කොන්දේසි
   6.3. ප්‍රත්‍යාදිෂ්ට කිරීමේ පටිපාටිය සහ අභියාචනා කිරීමේ පටිපාටිය
   6.4. බලපත්‍ර භාරදීම

1. පොදු

1.1. 1996 අංක 27 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතින් ('පනත') සංශෝධිත 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත යටතේ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව ('කොමිෂන් සභාව') ස්ථාපනය කර ඇත. මෙම මාර්ගෝපදේශ සහ පටිපාටිය 2024.09.01 දින සිට බලාත්මක වේ.

1.2. 1996 අංක 27 දරන පනතින් සංශෝධිත 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතේ (මෙහි මින් මතු පනත යනුවෙන් හඳුන්වන ) 17 (1) වගන්තිය ප්‍රකාරව සහ 20 වැනි වගන්තියේ විධිවිධානවලට යටත්ව විදුලි සංදේශ විෂය භාර අමාත්‍යවරයා විසින් ප්‍රදානය කරන ලද බලපත්‍රයක් (මෙහි මින් මතු බලපත්‍රය යනුවෙන් හඳුන්වන) යටතේ හැර කිසිම පුද්ගලයකු විසින් විදුලි සංදේශ පද්ධතියක් ක්‍රියාත්මක නොකළ යුතුය.

1.3. මෙම ලියවිල්ලේ අන්තර්ගත තොරතුරු ලේඛනයේ විස්තර කර ඇති කරුණු සම්බන්ධයෙන් දැනගැනීමට උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ගේ සහය සඳහා හුදෙක් මාර්ගෝපදේශයක් ලෙස මෙය සැලසුම් කර ඇත. එසේම මෙම ලියවිල්ල නීතිමය උපදෙස් ලබාදෙන ලේඛනයක් හෝ නිශ්චිත අවස්ථාවලදී නීති උපදෙස් සඳහා ආදේශකයක් ලෙස නොසැලකිය යුතුය. එවැනි කරුණු සම්බන්ධයෙන් නීතිය අන්තර්ගත ව්‍යවස්ථාපිත විධිවිධාන කෙරෙහි අවධානය යොමු කළ යුතු බව අවධාරණය කෙරේ.

1.4. කිසියම් අයදුම්පතක් සම්බන්ධයෙන් කටයුතු කිරීමට හෝ ප්‍රදානය කිරීමට නියමිත බලපත්‍රයක නියමයන්ට හෝ කිසියම් පාර්ශ්වයකට බලපත්‍රයක් ප්‍රදානය කිරීමට අදාළ වූ කිසියම් විශේෂිත ක්‍රියාමාර්ගයකට හෝ එළැඹීමට කොමිෂන් සභාව මෙම ලියවිල්ලෙන් බැඳී නැත. එමෙන්ම පූර්ව දැනුම්දීමකින් තොරව සිය ප්‍රතිපත්ති වෙනස් කිරීමට කොමිෂන් සභාවට අයිතිය ඇත.

1.5. විදුලි සංදේශ පනතේ 17 වගන්තිය යටතේ නව බලපත්‍රයක් ලබා ගැනීම සඳහා අයදුම් කිරීමට උනන්දුවක් දක්වන පාර්ශ්වයන් සඳහා අදාළ මාර්ගෝපදේශ සහ තොරතුරු උපලේඛන 1 හි දක්වා ඇත.

1.6. විදුලි සංදේශ පනතේ 17 වැනි වගන්තිය යටතේ දැනටමත් බලපත්‍රයක් ලබා ගෙන ඇති සහ වෙනත් නිශ්චිත කාලයක් සඳහා බලපත්‍රය අලුත් කිරීමට අපේක්ෂා කරන විදුලි සංදේශ ක්‍රියාකරු සමාගම් සඳහා අදාළ මාර්ගෝපදේශ සහ තොරතුරු උපලේඛන 2 හි දක්වා ඇත.

1.7. දැනටමත් බලපත්‍රයක් හිමි සහ සමාගමේ හිමිකාරිත්වය පැවරීමට බලයලත් සහ සුදුසුකම්ලත් විදුලි සංදේශ ක්‍රියාකරු සමාගම් සඳහා අදාළ මාර්ගෝපදේශ සහ තොරතුරු උපලේඛන 3 හි දක්වා ඇත.

1.8. විදුලි සංදේශ පනතේ 17 වැනි වගන්තිය යටතේ දැනටමත් බලපත්‍රයක් හිමි සහ එකී පනතේ 18 වැනි වගන්තිය ප්‍රකාරව බලපත්‍රය වෙනස් කළ යුතු බව ප්‍රකාශිත විදුලි සංදේශ ක්‍රියාකරු සමාගම් සඳහා අදාළ මාර්ගෝපදේශ සහ තොරතුරු උපලේඛන 4 හි දක්වා ඇත.

1.9. බලාත්මක වන බලපත්‍රය ප්‍රත්‍යාදිෂ්ට කිරීමේ පටිපාටිය සහ කොන්දේසි උපලේඛන 5 හි දක්වා ඇත.

1.10. මෙම මාර්ගෝපදේශ කොමිෂන් සභාව විසින් නියාමන අවශ්‍යතා මත පදනම්ව කලින් කලට දැනුම් දීමකින් තොරව සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත බලපත්‍ර මාර්ගෝපදේශ කොමිෂන් සභාව විසින් එහි නිල වෙබ් අඩවියේ (www.trc.gov.lk) ප්‍රකාශයට පත් කරනු ඇත. මේ සම්බන්ධ සියලුම ලියකියවිලි ලිඛිතව පහත ලිපිනයට ලැබෙන සේ තැපැල්, විද්‍යුත් තැපැල හෝ ෆැක්ස් මගින් එවිය යුතුය.

අධ්‍යක්ෂ ජනරාල් ,
ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව,
අංක 276, ඇල්විටිගල මාවත, කොළඹ 08.
දුරකථනː +94-112689345
ෆැක්ස්ː +94-112689341
විද්‍යුත් තැපැල ː dgtsl@trc.gov.lk

## 2. උපලේඛනය 1

අ කොටස - පහසුකම් පාදක කරගත් විදුලි සංදේශ ක්‍රියාකරු (FBO) බලපත්‍ර නිකුත් කිරීම

2.1. නව බලපත්‍ර සඳහා අයැදුම් කිරීමේ මාර්ගෝපදේශ :

2.1.1. 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතේ 17 වැනි වගන්තිය ප්‍රකාරව නිකුත් කරන ලද, පහසුකම් පාදක කර ගත් මෙහෙයුම් සඳහා විදුලි සංදේශ පද්ධතියක් සහ විදුලි සංදේශ සේවා (ව) සැපයීම පිණිස නව බලපත්‍රයක් ඉල්ලුම් කිරීමට උනන්දුවක් දක්වන පාර්ශ්වයන් සඳහා උපලේඛන 1 - අ කොටස මගින් මාර්ගෝපදේශ සහ තොරතුරු සපයයි.

2.1.2. අයැදුම්කරු 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ නිසි ලෙස සංස්ථාපිත සමාගමක් විය යුතුය. අයැදුම් කරන සමාගමේ නම, සංස්ථාගත කළ දිනය සහ ස්ථානය, ව්‍යාපාරය සහ ලියාපදිංචි ලිපිනය, සම්බන්ධ කර ගත හැකි දුරකථන අංකය, ෆැක්ස් අංකය, විද්‍යුත් තැපැල් ලිපිනය සහ අයැදුම්කරුගේ ආයතනයේ සම්බන්ධ කර ගත හැකි තැනැත්තෙකුගේ නම සහ තනතුර සැපයිය යුතුය.

2.1.3. තනි පුද්ගල ව්‍යාපාරයක්, හවුල් ව්‍යාපාරයක් හෝ වෙනත් ඕනෑම පුද්ගලයෙකු , කොමිෂන් සභාව විසින් කලින් කල තීරණය කරනු ලබන පුද්ගලයෙකු හෝ පුද්ගලයන් සමූහයක් බලපත්‍රයක් ලබා ගැනීම සඳහා අයැදුම් කිරීමට නුසුදුස්සන් වනු ඇත.

2.1.4. සෘජු සහ වක්‍ර යන දෙ අංශයම සම්බන්ධයෙන් අවසාන හිමිකාරිත්වය පැහැදිලිව සඳහන් කරමින් හිමිකාරීත්වය හෝ ආශ්‍රිත සමාගම් සමඟ ඇති සබඳතාව මෙන්ම ආයතනික සහ කොටස් හිමි ව්‍යුහය පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු ලබා දිය යුතුය. හිමිකාරිත්වය දරන සමාගම පොදු ආයතනයක් නම්, පොදු ලැයිස්තුගත කිරීම පිළිබඳ විස්තර සැපයිය යුතුය.

2.1.5. සෘජු හෝ වක්‍ර විදේශීය කොටස් හිමිකම උපරිම වශයෙන් 40%කට (සියයට හතළිහකට) සීමා කළ යුතුය. ඉතිරි 60% ශ්‍රී ලාංකික නේවාසික පුරවැසියන් හෝ 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ විධිමත් ලෙස සංස්ථාපිත කර ඇති ශ්‍රී ලාංකීය සමාගම් සතු විය යුතුය. කෙසේ වෙතත්, විශේෂ තත්ත්වයන් යටතේ කොමිෂන් සභාවට මෙම ප්‍රතිශත සමාලෝචනය කළ හැක. විදේශීය ආයතනය හිමිකාරිත්වයේ ප්‍රතිශතයට සෘජුවම සමාන විදේශ මුදල්වල ආයෝජනය කළ යුතු අතර ආයෝජනයේ විදේශීය කොටස සඳහා ශ්‍රී ලංකාවේ කිසිම බැංකුවකින්/මූල්‍ය ආයතනයකින්/ලීසිං සමාගමකින් හෝ වෙනත් ආයතනයකින් බැංකු ණයක් ලබා ගත නොහැක.

2.1.6. එමෙන්ම අධ්‍යක්ෂ මණ්ඩලය සහ තනි කොටස් හිමියන් ඇතුළු ප්‍රධාන කළමනාකරණ කණ්ඩායම පිළිබඳ සවිස්තරාත්මක සංයුතිය සැපයිය යුතුය.

2.1.7. මෙහි 1.2 හි සඳහන් බලපත්‍රය කොමිෂන් සභාවේ නිර්දේශය මත අමාත්‍යවරයා විසින් නිකුත් කරනු ලැබේ. කෙසේ වෙතත්, නම් කර ඇති හේතු මත එවැනි නිර්දේශ ප්‍රතික්ෂේප කිරීමට සහ ඔහුගේ අභිමතය පරිදි බලපත්‍රයක් ලබා දීමට අමාත්‍යවරයාට බලය ඇත.

2.1.8. කෙසේ වෙතත්, විදුලි සංදේශ පද්ධතියක් ක්‍රියාත්මක කිරීම සඳහා බලපත්‍රයක් නිකුත් කිරීම, ඕනෑම වෙළඳ අංශයක කිසියම් සේවාවක් සැපයීම සඳහා අවසර ලබා දීම ශ්‍රී ලංකාවේ එවැනි සේවාවක් සඳහා වන නියාමන අවශ්‍යතාවය මත රඳා පවතින අතර එවැනි අවශ්‍යතාවයක් නොමැති නම් කොමිෂන් සභාවට ඕනෑම අනවශ්‍ය අයදුම්පතක් ක්‍රියාත්මක කිරීමෙන් තොරව ප්‍රතික්ෂේප කළ හැකිය.

2.1.9. ප්‍රතිපත්තිමය සහ/හෝ නියාමන අවශ්‍යතා හේතුවෙන් වෙළඳපල ඉලක්ක කරගත් ක්‍රමවේදය ඔස්සේ බලපත්‍ර/බලපත්‍රය නිකුත් කිරීමට කොමිෂන් සභාව එසේ තීරණය කරන්නේ නම්, සුදුසු ආයතනවලින් අයැදුම්පත් කැඳවීමට ජාතික පුවත්පත්වල ප්‍රසිද්ධ නිවේදනයක් පළ කළ හැකිය. එවැනි අවස්ථාවක, කොමිෂන් සභාව වෙත පෙර ඉදිරිපත් කරන ලද අනවශ්‍ය අයැදුම්පත / අයැදුම්පත් ප්‍රතික්ෂේප කර ඒ අනුව ඒ බව ඔවුන්ට දැනුම් දිය හැකිය.

2.1.10. නව බලපත්‍රයක් ලබා ගැනීම සඳහා අයැදුම් කිරීමට උනන්දුවක් දක්වන ඕනෑම පාර්ශ්වයක් විසින් නිසි පරිදි සම්පූර්ණ කරන ලද S17-1-A අයැදුම්පත ඉදිරිපත් කළ යුතුය. අයැදුම්පත නිසි පරිදි සම්පූර්ණ කර ඇති බවත්, සියලුම විස්තර නිසි පරිදි දක්වා ඇති බවත් කොමිෂන් සභාව විසින් සහතික කරනු ලැබේ. අයැදුම්කරුවන් විසින් අයැදුම්පත සමඟ ඊට අමුණා ඇති පිරික්සුම් ලැයිස්තුව ඉදිරිපත් කළ යුතුය. සම්පූර්ණ කරන ලද අයැදුම්පත අදාළ ලියකියවිලි සහ සැකසුම්

ගාස්තු සමඟ කොමිෂන් සභාව වෙත ලැබුණු විට, කොමිෂන් සභාව විසින් එම අයැදුම්පත අනුමැතිය ලබා ගැනීම සඳහා ආරක්ෂක අමාත්‍යාංශය වෙත යොමු කරනු ඇත. ආරක්ෂක අමාත්‍යාංශය විසින් ආරක්ෂක අනුමැතිය ලබා නොදුනහොත් අයැදුම්පත ප්‍රතික්ෂේප කරනු ලැබේ.

2.1.11. කෙසේ වෙතත්, අයැදුම්කරු විසින් සපයනු ලබන තොරතුරු අයැදුම්පත සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා ප්‍රමාණවත් නොවන බව කොමිෂන් සභාවේ මතය නම්, වැඩිදුර තොරතුරු ඉල්ලා සිටිය හැකි අතර, එවිට අයැදුම්පත සම්බන්ධයෙන් කටයුතු කිරීම ප්‍රමාද විය හැකිය.

2.1.12. එවැනි තත්ත්වයන් තුළ, අයැදුම්පත ඉදිරිපත් කර සති හතරක් ඇතුළත ඉල්ලා සිටින තොරතුරු ලබා දෙන ලෙස කොමිෂන් සභාව අයැදුම්කරුට නියම කරනු ඇත. කොමිෂන් සභාවේ මෙම නියෝගයට අනුකූලවීමට අපොහොසත් වීම අයැදුම්කරු මෙම බලපත්‍ර ක්‍රියාවලියෙන් නුසුදුස්සෙකු වීමට හේතු විය හැක.

2.1.13. බලපත්‍රය ප්‍රදානය කිරීම සඳහා අයැදුම්කරුගේ සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා ඉදිරිපත් කරන ලද ලේඛන සත්‍යාපනය කිරීමෙන් පසුව, උපලේඛන 1/ අ කොටසේ - (2.2) හි විස්තර කර ඇති ඇගයීම් නිර්ණායක අනුව කොමිෂන් සභාව අයැදුම්පත සලකා බලනු ලැබේ. ඇගයුම් නිර්ණායකවල විස්තර කර ඇති සියලුම කරුණු සම්බන්ධයෙන් අයැදුම්කරු සෑම විටම පැහැදිලි සාක්ෂි සැපයිය යුතුය.

2.1.14. ඉදිරිපත් කරන ලද අයැදුම්පත කොමිෂන් සභාව විසින් වරින් වර සලකා බලන අතර, එය සමාලෝචනය කිරීම සඳහා අමතර ලියකියවිලි ඉදිරිපත් කරන ලෙස අයදුම්කරුගෙන් ඉල්ලා සිටිය හැක. කෙසේ වෙතත්, අයදුම්කරු දින 30 ක් ඇතුළත අවශ්‍ය ලියකියවිලි ඉදිරිපත් කිරීමට අපොහොසත් වුවහොත්, අයදුම්කරු එම බලපත්‍ර ක්‍රියාවලිය සම්බන්ධයෙන් සලකා බැලීමට නුසුදුස්සකු වනු ඇත. තවද අයදුම්කරුට තම යෝජනාව පිළිබඳ වැඩිදුර පැහැදිලි කිරීම සඳහා ඉදිරිපත් කිරීමක් (Presentation) කිරීමට සිදුවිය හැකිය.

2.1.15. උපලේඛන 1/ අ කොටසේ (2.2) හි විස්තර කර ඇති ඇගයීම් නිර්ණායක අනුව, ලකුණු 70% ට වඩා වැඩි නම්, අයදුම්කරු බලපත්‍ර ප්‍රදානය සඳහා සුදුසුකම් ලබයි.

2.1.16. බලපත්‍ර ප්‍රදානය කිරීම සඳහා අමාත්‍යවරයාට නිර්දේශ කිරීමට පෙර, බලපත්‍ර නිකුත් කිරීම සම්බන්ධයෙන් ප්‍රකාශ කළ දින සිට දින තිහක් ඇතුළත, කොමිෂන් සභාව විසින් මහජන අදහස් විමසීම සඳහා අයැදුම්කරු පිළිබඳ තොරතුරු ජාතික පුවත්පත් වල ප්‍රකාශයට පත් කරනු ඇත. යෝජිත බලපත්‍රයේ කෙටුම්පතක් මහජනතාවගේ පරිශීලනය සඳහා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවියෙන් සම්පූර්ණයෙන් බාගත කර ගත හැකිය.

2.1.17. මහජනතාව වෙත කෙරෙන නිවේදනයට ප්‍රතිචාර වශයෙන් නිසි පරිදි ඉදිරිපත් කරන ඕනෑම සැලකිරීමක් හෝ විරෝධතාවයක් කොමිෂන් සභාව විසින් සලකා බලනු ඇත. අයදුම්පත සම්බන්ධයෙන් විරෝධතාවයක් හෝ සැලකිරීමක් ඉදිරිපත් කළේ නම්, පැමිණිල්ලේ වර්ගය අනුව කොමිෂන් සභාවට විමර්ශනයක් ආරම්භ කළ හැකිය. විමර්ශනය අතරතුර සාක්ෂි ඉදිරිපත් කිරීමට අයදුම්කරුට සිදු විය හැකිය. කොමිෂන් සභාව වලංගු හේතු අනාවරණය කර ගන්නේ නම්, විමර්ශනයේ අවසානයක් ලෙස, බලපත්‍රය ලබා නොදීම සම්බන්ධයෙන් කොමිෂන් සභාවේ තීරණය ලිඛිතව අයදුම්කරුට දන්වනු ලැබේ.

2.1.18. මහජනතාව විසින් ඉදිරිපත් කරන ලද විරෝධතා සාධාරණීකරණය කිරීම සඳහා කොමිෂන් සභාව විසින් විමර්ශනය අවසානයේ වලංගු හේතු අනාවරණය කර නොගන්නේ නම්, දින තිහක් ඇතුළත අවශ්‍ය බලපත්‍ර ගාස්තුව ගෙවන ලෙස අයැදුම්කරුට උපදෙස් දෙනු ලැබේ. නියමිත කාලසීමාව තුළ බලපත්‍ර ගාස්තුව ලැබුණු පසු, බලපත්‍රය ලබාදීමට කොමිෂන් සභාව විෂය භාර අමාත්‍යවරයාට නිර්දේශ කරනු ලැබේ. කොමිෂන් සභාව බලපත්‍රය ප්‍රදානය කිරීම එහි නිල වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කරනු ඇත. කෙසේ වෙතත්, අයදුම්කරු නියමිත කාල සීමාව තුළ බලපත්‍ර ගාස්තුව ගෙවීමට අපොහොසත් වුවහොත්, අයදුම්කරු නුසුදුස්සකු වීමෙන් බලපත්‍රය ලබා නොදෙන අතර බලපත්‍ර ක්‍රියාවලිය අවසන් කරනු ලැබේ.

2.1.19. ගුවන්විදුලි සංඛ්‍යාත වර්ණාවලිය, ප්‍රවේශ අයිතිය, අංකනය යනාදී සීමිත සම්පත් පැවරීම, සම්පත් ලබා ගත හැකි බව මත දැඩි ලෙස රඳා පවතින අතර බලපත්‍රය නිකුත් කිරීම මඟින් එම සම්පත් පැවරීමට ක්‍රියාකරු සමාගමට කිසිදු අයිතියක් නොලැබේ. කෙසේ වෙතත්, සෑම විටම කොමිෂන් සභාවට, එවැනි සම්පත් වෛෂයිකව, විනිවිදභාවයෙන් සහ විෂමතාවයකින් තොරව පැවරිය හැකිය. සීමිත සම්පත් සඳහා එවැනි ඉල්ලීමක් කළ යුත්තේ වෙන වෙනම මිස බලපත්‍රයේ කොටසක් ලෙස නොවේ.

2.1.20. බලපත්‍ර ක්‍රියාවලිය අතරතුර සහ අවසානයේ කොමිෂන් සභාව විසින් සමාගම පිළිබඳ තොරතුරු ප්‍රකාශයට පත් කරනු ලැබේ. අයදුම්කරුවන් විසින් ලියකියවිලි වල ද පැහැදිලිව සඳහන් කරමින් රහස්‍ය තොරතුරු වෙනම කවරයක ඉදිරිපත්

කළ යුතුය. සියලුම වාණිජමය වශයෙන් වැදගත් තොරතුරු දැඩි ලෙස රහසිගතව පවතින බවට අයදුම්කරුවන්ට සහතික විය හැක.

2.1.21. විදුලි සංදේශ පද්ධතියේ එවැනි මෙහෙයුමක් ආරම්භ කිරීමට පෙර, බලපත්‍රලාභියා විසින් විදුලි සංදේශ සේවාව ක්‍රියාත්මක කිරීම සහ සැපයීම සඳහා අවශ්‍ය අනෙකුත් සියලුම බලපත්‍ර/අනුමැතීන් ලබා ගැනීම තරයේ අවශ්‍ය වේ.

2.1.22. අදාළ විස්තර සහිතව නිසි පරිදි සම්පූර්ණ කරන ලද S17-1-A අයදුම්පත ඉදිරිපත් කිරීමෙන් පසු, අයදුම්කරු විසින් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවට ගෙවිය යුතු රුපියල් 300,000 බලපත්‍ර පටිපාටි ගාස්තුව ගෙවීම අවශ්‍ය කෙරේ. බලපත්‍ර ක්‍රියාවලියේදී අයදුම්කරුවෙකුගේ සාර්ථකභාවය , අසාර්ථකභාවය මත මෙම ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ. අදාළ බලපත්‍ර පටිපාටි ගාස්තුව නොගෙවන්නේ නම් කිසිම අයදුම්පතක් ඇගයීමට ලක් නොකෙරේ.

2.1.23. ප්‍රකාශය අත්සන් කරන සමාගමේ බලයලත් නියෝජිතයා විසින් අයදුම්පතේ සහ ව්‍යාපෘති ශක්‍යතා වාර්තාවේ සෑම පිටුවක්ම සිය කෙටි අත්සන යොදා ආරම්භ කළ යුතුය. එමෙන්ම අයදුම්පත සහ ව්‍යාපෘති ශක්‍යතා වාර්තාව විද්‍යුත් ආකෘතියෙන් ඉදිරිපත් කිරීම ද නිර්දේශ කෙරේ.

2.1.24. සම්පූර්ණ කරන ලද අයදුම්පත සහ ව්‍යාපෘති ශක්‍යතා වාර්තාවේ පිටපත් තුනක් බලපත්‍ර පටිපාටි ගාස්තුව ගෙවීමේ ලදුපත සමග 'විදුලි සංදේශ පද්ධති බලපත්‍රය සඳහා වන අයදුම්පත' යනුවෙන් පැහැදිලිව සඳහන් කර ඇති ලියුම් කවරයක බහා පහත සඳහන් ලිපිනයට ලැබෙන සේ ඉදිරිපත් කළ යුතුයඃ

අධ්‍යක්ෂ ජනරාල්,
ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව,
අංක 276, ඇල්විටිගල මාවත, කොළඹ 08.
දුරකථනඃ +94-112689345
ෆැක්ස්ඃ +94-112689341
විද්‍යුත් තැපෑලඃ dgtsl@trc.gov.lk

2.2. නව බලපත්‍රයක් ලබා ගැනීමේ අයදුම්පත් ඇගයීමේ නිර්ණායක (පහසුකම් පාදක කරගත්)

2.2.1. විදුලි සංදේශ පද්ධතිය නිසි ලෙස ක්‍රියාත්මක කිරීම සහ විදුලි සංදේශ සේවා සැපයීම සඳහා තාක්ෂණික, මූල්‍ය, විකුණුම් සහ අලෙවිකරණය, පාරිභෝගික සේවා සහ ආරක්ෂාව සහ ආයතනික සහ කළමනාකරණ අංශ සම්බන්ධයෙන් වන ශක්‍යතාවය මත පදනම්ව අයදුම්පත් ඇගයීම සිදු කෙරේ.මෙම ඇගයීම S17-1-A අයදුම්පත සහිතව ඉදිරිපත් කරන ලද ශක්‍යතා වාර්තාව මත පදනම් වේ.

2.2.2. බලපත්‍ර ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමට අයදුම්කරු පහත එක් එක් අංශයේ/කොටසේ සඳහන් කර ඇති අවම ලකුණු ප්‍රමාණය රැස් කර ගත යුතු අතර මුළු ලකුණු ප්‍රමාණය 70%කට වඩා වැඩි විය යුතුය.

| අංකය | ඇගයීමේ නිර්ණායක | ලකුණු | අවම අවශ්‍යතාවය |
|---|---|---|---|
| 1 | තාක්ෂණික<br>1. ජාල සැලැස්ම<br>2. ධාරිතාවය සහ වේගය<br>3. ප්‍රමිතීන්<br>4. බිල්කරණ පද්ධතිය<br>5. සීමිත සම්පත් භාවිතය<br>6. බෙදා ගැනීම / කුලියට ගැනීම<br>7. ඉදිරි වසර 5 සඳහා ජාල ව්‍යාප්ති සැලසුම්<br>8. පාරිභෝගික පරිශ්‍ර උපකරණ (CPE) ප්‍රමිතීන් | 30 | 20 |

| | | | |
|---|---|---|---|
| 2 | මූල්‍යය<br>1. ප්‍රාග්ධන සහ අරමුදල් මූලාශ්‍ර<br>2. මුදල් ප්‍රවාහය/ ආයෝජන සැලැස්ම<br>3. වට්ටම් සහිත අවම ආපසු ගෙවීම්<br>4. අවදානම විශ්ලේෂණය | 30 | 20 |
| 3 | විකුණුම් සහ අලෙවිකරණය<br>1. අපේක්ෂිත ග්‍රාහක වර්ධනය<br>2. විකුණුම් සැලැස්ම<br>3. වෙළඳ ප්‍රචාරණ සැලැස්ම<br>4. බෙදාහරින්නාගේ ජාලය | 15 | 10 |
| 4 | පාරිභෝගික සේවා සහ ආරක්ෂණය<br>1. පාරිභෝගික පරිශ්‍ර උපකරණ (CPE) මාදිලිය<br>2 පාරිභෝගික පරිශ්‍ර උපකරණ (CPE) නඩත්තු කිරීම<br>3. සේවා තත්ත්ව ගිවිසුම<br>4. බංකොලොත්භාවයට එරෙහිව ආරක්ෂණය (රක්ෂණ යනාදිය)<br>5. සේවා තත්ත්වය පිළිබඳ සහතිකය | 15 | 12 |
| 5 | ආයතනිකමය සහ කළමනාකරණමය<br>1. ආයතනික ව්‍යුහය<br>2. නව රැකියා<br>3. පෙර පළපුරුද්ද<br>4. උපාය මාර්ගික සැපයුම්කරුවන්<br>5. කාර්ය මණ්ඩලය සහ පුහුණුව | 10 | 8 |

2.3. අයැදුම්පත

● ආකෘති පත්‍රය S17-1-A

**පැහැදිලි කිරීමේ සටහන් (ආකෘති පත්‍රය S17-1-A)**

- මෙම අයැදුම්පත සම්පූර්ණ කිරීමට පෙර, අයැදුම්කරුවන් විසින් බලපත්‍ර මාර්ගෝපදේශ සහ පටිපාටිවල උපලේඛන 01/අ කොටස සම්පූර්ණයෙන්ම කියවිය යුතුය.

- සියලුම අයදුම්කරුවන් අයැදුම්පත (S17-1-A) සම්පූර්ණ කළ යුතුය.

- අයැදුම්පත සම්පූර්ණයෙන්ම මුද්‍රිතව හෝ ඉංග්‍රීසි භාෂාවෙන් නම් ඉංග්‍රීසි කැපිටල් අකුරින් සම්පූර්ණ කළ යුතුය. ඉල්ලා සිටින තොරතුරු යෝජිත විදුලි සංදේශ පද්ධතියට අදාළ නොවේ නම්, කරුණාකර අදාළ නොවේ යන්න සඳහන් කරන්න.

- ඉල්ලුම් කරන ලද තොරතුරු සැපයීම සඳහා ලබා දී ඇති ඉඩකඩ ප්‍රමාණවත් නොවේ නම් අයදුම්කරුවන් විසින් අමතර පිටු ඇමිණිය යුතුය. අමතර පිටුවල තොරතුරු පැහැදිලිව ඉදිරිපත් කළ යුතු අතර මෙම ආකෘති පත්‍රයට අනුකූලව අංකගත කළ යුතුය. අමුණා ඇති පිටු A4 ප්‍රමාණයේ කඩදාසි මත මුද්‍රිත විය යුතුය.
- අයදුම්කරුවන් විසින් අයැදුම්පත්‍රයේ යම් නිවැරදි කිරීමක් හෝ වෙනස් කිරීමක් සිදුකිරීමේ දී කෙටි අත්සන සහ දිනය යෙදිය යුතුය.
- අයදුම්කරුවන් විසින් මාර්ගෝපදේශයේ දක්වා ඇති පෝරමවල ඇමුණුම් සහ ව්‍යාපෘති ශක්‍යතා වාර්තාව ඇතුළුව අයැදුම්පත

පිටපත් 3ක් සහිතව පහත සඳහන් ලිපිනයට ලැබෙන සේ ඉදිරිපත් කළ යුතුය.

අධ්‍යක්ෂ ජනරාල් ,
ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව,
අංක 276, ඇල්විටිගල මාවත , කොළඹ 08.
දුරකථනː +94-112689345
ෆැක්ස්ː +94-112689341
විද්‍යුත් තැපැල ː dgtsl@trc.gov.lk

පෝරමය S17-1-A

**1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ (සංශෝධිත) පනතේ 17 වන වගන්තිය යටතේ විදුලි සංදේශ පද්ධති බලපත්‍රය (පහසුකම් පාදක කරගත්) නිකුත් කිරීමේ අයැදුම්පත**

1. අයදුම්කරුගේ විස්තරː සමාගමේ බලයලත් නියෝජිතයා (අයදුම්කරු) විසින් පහත තොරතුරු සැපයිය යුතුය ː

1.1. සම්පූර්ණ නමː
1.2. උපන්දිනය ː
1.3. ජාතික හැඳුනුම්පත් අංකය/විදේශ ගමන් බලපත්‍ර අංකයː
1.4. පුරවැසිභාවය ː
1.5. ලිපිනය (ස්ථිර)ː පදිංචිː
1.6. දුරකථන අංකය ː (ස්ථාවර)ː ජංගමː
1.7. ෆැක්ස් අංකයː
1.8. විද්‍යුත් තැපැල් ලිපිනයː

කරුණාකර පරීක්ෂා කර කොටුවේ හරි සලකුණ ( ✓ ) යොදන්න
☐ අනුමැතිය ලබාදීමේ තීරණය

2. සමාගමේ විස්තර ː

2.1. සමාගමේ ලියාපදිංචි නම ː
2.2. සමාගම ලියාපදිංචි කිරීමේ අංකය ː
2.3. සංස්ථාගත කිරීමේ දිනය ː
2.4. ලියාපදිංචි ලිපිනය ː
2.5. සමාගමේ නිල දුරකථන අංකය ː
2.6. ෆැක්ස් අංකය ː
2.7. විද්‍යුත් තැපැල් ලිපිනය ː
2.8. සමාගමේ නිල වෙබ් අඩවිය ː
2.9. මව් හෝ ආශ්‍රිත සමාගම් සමග ඇති සබඳතාව ඇතුළුව හිමිකාරිත්වය පැහැදිලිව සඳහන් කරමින් ආයතනික සහ කොටස් ව්‍යුහය පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු ː
2.10. පොදු සමාගමක් නම් (මව් සමාගම ඇතුළුව) පොදු ලැයිස්තුගත කිරීමේ විස්තරː
2.11. ව්‍යාපාර ගිණුම පවත්වාගෙන යන බැංකුවේ නම සහ සම්බන්ධතා තොරතුරුː
2.12. කොටස් ප්‍රාග්ධනය (කොටස් කාණ්ඩය, එක් එක් කාණ්ඩයේ කොටස් ගණන සහ වටිනාකම)
2.13. කොළඹ කොටස් වෙළඳපොලේ ලැයිස්තුගත කර ඇති නම් කොටස් කාණ්ඩයේ විස්තර සපයන්නː
2.14. හවුල්කාරිත්වයක දී, විස්තර සපයන්න ː

2.15. පුද්ගල කොටස් හිමිකම තිබේ නම් ඒ පිළිබඳ විස්තර හා අධ්‍යක්ෂවරුන්ගේ සුදුසුකම් සහ වෘත්තීමය ඉතිහාසය සමග අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ ප්‍රධාන කළමනාකාරීත්ව කණ්ඩායමේ සවිස්තරාත්මක සංයුතිය (සුදුසුකම් පිළිබඳ කෙටි විස්තරයක් ඇමිණිය යුතුය) ඃ

2.16. වෙනත් ආයතන සහ උපදේශකයින් අතර ගිවිසුම්ගත ක්‍රියාකාරකම් ලැයිස්තුවඃ

2.17. සමාගමේ වෘත්තීය උපදේශකයින්ගේ ලැයිස්තුවඃ (තාක්ෂණික, නීතිමය, මූල්‍ය, විගණන)

2.18. දැනට සමාගම හෝ අනුබද්ධිත ආයතනය විසින් දරන විදුලි සංදේශ පද්ධති බලපත්‍ර (දේශීය හෝ විදේශීය) පිළිබඳ විස්තරඃ

2.19. බලයලත් ආයතනයක් විසින් අයදුම්පත ප්‍රතික්ෂේප කිරීම හෝ එවැනි බලපත්‍රයක් ප්‍රත්‍යාදිෂ්ට කිරීමේ විස්තරඃ

2.20. කරුණාකර පහත සඳහන් ලියකියවිලි අමුණන්න ඃ
සාංගමික ව්‍යවස්ථාවලිය, සංස්ථාගත කිරීමේ සහතිකය, නව වාර්ෂික ප්‍රතිලාභ ඃ 15 වැනි පෝරමය සහ ඉහත විස්තරවලට අදාළ අනෙකුත් සාක්ෂි ලේඛන සපයන්න.

3. කොටස් හිමියන්ගේ විස්තර ඃ

සියලුම කොටස් හිමියන්ගේ විස්තර පහත ආකෘතිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතුය. (එක් එක් කොටස් හිමියා සඳහා වෙනවෙනම විස්තර සැපයිය යුතුය)

3.1. සම්පූර්ණ නමඃ
3.2. උපන්දිනය ඃ
3.3. ජාතික හැඳුනුම්පත් අංකය/විදේශ ගමන් බලපත්‍ර අංකයඃ
3.4. පුරවැසිභාවය ඃ
3.5. ලිපිනය (ස්ථිර)ඃ පදිංචිඃ
3.6. දුරකථන අංකයඃ (ස්ථාවර) ඃ ජංගමඃ
3.7. ෆැක්ස් අංකය ඃ
3.8. විද්‍යුත් තැපැල් ලිපිනය ඃ
3.9. කොටස් ප්‍රතිශතයඃ
3.10. කොටස් නිකුත් කළ දිනය ඃ (කොටස් සහතික අමුණා තිබිය යුතුය)
3.11. පෙර හිමි දැනට ඇවර කර ඇති සමාගම්වල විස්තර ඃ
3.12. ඕනෑම රටක බලයලත් ආයතනයක් විසින් ප්‍රතික්ෂේප කරන ලද පෙර අයිති ඕනෑම සමාගමක් විසින් ඉදිරිපත් කරන ලද ඕනෑම විදුලි සංදේශ බලපත්‍රයක් ලබාගැනීමේ අයදුම්පත් සම්බන්ධ විස්තරඃ
3.13. ඕනෑම රටක බලයලත් ආයතනයක් විසින් ප්‍රත්‍යාදිෂ්ට කරන ලද ඕනෑම සමාගමක් සතු වූ ඕනෑම විදුලි සංදේශ බලපත්‍රයක් පිළිබඳ විස්තරඃ
3.14. වෙනත් ව්‍යාපාරික අවශ්‍යතා ඃ

4. ව්‍යාපෘති ශක්‍යතා වාර්තාව ඃ

මෙම අයදුම්පත සමග සවිස්තරාත්මක ව්‍යාපෘති ශක්‍යතා වාර්තාවක් ඉදිරිපත් කළ යුතුය. විදුලි සංදේශ පද්ධතිය පිළිගත හැකි ප්‍රමිතීන්ට අනුව ස්ථාපිත කිරීම, ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම සහ අදාළ බලපත්‍රය මගින් පිළිගත හැකි ගුණාත්මක සේවාවක් සැපයීම සඳහා අයදුම්කරුගේ සමාගමේ තාක්ෂණික, මූල්‍ය, විකුණුම් සහ අලෙවිකරණය, පාරිභෝගික සේවා සහ ආරක්ෂණය, ආයතනික සහ කළමනාකරණ හැකියාවන් සහ කුසලතා වාර්තාවට ඇතුළත් කළ යුතුය. බලපත්‍ර මාර්ගෝපදේශයේ 2.4 වගන්තියේ දක්වා ඇති උපදෙස් අනුව ශක්‍යතා වාර්තාව සකස් කළ යුතුය. අයදුම්පත්‍රය ඇගයීමේදී ව්‍යාපෘති ශක්‍යතා වාර්තාවේ දක්වා ඇති තොරතුරු සැළකිල්ලට ගනු ලැබේ.

5. ප්‍රකාශය ෴

. ....................................................... වන මම මෙම අයදුම්පත්‍රයේ සපයා ඇති තොරතුරු සහ ශක්‍යතා වාර්තාවේ දක්වා ඇති සියළුම කරුණු සත්‍යය හා නිවැරදි බව මෙයින් සහතික කරමි. බලපත්‍රය ලබා දීමෙන් පසු, 1996 අංක 27 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතින් සංශෝධිත 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතේ විධිවිධාන, ඒ යටතේ කොමිෂන් සභාව විසින් සාදනු ලබන සියලුම නීති , රීති, තීරණ සහ බලපත්‍රයේ සියලුම ප්‍රතිපාදන, මෙන්ම නියමයන් සහ කොන්දේසි වලට යටත් වන බව මම මෙයින් ප්‍රතිඥා දෙමි. බලපත්‍රය අවලංගු කිරීමේ කොටසේ දක්වා ඇති ඕනෑම කොන්දේසියක් උල්ලංඝනය කරමින් වැරදි තොරතුරු මත පදනම්ව බලපත්‍රයක් නිකුත් කර ඇති බව පෙනී ගියහොත් බලපත්‍රය අවලංගු කිරීමට මගේ විරුද්ධත්වයක් නොමැත.

සමාගමේ බලයලත් නියෝජිතයාගේ අත්සනඃ ..........................
දිනය ෴ ..........................

අයදුම්පත් පරීක්ෂා කිරීමේ ලැයිස්තුව

(අ) අයදුම්කිරීමේ අවශ්‍යතාවයන් ෴

1. අයැදුම්පත් ක්‍රියාවලි ගාස්තුව රු.300,000 ඇතුළත් ද? **ඔව්/ නැත**
2. අයදුම්පතේ 1, 2, 3, 4, සහ 5 වගන්ති සුදුසු පරිදි සම්පූර්ණ කර තිබේද? **ඔව්/ නැත**
3. අයදුම්පතේ 4 වැනි අයිතමයේ විස්තර කර ඇති පරිදි ව්‍යාපෘති ශක්‍යතා වාර්තාව ඉදිරිපත් කර තිබේද? **ඔව් /නැත**
4. 5 වන වගන්තිය යටතේ ඇති ප්‍රකාශනය සමාගමේ බලයලත් නියෝජිතයෙකු විසින් අත්සන් කර තිබේද? **ඔව්/ නැත**
5. ඇමුණුම් සහ ව්‍යාපෘති ශක්‍යතා වාර්තාව ඇතුළුව අයදුම්පතේ පිටපත් 3ක් ඉදිරිපත් කර තිබේද? **ඔව්/ නැත**
6. ජාතික හැඳුනුම්පතේ පිටපතක්/සමාගමේ බලයලත් නියෝජිතයාගේ විදේශ ගමන් බලපත්‍රයේ අදාළ පිටු තිබේද - **ඔව්/ නැත**
7. අයැදුම්පත ඉදිරිපත් කිරීම සඳහා බලයලත් නියෝජිතයා පත් කිරීම සඳහා වූ කමිටු යෝජනාවේ පිටපතක් තිබේද ෴ **ඔව්/ නැත**
8. සමාගමේ ලියකියවිලි ඉදිරිපත් කිරීමඃ **(ඔව්/නැත)**
   සාංගමික ව්‍යවස්ථාවලිය, සංස්ථාගත කිරීමේ සහතිකය, නව වාර්ෂික ප්‍රතිලාභඃ ආකෘතිපත්‍රය 15 සහ ඉදිරිපත් කරන ලද අදාළ ලියකියවිලි
9. ප්‍රධාන විධායක නිලධාරී, අධ්‍යක්ෂවරුන් සහ කොටස් හිමියන්ගේ ජාතික හැඳුනුම්පත්වල පිටපත්/ ගමන් බලපත්‍රවල අදාළ පිටු, ජීව දත්ත සහ ඔවුන්ගේ පැවැත්මට අදාළ වෙනත් ලියකියවිලි ෴ **ඔව්/ නැත**
10. කොටස් වෙළඳපල සහතික සහ අනෙකුත් අදාළ ලේඛනවල පිටපත් ෴ **ඔව් /නැත**

2.4. ව්‍යාපෘති ශක්‍යතා වාර්තාව සකස්කිරීමේ මාර්ගෝපදේශ

S17-1-A අයදුම්පත්‍රයේ 4 වැනි වගන්තිය යටතේ අවශ්‍ය තාක්ෂණික ශක්‍යතා වාර්තාව සැකසීම සඳහා අදාළ වන මාර්ගෝපදේශ මෙම කොටසට ඇතුළත් වේ.

මෙම වාර්තාව ඉල්ලා සිටින විදුලි සංදේශ සේවාව ක්‍රියාත්මක කිරීමට, ක්‍රියා කරවීමට සහ සැපයීමට යෝජිත කළමනාකරණ ව්‍යුහය සහ ව්‍යාපෘතියේ තාක්ෂණික, මූල්‍ය, විකුණුම් අලෙවිකරණය, පාරිභෝගික සේවා සහ ආරක්ෂාව පිළිබඳ වෙනම සවිස්තරාත්මක පරිච්ඡේදවලින් සමන්විත විය යුතුය.

2.4.1. තාක්ෂණික යෝජනාව

2.4.1.1. විදුලි සංදේශ පද්ධති ජාල විස්තර

අ). වෙන් වූ ජාල උපාංග සම්බන්ධ කරන පොදු සන්නිවේදන ජාල- Core/Backbone (ස්විච් ස්ථාන ඇතුළුව), core network හෝ backbone network අතර අන්තර් සම්බන්ධතාවයෙන් සමන්විත ජාල කොටස - Backhaul (මාර්ගගත කිරීම), ප්‍රවේශය/ ප්‍රකාශ තන්තු ආරක්ෂණ පද්ධතිය - OLP, ජාලයක් හෝ ජාල කිහිපයක් පිහිටීමේ ලක්ෂ්‍යය- all Points of Presence, අන්තර්සම්බන්ධතා ලක්ෂ්‍යය සහ විදුලි සංදේශ පද්ධති නිර්වචනය යටතට ගැනෙන වෙනත් ඕනෑම සංරචකයක් ඇතුළත් වන සවිස්තරාත්මක ජාල රූප සටහන.

(ආ). අයදුම්කරු විසින් දුරකථන අංකය වෙනස් නොවී ජාල අතර මාරුවීමේ අවශ්‍යතා සම්බන්ධයෙන් දේශීය හා ජාත්‍යන්තර ප්‍රවේශ ඇතුළු සෙසු සම්බන්ධ කළ හැකි ක්‍රියාකරුවන් සහ අන්තර්සම්බන්ධීය කරුණු, ධාරිතාවය, සංඥා කිරීම, සම්ප්‍රේෂණය, සමමුහුර්තකරණය, අන්තර් ක්‍රියාකාරීත්වය, විවිධ සැලසුම් හෝ ඕනෑම තාක්ෂණික අංශයක් සම්බන්ධ විස්තර සහ වැඩපිළිවෙල සැපයිය යුතුය.

(ඇ). එක් එක් කොටසෙහි ජාල රූප සටහන සමඟ ලබා ගත හැකි වේගය සහ ධාරිතාවය සඳහන් කර අදාළ සම්ප්‍රේෂණ මාධ්‍ය සමඟ එක් එක් කොටසෙහි භාවිතා වන සියලුම තාක්ෂණයන් පැහැදිලි කිරීම් සහිතව සඳහන් කළ යුතුය. අදාළ කොටස්වල සැබෑ පුළුල් පරාසය සඳහා උපරිම විභව ඉල්ලුම් අනුපාතය පිළිබඳ විස්තර සපයන්න.

(ඈ). ස්ථාපන ප්‍රමිතීන් ඇතුළුව ජාලයේ එක් එක් කොටසට යොදා ගන්නා ජාල තාක්ෂණික ප්‍රමිති විස්තර කරන්න.

(ඉ). යෝජිත බිල්පත් ක්‍රමය, අනුගමනය ලද බිල්පත් ප්‍රමිතීන් සහ බිල්පත් ක්‍රමයේ නිරවද්‍යතාවය සහතික කිරීමේ පියවර.

(ඊ). ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලියේ කාර්යක්ෂමතාව සහ වෙනත් විකල්ප පිළිබඳ විශ්ලේෂණය සහ අවශ්‍ය සියලුම ජාල කොටස් පිළිබඳ නිසි පැහැදිලි කිරීමක් සහිතව ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලියේ අවශ්‍යතාවය විස්තරාත්මකව සපයන්න. කෙසේ වෙතත්, ගුවන්විදුලි සංඛ්‍යාත වර්ණාවලිය මෙම බලපත්‍රයේ කොටසක් නොවන අතර, බලපත්‍රය ප්‍රදානය කිරීමෙන් පසු ගුවන් විදුලි සංඛ්‍යාත වර්ණාවලිය ලබා ගැනීම සඳහා වෙනම ඉල්ලීමක් කළ යුතු අතර එලෙස ලබා දිය හැකි බව අනුව කොමිෂන් සභාව විසින් එම වර්ණාවලිය පැවරිය හැක.

(උ). අංකනය සහ ප්‍රවේශ අයිතිය යනාදී වෙනත් සීමිත සම්පත්වල අවශ්‍යතාවය විස්තරාත්මකව සපයන්න.

(ඌ). සේවා සැපයීමේදී තෙවන පාර්ශවයන්ගෙන් බදු දීමට/කුලියට දීමට යෝජිත යටිතල පහසුකම්.

(එ). තෙවන පාර්ශවයකට බද්දට / කුලියට දිය යුතු සියලුම යටිතල පහසුකම්.

(ඒ). ඉදිරි වසර පහ සඳහා භූගෝලීය ජාල ආවරණය සහ වාර්ෂික ව්‍යාප්ති සැලැස්ම පිළිබඳ සවිස්තරාත්මක සිතියම.

(ඔ). 2.4.1.1 හි විස්තර කර ඇති ජාලය සමඟ භාවිතා කරන සියලුම පර්යන්ත උපකරණවල (පාරිභෝගික පරිශ්‍ර උපකරණ) තාක්ෂණික පිරිවිතර ලබා දිය යුතුය. තවද, මෙහෙයුම් විස්තර, පවතින අතුරුමුහුණත් (යෙදුමක හෝ පද්ධතියක විවිධ සංරචක අතර සන්නිවේදන ලක්ෂ්‍යය) සහ ශක්‍යතාවයන් විස්තර කළ යුතුය. නිෂ්පාදන පිරිවැය සහ පාරිභෝගිකයා සඳහා මිල ගනන් ද සඳහන් කළ යුතුය. එමෙන්ම එවැනි පාරිභෝගික පරිශ්‍ර උපකරණ දේශීයව නිෂ්පාදනය කිරීමේ හැකියාව ද දැක්විය යුතුය.
පර්යන්ත උපකරණ හැර වෙනත් ඕනෑම විදුලි සංදේශ උපකරණයක් නිසි සාධාරණීකරණයක් සහිතව පද්ධතියට සම්බන්ධ කළ යුතුය.

ඉහත කරුණු වලට අමතරව, පහත විස්තර ලබා දිය යුතුය,

2.4.1.2. ජාල කළමනාකරණ විස්තර

(අ). සංඥා කිරීම, මාර්ගගත කිරීම (විවිධත්වය), සමමුහුර්තකරණය, අන්තර් ක්‍රියාකාරීත්වය සහ අනෙකුත් ජාල මෙහෙයුම් අවශ්‍යතා පිළිබඳ සැලසුම් විස්තරාත්මකව සපයන්න.
(ආ). ජාල කළමනාකරණය පිළිබඳ විස්තර සහ සමස්ත ජාල කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සඳහා අනුගමනය කළ යුතු ප්‍රතිපත්ති.
(ඇ). මෙහෙයුම් ආරම්භ කිරීමට අපේක්ෂිත දිනය, ක්‍රියාත්මක කිරීමේ කාලසටහන සහ වර්ධන සැලැස්ම.

2.4.1.3. යෝජිත සේවා පිළිබඳ විස්තරය

(අ). යෝජිත එක් එක් සේවා/වෙළඳපොල කොටසේ සවිස්තරාත්මක විස්තරයඃ

(ආ). දැනටමත් පවතින ක්‍රියාත්මක වන සේවාවන්වල හරස් නම්‍යතා විශ්ලේෂණය සහ අපේක්ෂිත කර්මාන්ත බලපෑම්ඃ

(ඇ). ගිණුම් වෙන් කිරීමේ ක්‍රමවේද ෑ

(ඈ). සේවා ලබා ගැනීමේ හැකියාව, ප්‍රවේශ්‍යතාව, රඳවා ගැනීමේ හැකියාව සහ අඛණ්ඩතාව සම්බන්ධයෙන් සේවා තත්ත්ව පරාමිතීන්, සහ වෙනත් ඕනෑම ජාත්‍යන්තර මිණුම් ලකුණක්.

(ඉ). පාරිභෝගිකයන් සඳහා යෝජිත සේවා මට්ටමේ ගිවිසුම (SLA)

(ඊ). නිශ්චිත වෙළඳපල කොටස් විස්තර සහිත ඉලක්කගත පාරිභෝගික පදනම

(උ). විශ්වීය සේවා වගකීම් සහ හදිසි සේවා සැපයීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග

(ඌ). මහජනතාවට ලබා දෙන නාමාවලි තොරතුරු සේවා පිළිබඳ විස්තර (සුදුසු අවස්ථාවලදී).

**2.4.1.4. පාරිසරික ප්‍රතිපත්තිය**

අයදුම්කරු විසින් සලකා බලනු ලබන පාරිසරික ප්‍රතිපත්ති සහ සැලැස්ම ඉදිරිපත් කළ යුතුය ෑ

(අ). සාමාන්‍ය මෙහෙයුම් වලදී අපද්‍රව්‍ය නිෂ්පාදන දූෂකයන් අවම කිරීම.

(ආ). අනෙකුත් විදුලි සංදේශ පද්ධතිවලට බලපාන ගුවන් විදුලි සංඛ්‍යාත විකිරණ සහ විද්‍යුත් චුම්භක අනුකූලතා (EMC) බලපෑම් අවම කිරීම.

(ඇ). අනතුරුදායක අතිරික්ත ද්‍රව්‍ය නිසි ලෙස බැහැර කිරීම.

(ඈ). ප්‍රතිචක්‍රීයකරණය කළ හැකි ද්‍රව්‍ය උපරිම වශයෙන් භාවිත කිරීම.

(ඉ). ස්වභාවික සුන්දරත්වය ආරක්ෂා කිරීම

(ඊ). බලශක්ති කාර්යක්ෂම උපකරණ භාවිත කිරීම.

(උ). ස්වභාවික පරිසරය සුරැකීම සඳහා වන වෙනත් පියවර ගැනීම.

**2.4.2. මූල්‍යය යෝජනාව**

*2.4.2.1. යෝජිත ප්‍රාග්ධන සහ අරමුදල් සැලසුම්*

පිළිගත හැකි මූල්‍ය ආයතනයකින් ලබාගත් නිසි තහවුරු කිරීමේ ලියකියවිලි සහිතව පහත විස්තර සැපයිය යුතුය.

(අ). මෙහෙයුම සඳහා යෝජිත ප්‍රාග්ධන සහ අරමුදල් සැලසුම් පිළිබඳ විස්තර, ඇතුලත්ව:

(ආ). අයිතිකරුවන්ගේ කොටස් සහ වගකීම් ඇතුලත් කරමින් එහි යෝජිත ප්‍රාග්ධන ව්‍යුහය පිළිබඳ සවිස්තරාත්මක විස්තරයක් සැපයීම. ආරම්භක ණය සම කොටස් අනුපාතය 2.0 ට වඩා අඩුවෙන් පවත්වා ගත යුතුය.

(ඇ). අරමුදල් මූලාශ්‍ර සහ එක් එක් මූලාශ්‍රවලින් ලැබෙන ප්‍රමාණය (හිමිකරුවන්ගේ සම කොටස්, ණය, සමාගම් කොටස් විකිණීම, ණයකර යනාදිය).

(ඈ). අරමුදල් ලබා දෙන කාලය.

(ඉ). අවිනිශ්චිත අරමුදල් මූලාශ්‍ර සඳහා සම්පාදනය කර ඇති ප්‍රතිපාදන.

(ඊ). ණය සහ ණයකර සඳහා ආපසු ගෙවීමේ නියමයන් සහ කාලසටහන.

උ). ව්‍යාපෘතියේ වට්ටම් සහිතව ආපසු ගෙවීමේ කාලය සඳහා කාර්තුමය පදනමින් සිදු කරන ප්‍රාග්ධන සහ මෙහෙයුම් වියදම් පුරෝකථන.

ඌ). ඉහත අයිතම (අ) සිට (ඊ) දක්වා අයිතම සම්බන්ධයෙන් (අදාළ නම්) සමාගමේ අතීත කාර්ය සාධනය (අදාළ නම්)

එ). ව්‍යාපාරය, මූල්‍ය සහ අරමුදල් සැලසුම් සහ ණය පහසුකම් සහතික කිරීම සඳහා අයදුම්කරු විසින් අභිලාශය ප්‍රකාශ කිරීමේ ලිපි, ඇපකර ලිපි වැනි අදාළ ලේඛනමය සාක්ෂි ඉදිරිපත් කළ යුතුය

2.4.2.2. යෝජිත මූල්‍ය හා ආයෝජන සැලැස්ම

අ). ඉදිරි වසර 10 සඳහා යෝජිත මූල්‍ය සැලැස්මේ විස්තර සහ වට්ටම් සහිතව ආපසු ගෙවීමේ කාලය වසර 10 ට අඩු විය යුතුයඃ

ආ). ඇස්තමේන්තුගත ලාභ හා අලාභ ගිණුම්, ශේෂ පත්‍ර සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සකස් කළ යුතුය. වත්කම් ක්ෂයවීම් ප්‍රතිපත්ති, ග්‍රාහකයන්ගේ සැලසුම් , මෙහෙයුම් වියදම්වල වාර්ෂික විචල්‍යයන් යනාදී සියලු උපකල්පන පැහැදිලිව සඳහන් කළ යුතුය.

ඇ.) මුදල් ප්‍රවාහය, අභ්‍යන්තර ප්‍රතිලාභ අනුපාතිකය (IRR), ආයෝජනයේ වට්ටම් සහිත ආපසු ගෙවීමේ කාලසීමාව ඇතුළු අදාළ මූල්‍ය ප්‍රමිතිකවල පුරෝකථනයන් සඳහන් කළ යුතුය. තවද, ශුද්ධ වර්තමාන අගය (NPV) පිළිබඳ විස්තර දැක්විය යුතුය. ව්‍යාපෘතිය ලාභදායී වීම සඳහා අපේක්ෂිත කාල රාමුව පැහැදිලිව සඳහන් කළ යුතුය.

ඈ). යොදවා ඇති ප්‍රාග්ධනය මත ප්‍රතිලාභ, වත්කම් මත ප්‍රතිලාභ, මෙහෙයුම් ලාභ ආන්තිකය, ශුද්ධ ලාභ ආන්තිකය, ප්‍රාග්ධන ආයෝජන අනුපාතය, වත්මන් අනුපාතය, සහ ණය කොටස් අනුපාතය ඇතුළුව ප්‍රක්ෂේපිත මූල්‍ය අනුපාත ගණනය කළ යුතුය. එක් එක් අනුපාතය ගණනය කිරීමේදී භාවිතකරන සූත්‍රය ද සැපයිය යුතුය.

ඉ) ඉහත අයිතම (අ) සිට (ඈ) සම්බන්ධයෙන් සමාගමේ අතීත කාර්ය සාධනය (අදාළ නම්)

ඊ) අවදානම් විශ්ලේෂණය/පාලනය සහ සීමාවන් සහ උපාය මාර්ගඃ
   අ. වෙළෙඳපල අවදානම්
   ආ. ද්‍රවශීලතාවය පිළිබඳ අවදානම
   ඇ. බංකොලොත්වීමේ අවදානම

උ). සමාගමේ වර්ධනයට භාවිතා කරන මිනුම් සහ උපාය මාර්ග :
   අ) පැවරීමේ කාර්යක්ෂමතාව
   ආ) ගතික කාර්යක්ෂමතාව
   ඇ) X-කාර්යක්ෂමතාව
   ඈ) නිෂ්පාදන කාර්යක්ෂමතාව

2.4.3. විකුණුම් සහ අලෙවිකරණය

අ) එක් එක් භූගෝලීය ප්‍රදේශයන්හි අපේක්ෂිත ග්‍රාහක වර්ධනය සහ අත්පත් කර ගැනීම සඳහා යොදා ගන්නා උපාය මාර්ග සහ අයක්‍රම අවශ්‍යතාවය පිළිබඳ කෙටි විස්තරය සැපයීම.

ආ) ව්‍යාපාරයේ සිරස් කොටස් සහ අලෙවිකරණ ක්‍රමවේද ඇතුළුව වෙළෙඳපොලේ ප්‍රධාන ඉලක්කය (උදා. තොග හෝ සිල්ලර, නේවාසික හෝ ව්‍යාපාර) ඇතුළුව සේවාවන්හි විස්තීරණ විකුණුම් සැලැස්ම පුරෝකථනය කරන ලද වාර්ෂික විකුණුම් අයවැයේ වියදම් සහ විස්තරය පැහැදිලි කළ යුතුය.

ඇ) අලෙවිකරණ මාධ්‍ය ඇතුළුව පුළුල් අලෙවිකරණ සැලැස්මක් උදා. සෘජු අලෙවිකරණය, දැන්වීම් පුවරු, සඟරා සහ පුවත්පත්, රූපවාහිනිය සහ ගුවන් විදුලි යනාදිය.

ඈ) අනෙකුත් පාරිභෝගික අවශ්‍යතා හඳුනාගැනීම සඳහා පර්යේෂණ සහ සංවර්ධන සැලැස්ම.

ඉ) අලෙවි නියෝජිත ජාලයේ විස්තරය සහ ක්‍රියාත්මක වන ක්ෂේත්‍ර ඇතුළු ගිවිසුම් (වෙළෙඳ ගිවිසුම ඇමිණිය යුතුය).

ඊ) තෙවන පාර්ශ්වයන් වෙත ලබා දී ඇති එවැනි මෙහෙයුමක ඕනෑම කොටසක් පිළිබඳ විස්තරය.

උ) විදුලි සංදේශ වෙළෙඳපොල තුළ සහ ඉන් පිටත සමාගමේ අනෙකුත් වෙළෙඳ කටයුතු සහ අයදුම්කරුවන් අතර හරස් සහනාධාර ලබා නොදීම සහතික කිරීම සඳහා විධිවිධාන සළසා ඇත.

- තොග සහ සිල්ලර කටයුතු.
- විදුලි සංදේශ සහ විදුලි සංදේශ නොවන ක්‍රියාකාරකම්.
- විදුලි සංදේශ උපකරණ නිෂ්පාදනය හෝ සැපයීම.
- වෙනත් විදුලි සංදේශ කටයුතු.

2.4.4. පාරිභෝගික සේවාව සහ ආරක්ෂණය

අ) පාරිභෝගිකයාට සපයන ලද පාරිභෝගික පරිශ්‍ර උපකරණ පිළිබඳ විස්තර :

ආ) පාරිභෝගික පරිශ්‍ර උපකරණ නඩත්තු කිරීම:

ඇ) පාරිභෝගිකයන් සමඟ සේවා මට්ටමේ ගිවිසුම් විස්තර (පිටපතක් අමුණන්න):

ඈ) පැමිණිලි මෙහෙයවීමේ ක්‍රමවේදය/ අවම දෝෂ නිෂ්කාශන කාලය:

ඉ) බංකොලොත් භාවයට එරෙහිව පාරිභෝගික ආරක්ෂාව (රක්ෂණ ආවරණය යනාදිය).

ඊ) පැමිණිලි මෙහෙයවීමේ සේවා ගුණාත්මකභාවය :

උ) බිල්පත් නිරවද්‍යතාවය සහතික කිරීම :

ඌ) නියමයන් සහ කොන්දේසිවල විනිවිදභාවය සහ යෝජිත සේවා ගාස්තු:

2.4.5. ආයතනික කළමනාකරණය

2.4.5.1. යෝජිත ආයතනික ව්‍යුහය

අ) සමාගමේ ආයතනික ව්‍යුහය, කාර්ය මණ්ඩලය සහ පුහුණුව ඇතුළුව එක් එක් අංශයේ විස්තරය.

ආ) ඉදිරි වසර 5 සඳහා තාක්ෂණික, විකුණුම් සහ අලෙවිකරණය, මූල්‍ය, නීතිමය සහ අනෙකුත් ජ්‍යෙෂ්ඨ, මධ්‍යම සහ කනිෂ්ඨ මට්ටම් සඳහා වාර්ෂිකව උත්පාදනය කරන නව රැකියා සංඛ්‍යාව.

ඇ) අවම වශයෙන් අධ්‍යාපනික සහ වෘත්තීය සුදුසුකම් සහ වෘත්තීය ඉතිහාසය සපයමින් යෝජිත ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්ව කණ්ඩායම් සාමාජිකයින්ගේ ජීව දත්ත කෙටියෙන් සඳහන් කරන්න.

ඈ) අදාළ විදුලි සංදේශ ජාලය ස්ථාපිත කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා අදාළ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම් සාමාජිකයින්ගේ විශේෂ පළපුරුද්ද.

2.4.5.2. උපාය මාර්ගික සැපයුම්කරුවන්

අ) අයදුම්කරු විසින් ජාල ඉදිකිරීමේ සහ පශ්චාත් සේවා-දියත් කිරීමේ මෙහෙයුමේ දී එහි සාර්ථකත්වය සහතික කිරීම සඳහා යෝජිත සියලුම උපාය මාර්ගික සැපයුම්කරුවන්ගේ විස්තර සහ භූමිකාවන් විස්තර කළ යුතුය.

ඇතුළත් විය යුතු විස්තරඃ

- ව්‍යාපාරයේ නම සහ වර්ගය.
- දේශීය සහ ජාත්‍යන්තර ප්‍රදේශ සම්බන්ධ ශක්‍යතාවයන් සහ ව්‍යාපෘති.
- අපේක්ෂිත ආකාරයේ වාණිජ සබඳතා සහ බලය පැවරීමේ ප්‍රතිපත්ති විස්තර කිරීම.

2.4.5.3. තෙවන පාර්ශ්වීය සහභාගීත්වය

අ) බෙදාහැරීමේ නාලිකා, සේවා පිරිනැමීම, සේවාලාභීන් හා සෘජුවම සම්බන්ධ නොවී පාරිභෝගික සේවා සැපයීම පිණිස සහාය සැපයීමේ සේවා , අගය එකතු කළ සේවාවන්, මූලික ජාලය සහ ප්‍රවේශ ජාලය / ඔප්ටිකල් මාර්ග ආරක්ෂණය (OLP) වැනි එහි වටිනාකම් දාමය තුළ පද්ධති සහ සේවාවන් ක්‍රියාත්මක කිරීමට සම්බන්ධ තෙවන පාර්ශ්වයන් පිළිබඳ විස්තරය.

2.4.6. ඉහත තොරතුරුවලට අමතරව, අයදුම්කරු පහත සඳහන් කරුණු අන්තර්ගත විශ්ලේෂණ විස්තර ද ඉදිරිපත් කළ යුතුයඃ

අ) අයදුම්කරුගේ මෙහෙයුම් සාමාන්‍යයෙන් රටට සහ විශේෂයෙන් විදුලි සංදේශ කර්මාන්තයට ප්‍රතිලාභ සැලසීමට /විදුලි සංදේශ කර්මාන්තයේ බලපෑමට බලපාන අයුරු.

ආ) විදුලි සංදේශ ක්ෂේත්‍රයේ ඵලදායි ලෙස තරඟ කිරීමට යොදා ගත යුතු උපාය මාර්ග.

ඇ) ඉදිරි වසර 10 තුළ අයදුම්කරු සාක්ෂාත් කර ගැනීමට අපේක්ෂා කරන යෝජිත සහ අපේක්ෂිත වෙළෙඳපල කොටස්වල ක්‍රියාකාරකම් සඳහා ඇති විය හැකි ඉල්ලුම ආශ්‍රිත ආර්ථික සහ වෙළෙඳපල අධ්‍යයනය.

ඈ) සේවා සැපයීමේ දී සහ ක්‍රියාකාරකම් සිදුකිරීමේ දී භාවිතා කළ යුතු තාක්ෂණික නවෝත්පාදනයන් පිළිබඳ විස්තර.

ඉ) යටිතල පහසුකම් බෙදාගැනීම සඳහාවන මුලපිරීම් පිළිබඳ විස්තර.

ඊ) වෙනත් තොරතුරු

2.5. ප්‍රකාශය.

අයදුම්කරු විසින් අයදුම්පත්‍රයේ සපයා ඇති තොරතුරු සහ අයදුම් පත්‍රය සමග ඉදිරිපත් කරන ලද ශක්‍යතා වාර්තාවේ සඳහන් කර ඇති තොරතුරුවල නිරවද්‍යතාවය සහතික කරමින් S17-1-A අයදුම්පත්‍රයේ ප්‍රකාශය අත්සන් කිරීම අවශ්‍ය කෙරේ.

**උපලේඛන 1/ ආ කොටස -ඃ සේවා පාදක ක්‍රියාකරු (SBO) බලපත්‍ර නිකුත් කිරීම**

2.6. නව බලපත්‍ර සඳහා අයදුම් කිරීමේ මාර්ගෝපදේශ ඃ

2.6.1. 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ සංශෝධිත පනතේ 17 වැනි වගන්තිය ප්‍රකාරව නිකුත් කරන ලද විදුලි සංදේශ පද්ධති සේවා පාදක මෙහෙයුම් සහ විදුලි සංදේශ සේවා සැපයීම පිණිස නව බලපත්‍රයක් ලබා ගැනීම සඳහා අයදුම් කිරීමට කැමති පාර්ශ්වයන් සඳහා උපලේඛන 1 - ආ වගන්තිය - මගින් මාර්ගෝපදේශ සහ තොරතුරු සපයයි.

2.6.2. ගුවන්විදුලි සංඛ්‍යාත වර්ණාවලිය, මාර්ග අයිතිය, අංකනය වැනි හිඟ සම්පත් සඳහා සේවා පාදක ක්‍රියාකරුවන් (SBO) හිමිකම් නොලබනු ඇත. ඔවුන් විසින් අත්‍ය ජාලය ක්‍රියාත්මක කිරීමට සහ මහජනතාව වෙත ස්වකීය විදුලි සංදේශ සේවා සැපයීම පිණිස බලපත්‍රලාභී පහසුකම් පාදක ක්‍රියාකරුවන් (FBO) වෙතින් සම්ප්‍රේෂණ පහසුකම් බදු දීම අවශ්‍ය කෙරේ.

2.6.3. අයදුම්කරු 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ විධිමත් ලෙස සංස්ථාපිත සමාගමක් විය යුතුය. අයදුම් කරන සමාගමේ නම, සංස්ථාගත කළ දිනය සහ ස්ථානය, ව්‍යාපාරය සහ ලියාපදිංචි ලිපිනය, සම්බන්ධ කර ගත හැකි දුරකථන අංකය, ෆැක්ස් අංකය, ඊමේල් ලිපිනය සහ අයදුම්කරුගේ ආයතනය වෙනුවෙන් සම්බන්ධ කර ගත හැකි පුද්ගලයෙකුගේ නම සහ තනතුර සැපයිය යුතුය.

2.6.4. තනි පුද්ගල ව්‍යාපාරයක්, හවුල් ව්‍යාපාරයක් හෝ වෙනත් ඕනෑම පුද්ගලයෙකු හෝ කොමිෂන් සභාව විසින් කලින් කලට තීරණය කරනු ලබන පුද්ගලයෙකු හෝ පුද්ගල කණ්ඩායමක් බලපත්‍ර ලබා ගැනීම සඳහා අයදුම් කිරීමට සුදුසුකම් නොලබයි.

2.6.5. ඍජු සහ වක්‍ර යන දෙඅංශයෙන්ම අවසාන හිමිකාරිත්වය පැහැදිලිව පෙන්නුම් කරමින් හිමිකාරීත්වය හෝ ආශ්‍රිත සමාගම් සමඟ ඇති සබඳතාව ඇතුළුව ආයතනික සහ කොටස් හිමි ව්‍යුහය පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු ලබා දිය යුතුය. අයිති සමාගම පොදු ආයතනයක් නම්, පොදු ලැයිස්තුගත කිරීම් පිළිබඳ විස්තර සැපයිය යුතුය.

2.6.6. ඍජු හෝ වක්‍ර විදේශීය කොටස් හිමිකම උපරිම වශයෙන් 40%කට (සියයට හතළිහකට) සීමා කළ යුතුය. ඉතිරි 60% ශ්‍රී ලාංකික නේවාසික පුරවැසියන් හෝ 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ විධිමත් ලෙස සංස්ථාපිත ශ්‍රී ලාංකික නේවාසික සමාගමක් සතු විය යුතුය. කෙසේ වෙතත්, මෙම ප්‍රතිශත විශේෂ කරුණු යටතේ කොමිෂන් සභාව විසින් සමාලෝචනය කළ හැක. විදේශීය ආයතනයක් හිමිකාරිත්වයේ ප්‍රතිශතයට ඍජුවම සමාන විදේශ මුදල්වල ආයෝජනය කළ යුතු අතර ආයෝජනයේ විදේශීය කොටස සඳහා ශ්‍රී ලංකාවේ කිසිදු බැංකුවකින්/මූල්‍ය ආයතනයකින්/ලීසිං සමාගමකින් හෝ වෙනත් ආයතනයකින් බැංකු ණයක් ලබා ගත නොහැක.

2.6.7. අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ තනි කොටස් හිමියන් ඇතුළු ප්‍රධාන කළමනාකරණ කණ්ඩායමේ සවිස්තරාත්මක සංයුතිය සැපයිය යුතුය.

2.6.8. 1.2 හි සඳහන් බලපත්‍රය කොමිෂන් සභාවේ නිර්දේශය මත අමාත්‍යවරයා විසින් නිකුත් කරනු ලැබේ. කෙසේ වෙතත්, දක්වා ඇති හේතු මත එවැනි නිර්දේශ ප්‍රතික්ෂේප කිරීමට සහ ඔහුගේ අභිමතය පරිදි බලපත්‍රයක් ප්‍රදානය කිරීමට අමාත්‍යවරයාට බලය ඇත.

2.6.9. කෙසේ වෙතත්, විදුලි සංදේශ පද්ධතියක් ක්‍රියාත්මක කිරීම සඳහා බලපත්‍රයක් නිකුත් කිරීම, ඕනෑම වෙළෙඳපල කොටසක යම් සේවාවක් සැපයීම සඳහා අවසර දීම ශ්‍රී ලංකාවේ එම සේවා සඳහා අදාළ වන නියාමන අවශ්‍යතාවය මත රඳා පවතින අතර, කොමිෂන් සභාව විසින් එම අවශ්‍යතා සම්පූර්ණ නොකළ ඕනෑම අයැදුම්පතක් ක්‍රියාවට නැංවීමකින් තොරව ප්‍රතික්ෂේප කළ හැක.

2.6.10. ප්‍රතිපත්තිමය සහ/හෝ නියාමන අවශ්‍යතා හේතුවෙන් වෙළඳපල ඉලක්ක කරගත් ක්‍රමවේදය ඔස්සේ බලපත්‍රය/බලපත්‍ර නිකුත් කිරීමට කොමිෂන් සභාව තීරණය කරන්නේ නම්, සුදුසු ආයතනවලින් අයදුම්පත් කැඳවීමට ජාතික පුවත්පත්වල ප්‍රසිද්ධ දැන්වීම පළ කළ හැක. එවැනි අවස්ථාවක දී, මීට පෙර කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර පිළිනොගත් අයදුම්පත / අයදුම්පත් ප්‍රතික්ෂේප කර ඒ බව ඔවුන්ට දැනුම් දිය හැකිය.

2.6.11. නව බලපත්‍රයක් සඳහා අයදුම් කිරීමට කැමති ඕනෑම උනන්දුවක් දක්වන පාර්ශ්වයක් නිසි පරිදි පරිපූර්ණ කළ S17-1-B අයැඳුම්පතක් ඉදිරිපත් කළ යුතුය. අයැඳුම්පත නිසි පරිදි සම්පූර්ණ කර ඇති බවට සහ සියලුම විස්තර ක්‍රමානුකූලව ඇති බවට කොමිෂන් සභාව සහතික කරනු ඇත. අයදුම්කරුවන් විසින් අයැදුම්පතට අමුණා ඇති පිරික්සුම් ලැයිස්තුව අයැදුම්පත සමඟ ඉදිරිපත් කළ යුතුය. අදාළ ලියකියවිලි සහ අදාළ ක්‍රියාවලි ගාස්තු සමඟ අයැදුම්පත කොමිෂන් සභාව වෙත ලැබුණු විට, කොමිෂන් සභාව විසින් ආරක්ෂක අමාත්‍යාංශයෙන් නිෂ්කාශනය ලබා ගැනීම පිණිස එම අයැදුම්පත යොමු කරනු ඇත. ආරක්ෂක අමාත්‍යාංශයෙන් ආරක්ෂක නිෂ්කාශනය ලබා නොදෙන්නේ නම්, අයැදුම්පත ප්‍රතික්ෂේප කරනු ලැබේ.

2.6.12. අයදුම්කරු විසින් ලබා දී ඇති තොරතුරු අයැදුම්පත සඳහා ප්‍රමාණවත් නොවන බව කොමිෂන් සභාවේ මතය නම්, වැඩිදුර විස්තර විමසිය හැකි අතර අයදුම්පත් ක්‍රියාවලිය ප්‍රමාද විය හැක.

2.6.13. එවැනි තත්ත්වයන් තුළ, අයැදුම්පත ඉදිරිපත් කිරීමෙන් සති හතරක් ඇතුළත ඉල්ලා සිටින තොරතුරු ලබා දෙන ලෙස කොමිෂන් සභාව අයදුම්කරුට නියම කරනු ඇත. කොමිෂන් සභාවේ මෙම නියෝගයට අනුකූල වීමට අපොහොසත් වීම අයදුම්කරු මෙම බලපත්‍ර ක්‍රියාවලියෙන් නුසුදුස්සෙකු වීමට හේතු විය හැක.

2.6.14. බලපත්‍රය ප්‍රදානය කිරීම සඳහා අයදුම්කරුගේ සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා ඉදිරිපත් කරන ලද ලේඛන පරීක්ෂා කිරීමෙන් පසු, උපලේඛන1/ ආ වගන්තිය - (2.7) හි විස්තර කර ඇති ඇගයීම් නිර්ණායක අනුව කොමිෂන් සභාව විසින් අයදුම්පත ඇගයීම සිදු කරනු ඇත. අයදුම්කරු විසින් ඇගයුම් නිර්ණායකවල විස්තර කර ඇති සියලුම කරුණු සම්බන්ධයෙන් සෑම අවස්ථාවකදී ම පැහැදිලි සාක්ෂි සැපයිය යුතුය.

2.6.15. කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කරන ලද අයදුම්පතට අමතරව, ඇගයීම අතරතුර වරින් වර , ඇගයීමේ කටයුතු වලට සහාය කර ගැනීම පිණිස අමතර ලියකියවිලි ඉදිරිපත් කරන ලෙස අයදුම්කරුගෙන් ඉල්ලා සිටිය හැක. කෙසේ වෙතත්

අයදුම්කරු අයදුම්කරු බලපත්‍ර ක්‍රියාවලිය සම්බන්ධයෙන් නුසුදුස්සකු වේ. තවද අයදුම්කරුට තම යෝජනාව පිළිබඳ වැඩිදුර පැහැදිලි කිරීම් සඳහා ඉදිරිපත් කිරීමක් සිදු කිරීමට අවශ්‍ය විය හැකිය.

2.6.16. උපලේඛන 1/ ආ කොටස - (2.7) හි විස්තර කර ඇති ඇගයීම් නිර්ණායක ප්‍රකාරව, ලකුණු 50% ට වඩා වැඩි නම්, අයදුම්කරු බලපත්‍ර ප්‍රදානය සඳහා සුදුසුකම් ලබයි.

2.6.17. බලපත්‍ර ප්‍රදානය කිරීම සඳහා අමාත්‍යවරයාට නිර්දේශ කිරීමට පෙර, බලපත්‍ර නිකුත් කිරීම සම්බන්ධයෙන් ප්‍රසිද්ධ කළ දින සිට දින තිහක් ඇතුළත, කොමිෂන් සභාව විසින් මහජන අදහස් විමසමින් අයදුම්කරු පිළිබඳ තොරතුරු ජාතික පුවත්පත්වල ප්‍රකාශයට පත් කරනු ඇත. මහජනතාවගේ පරිශීලනය සඳහා යෝජිත බලපත්‍රයේ කෙටුම්පතක් කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවියෙන් සම්පූර්ණයෙන් ලබා ගත හැකිය.

2.6.18. මහජනතාව වෙත කෙරෙන නිවේදනයට ප්‍රතිචාර වශයෙන් නිසි පරිදි ඉදිරිපත් කරන ඕනෑම සැලකිරීමක් හෝ විරෝධතාවක් කොමිෂන් සභාව විසින් සලකා බලනු ඇත. අයදුම්පත සම්බන්ධයෙන් කිසියම් සැලකිරීමක් හෝ විරෝධතාවයක් ඉදිරිපත් කළේ නම්, පැමිණිල්ලේ වර්ගය අනුව කොමිෂන් සභාවට විමර්ශනයක් ආරම්භ කළ හැකිය. විමර්ශනය අතරතුර සාක්ෂි ඉදිරිපත් කිරීමට අයදුම්කරුට සිදු විය හැකිය. කොමිෂන් සභාව සාධාරණ හේතු අනාවරණය කර ගත්තේ නම්, විමර්ශනයේ නිගමනයක් වශයෙන් බලපත්‍රයක් ලබා නොදීම සම්බන්ධයෙන් කොමිෂන් සභාවේ තීරණය අයදුම්කරුට ලිඛිතව දන්වනු ලැබේ.

2.6.19. මහජනතාව විසින් මතු කරන ලද විරෝධතා සාධාරණීකරණය කිරීම සඳහා විමර්ශනය අවසානයේ සාධාරණ හේතු කොමිෂන් සභාව විසින් අනාවරණය කර නොගත්තේ නම්, දින තිහක් ඇතුළත අවශ්‍ය බලපත්‍ර ගාස්තුව ගෙවන ලෙස අයදුම්කරුට උපදෙස් දෙනු ලැබේ. නියමිත කාලසීමාව තුළ බලපත්‍ර ගාස්තුව ලැබීමෙන් පසු, බලපත්‍රය ලබාදීමට කොමිෂන් සභාව විෂය භාර අමාත්‍යවරයාට නිර්දේශ කරනු ඇත. කොමිෂන් සභාව විසින් බලපත්‍රය ප්‍රදානය කිරීම එහි නිල වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කරනු ඇත. කෙසේ වෙතත්, අයදුම්කරු නියමිත කාල සීමාව තුළ බලපත්‍ර ගාස්තුව ගෙවීමට අපොහොසත් වන්නේ නම්, අයදුම්කරු නුසුදුස්සකු ලෙස සලකා බලපත්‍රය ප්‍රදානය නොකරනු ලබන අතර ක්‍රියාවලිය අවසන් කරනු ඇත.

2.6.20. කොමිෂන් සභාව බලපත්‍ර ක්‍රියාවලිය අතරතුර සහ අවසානයේ සමාගම පිළිබඳ තොරතුරු ප්‍රකාශයට පත් කරනු ඇත. අයදුම්කරුවන් විසින් රහස්‍ය තොරතුරු එම ලියකියවිලි රහස්‍ය බව පැහැදිලිවම සඳහන් කරමින් වෙනම ආවරණයක බහා ඉදිරිපත් කළ යුතුය. සියලුම වාණිජමය වශයෙන් වැදගත් තොරතුරු දැඩි ලෙස රහසිගතව පවතිනු ඇති බවට අයදුම්කරුවන්ට සහතික විය හැක.

2.6.21. බලපත්‍රලාභියා විසින් විදුලි සංදේශ පද්ධතියේ මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීමට පෙර, විදුලි සංදේශ සේවාව ක්‍රියාත්මක කිරීම සහ සැපයීම සඳහා අවශ්‍ය අනෙකුත් සියලුම බලපත්‍ර/අනුමැතිය ලබා ගැනීම තරයේ අවශ්‍ය වේ.

2.6.22. අදාළ සියලු විස්තර සහිතව නිසි පරිදි සම්පූර්ණ කරන ලද S17-1-B අයදුම්පත්‍රය ඉදිරිපත් කළ පසු, අයදුම්කරු විසින් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වෙත රුපියල් 200,000 ක්‍රියාවලි ගාස්තුවක් ගෙවීම අවශ්‍ය කෙරේ. මෙහිදී බලපත්‍ර ක්‍රියාවලියේදී අයදුම්කරුවෙකු සාර්ථකද නැද්ද යන්න සැළකිල්ලට ගනු නොලබන අතර මෙම ගාස්තුව ආපසු නොගෙවනු ලබන මුදලකි. අදාළ ක්‍රියාවලි ගාස්තුව නොගෙවන්නේ නම් කිසිදු අයැදුම්පතක් ඇගයීමට ලක් නොකෙරේ.

2.6.23. ප්‍රකාශය අත්සන් කරන සමාගමේ බලයලත් නියෝජිතයා විසින් අයැදුම්පතේ සහ ව්‍යාපෘති ශක්‍යතා වාර්තාවේ සෑම පිටුවක්ම සිය කෙටි අත්සන යොදා ආරම්භ කළ යුතුය. එමෙන්ම අයදුම්පත්‍රය සහ ව්‍යාපෘති ශක්‍යතා වාර්තාව විද්‍යුත් ආකෘතියෙන් ඉදිරිපත් කිරීම ද නිර්දේශ කරනු ලැබේ.

2.6.24. සම්පූර්ණ කරන ලද අයැදුම්පත සහ ව්‍යාපෘති ශක්‍යතා වාර්තාවේ පිටපත් තුනක් ක්‍රියාවලි ගාස්තුව සමඟින් විදුලි සංදේශ පද්ධති බලපත්‍රය සඳහා අයදුම් පත්‍රය (සේවා පාදක) යනුවෙන් පැහැදිලිව සටහන් කර ලියුම් කවරයක බහා පහත ලිපිනයට ලැබෙන සේ ඉදිරිපත් කළ යුතුය :

අධ්‍යක්ෂ ජනරාල්,
ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව,
අංක 276, ඇල්විටිගල මාවත, කොළඹ 08.
දුරකථනː +94-112689345
ෆැක්ස් : +94-112689341
විද්‍යුත් තැපැල : dgtsl@trc.gov.lk

2.7. නව බලපත්‍ර සඳහා අයැදුම්පත් ඇගයීමේ නිර්ණායක (සේවා පාදක)

2.7.1. විදුලි සංදේශ පද්ධතිය නිසි ලෙස ක්‍රියාත්මක කිරීම සහ විදුලි සංදේශ සේවා සැපයීම සඳහා තාක්ෂණික, මූල්‍ය, විකුණුම් සහ අලෙවිකරණය, පාරිභෝගික සේවා සහ ආරක්ෂාව සහ ආයතනික සහ කළමනාකරණ අංශ සම්බන්ධයෙන් වන ශක්‍යතාවය අයදුම්පත්‍රයේ ඇගයීම සඳහා පදනම් වේ. මෙම ඇගයීම S17-1-B අයදුම් පත්‍රය සමඟ ඉදිරිපත් කරන ලද ශක්‍යතා වාර්තාව මත පදනම් වනු ඇත.

2.7.2. අයදුම්කරු විසින් පහත එක් එක් අංශයේ/කොටස්වල දක්වා ඇති අවම ලකුණු ප්‍රමාණය එක්රැස් කර ගත යුතුය. බලපත්‍රය ප්‍රදානය කිරීම සඳහා සුදුසුකම් ලැබීමට මුළු ලකුණු ප්‍රමාණය 50% ට වඩා වැඩි විය යුතුය.

| *අංකය* | *ඇගයීම් නිර්ණායක* | *ලකුණු* | *අවශ්‍ය අවම ලකුණු සංඛ්‍යාව* |
|---|---|---|---|
| 1 | තාක්ෂණික<br>1. ජාල ව්‍යුහය<br>2. ධාරිතාවය සහ වේගය<br>3. බිල්පත් ක්‍රමය<br>4. පාරිභෝගික පරිශ්‍ර උපකරණ ප්‍රමිති | 30 | 15 |
| 2 | මූල්‍යය<br>1. ප්‍රාග්ධන සහ අරමුදල් මූලාශ්‍ර<br>2. මුදල් ප්‍රවාහ / ආයෝජන සැලැස්ම<br>3. වට්ටම් කළ අවම ප්‍රතිලාභ<br>4. අවදානම් විශ්ලේෂණය | 30 | 15 |
| 3 | විකුණුම් සහ අලෙවිකරණය<br>1. අපේක්ෂිත ග්‍රාහක වර්ධනය<br>2. අලෙවි සැලැස්ම<br>3. ප්‍රචාරණ සැලැස්ම<br>4. අලෙවි නියෝජිත ජාලය | 15 | 5 |
| 4 | පාරිභෝගික සේවා සහ ආරක්ෂණය<br>1. පාරිභෝගික පරිශ්‍ර උපකරණ වර්ගය<br>2. පාරිභෝගික පරිශ්‍ර උපකරණ නඩත්තු කිරීම<br>3. සේවා මට්ටම් ගිවිසුම<br>4. බංකොලොත්භාවයට එරෙහිව ආරක්ෂාව (රක්ෂණ යනාදිය)<br>5. ආරම්භයේ සිට අවසානය දක්වා සේවා තත්ත්ව ක්‍රියාවලිය සහතික කිරීම | 15 | 10 |
| 5 | සංවිධානය සහ කළමනාකරණය<br>1. ආයතනික ව්‍යුහය<br>2. නව රැකියා<br>3. පෙර පළපුරුද්ද<br>4. උපායමාර්ගික සැපයුම්කරුවන්<br>5. කාර්ය මණ්ඩලය සහ පුහුණුව | 10 | 5 |

2.8. අයදුම්පත්‍රය

පෝර්මය S17-1-B

පැහැදිලි කිරීමේ සටහන් (පෝර්මය S17-1-B)

- මෙම අයදුම්පත්‍රය සම්පූර්ණ කිරීමට පෙර, අයදුම්කරුවන් විසින් බලපත්‍ර මාර්ගෝපදේශවල උපලේඛන 1/ආ කොටස සම්පූර්ණයෙන් කියවිය යුතුය.

- සියලුම අයදුම්කරුවන් විසින් අයදුම් පත්‍රය (S17-1-B) සම්පූර්ණ කළ යුතුය.

- අයදුම්පත සම්පූර්ණයෙන්ම මුද්‍රිතව හෝ ඉංග්‍රීසි භාෂාවෙන් නම් කැපිටල් අකුරෙන් සම්පූර්ණ කළ යුතුය. ඉල්ලා සිටින තොරතුරු යෝජිත විදුලි සංදේශ පද්ධතියට අදාළ නොවේ නම්, කරුණාකර අදාළ නොවේ යන්න ලියන්න.

- ඉල්ලුම් කරන ලද තොරතුරු සැපයීමට ලබා දී ඇති ඉඩකඩ ප්‍රමාණවත් නොවේ නම් අයදුම්කරුවන් විසින් අමතර පිටු ඇමිණිය යුතුය. අමතර පිටු වල තොරතුරු පැහැදිලිව ඉදිරිපත් කළ යුතු අතර මෙම පෝරමයට අනුකූලව අංකගත කළ යුතුය. අමුණා ඇති පිටු A4 ප්‍රමාණයේ කඩදාසි මත මුද්‍රණය කළ යුතුය.

- අයදුම්කරුවන් විසින් අයදුම්පත්‍රයේ කිසියම් නිවැරදි කිරීමක් හෝ වෙනස් කිරීමක් සිදු කළ විට කෙටි අත්සන සහ දිනය යෙදිය යුතුය.

- අයදුම්කරුවන් විසින් මාර්ගෝපදේශයේ දක්වා ඇති පෝර්මය ප්‍රකාරව ඇමුණුම් සහ ව්‍යාපෘති ශක්‍යතා වාර්තාව ඇතුළුව අයදුම්පත්‍රයේ පිටපත් 3 ක් පහත සඳහන් ලිපිනයට ඉදිරිපත් කිරීම අවශ්‍ය වේ.

අධ්‍යක්ෂ ජනරාල් ,
ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව,
අංක 276, ඇල්විටිගල මාවත, කොළඹ 08.
දුරකථනː +94-112689345
ෆැක්ස්ː +94-112689341
විද්‍යුත් තැපැලː dgtsl@trc.gov.lk

පෝර්මය S17-1-B

**1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ (සංශෝධිත) පනතේ 17 වැනි වගන්තිය යටතේ විදුලි සංදේශ පද්ධති බලපත්‍රය (සේවාව පාදක) නිකුත් කිරීම සඳහා වන ඉල්ලුම්පත්‍රය**

1. අයදුම්කරු සම්බන්ධ විස්තර : සමාගමේ බලයලත් නියෝජිතයා (අයදුම්කරු) පහත තොරතුරු සැපයිය යුතුය:

1.1. සම්පූර්ණ නම :
1.2. උපන්දිනය :
1.3. ජාතික හැඳුනුම්පත් අංකය/විදේශ ගමන් බලපත්‍ර අංකය:
1.4. පුරවැසිභාවය :
1.5. ලිපිනය (ස්ථිර): පදිංචිය:
1.6. දුරකථන අංකය (ස්ථාවර): ජංගම:
1.7. ෆැක්ස් අංකය:
1.8. විද්‍යුත් තැපැල් ලිපිනය:

කරුණාකර කොටුව පරීක්ෂා කරන්න ( ✓ ලකුණ යොදන්න)
☐ අයදුම්කරුට බලය පැවරීමේ අධ්‍යක්ෂ මණ්ඩල තීරණය

2. සමාගමේ විස්තර :

2.1. සමාගමේ ලියාපදිංචි නම :
2.2. සමාගමේ ලියාපදිංචි අංකය :
2.3. සංස්ථාගත කිරීමේ දිනය :
2.4. ලියාපදිංචි ලිපිනය :
2.5. සමාගමේ නිල දුරකථන අංකය :
2.6. ෆැක්ස් අංකය :
2.7. විද්‍යුත් තැපැල් ලිපිනය :
2.8. සමාගමේ නිල වෙබ් අඩවිය :
2.9. හිමිකාරිත්වය පැහැදිලිව සඳහන් කරමින් මව් සමාගම හෝ ආශ්‍රිත සමාගම් සමඟ ඇති සබඳතාව ඇතුළුව ආයතනික සහ කොටස් හිමි ව්‍යුහය පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු:
2.10. පොදු සමාගමක් නම් (මව් සමාගම ඇතුළුව) පොදු ලැයිස්තුගත කිරීම් පිළිබඳ විස්තර:
2.11. ව්‍යාපාර ගිණුම පවත්වාගෙන යන බැංකුවේ නම සහ සම්බන්ධතා තොරතුරු :
2.12. කොටස් ප්‍රාග්ධනය (එක් එක් කොටස් පන්තියේ කොටස් පන්තිය, අංකය සහ කොටස් වටිනාකම)
2.13. කොළඹ කොටස් වෙළඳපොලේ ලැයිස්තුගත කර ඇත්නම් කොටස් කාණ්ඩයේ විස්තර සපයන්න:
2.14. හවුල්කාරිත්වයක් නම් , විස්තර සපයන්න :
2.15. තනි පුද්ගල හිමිකම තිබේ නම් ඒ පිළිබඳ විස්තර සහ අධ්‍යක්ෂවරුන්ගේ සුදුසුකම් සහ වෘත්තීය ඉතිහාසය සමග අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ ප්‍රධාන කළමනාකරණ කණ්ඩායමේ සවිස්තරාත්මක සංයුතිය (සුදුසුකම් පිළිබඳ විස්තර ඇමිණිය යුතුය):
2.16. වෙනත් නියෝජිතායතනයකට හෝ උපදේශකයකුට පවරන ලද ක්‍රියාකාරකම් ලැයිස්තුව:
2.17. සමාගමේ වෘත්තීය උපදේශකයින්ගේ ලැයිස්තුව: (තාක්ෂණික, නීතිමය, මූල්‍ය, විගණකවරුන්).
2.18. දැනට සමාගමක් හෝ අනුබද්ධිත ආයතනයක් (දේශීය හෝ විදේශීය) සතු විදුලි සංදේශ පද්ධති බලපත්‍ර පිළිබඳ විස්තර:
2.19. එවැනි බලපත්‍රයක් ප්‍රත්‍යාදිෂ්ට කිරීම හෝ බලයලත් ආයතනයක් විසින් අයදුම් කිරීම ප්‍රතික්ෂේප කිරීම පිළිබඳ විස්තර:

කරුණාකර පහත සඳහන් ලියකියවිලි අමුණන්න :
සාංගමික ව්‍යවස්ථාවලිය, ව්‍යාපාරය ලියාපදිංචි කිරීමේ සහතිකය, නවතම වාර්ෂික ප්‍රතිලාභය : 15 පෝර්මය සහ සපයා ඇති ඉහත විස්තර සම්බන්ධ වෙනත් තහවුරු කිරීමේ ලියකියවිලි

3. කොටස් හිමියන්ගේ විස්තර :

සියලුම කොටස් හිමියන්ගේ විස්තර පහත ආකෘතියෙන් ඉදිරිපත් කළ යුතුය. (එක් එක් කොටස් හිමියා සඳහා වෙන වෙනම විස්තර සැපයිය යුතුය)

- අ) සම්පූර්ණ නමः
- ආ) උපන් දිනය :
- ඇ) ජාතික හැඳුනුම්පත් අංකය/විදේශ ගුවන් ගමන් බලපත්‍ර අංකයः
- ඈ) පුරවැසිභාවය :
- ඉ) ලිපිනය (ස්ථිර)ः පදිංචිය :
- ඊ) දුරකථන අංකය (ස්ථාවර )ः ජංගමः
- උ) ෆැක්ස් අංකය :
- ඌ) විද්‍යුත් තැපැල් ලිපිනයः
- එ) කොටස් ප්‍රතිශතයः
- ඒ) කොටස් නිකුත් කළ දිනය :
  (කොටස් සහතික ඇමිණිය යුතුය)
- ඔ) කලින් අයිති ඇවර කිරීමට ගොස් ඇති සමාගම්වල විස්තර :
- ඕ) කිසියම් රටක බලයලත් ආයතනයක් විසින් ප්‍රතික්ෂේප කරන ලද කලින් අයිති සමාගමක් විසින් ඉදිරිපත් කරන ලද විදුලි සංදේශ බලපත්‍රය සඳහා වන ඕනෑම අයදුම්පතක් පිළිබඳ විස්තර :
- ක) ඕනෑම රටක බලයලත් ආයතනයක් විසින් අවලංගු කරන ලද සමාගමක් සතු වු ඕනෑම විදුලි සංදේශ බලපත්‍රයක් පිළිබඳ විස්තරः
- ග) වෙනත් ඕනෑම ව්‍යාපාරික අවශ්‍යතා :

4. ව්‍යාපෘති ශක්‍යතා වාර්තාව

මෙම අයදුම්පත සමග විස්තීර්ණ ව්‍යාපෘති ශක්‍යතා වාර්තාවක් ඉදිරිපත් කළ යුතුය. අයදුම්කරන බලපත්‍රයේ සේවාව පිළිගත හැකි ගුණාත්මක සේවාවක් ලෙස සැපයීම සහ විදුලි සංදේශ පද්ධතිය පිළිගත හැකි ප්‍රමිතීන්ට අනුව ස්ථාපිත කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාම පිණිස අයදුම්කරුගේ සමාගමේ තාක්ෂණික, මූල්‍ය, විකුණුම් සහ අලෙවිකරණය, පාරිභෝගික සේවා සහ ආරක්ෂාව, ආයතනික සහ කළමනාකරණ හැකියාවන් සහ කුසලතා වාර්තාවට ඇතුළත් විය යුතුය. බලපත්‍ර මාර්ගෝපදේශයේ 2.9 වගන්තියේ දක්වා ඇති උපදෙස් අනුව ශක්‍යතා වාර්තාව සකස් කළ යුතුය. අයදුම්පත්‍රය ඇගයීමේදී ව්‍යාපෘති ශක්‍යතා වාර්තාවේ දක්වා ඇති තොරතුරු සැලකිල්ලට ගනු ලැබේ.

5. ප්‍රකාශය

............................................................................ වන මම මෙම අයදුම් පත්‍රයේ සහ ශක්‍යතා වාර්තාවේ සපයා ඇති සියලුම තොරතුරු සත්‍ය සහ නිවැරදි බව මෙයින් සහතික කරමි. 1996 අංක 27 දරන පනතින් සංශෝධිත 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත ප්‍රකාරව කොමිෂන් සභාව විසින් සාදන ලද සියලුම රීති, විධිවිධාන, තීරණ සහ බලපත්‍රයේ සියලුම විධිවිධාන සහ නියමයන් සහ කොන්දේසි වලට අවනත බව මෙයින් ප්‍රතිඥා දෙමි.

සමාගමේ බලයලත් නියෝජිතයාගේ අත්සන : ……………………….

දිනය :…………………

අයදුම්පත පිරික්සුම් ලැයිස්තුව

(අ) අයදුම්පතේ අවශ්‍යතා :

1. අයදුම්පත් ක්‍රියාවලි ගාස්තුව රු.200,000 ඇතුළත්ද? ඔව් /නැත
2. අයදුම්පතේ 1, 2, 3, 4, සහ 5 වගන්තිය සුදුසු පරිදි සම්පූර්ණ කර තිබේද? ඔව් /නැත
3. අයදුම්පතේ 4 වැනි අයිතමයේ විස්තර කර ඇති පරිදි ව්‍යාපෘති ශක්‍යතා වාර්තාව ඉදිරිපත් කර තිබේද? ඔව් /නැත
4. 5 වන වගන්තියේ ප්‍රකාශනය සමාගමේ බලයලත් නියෝජිතයෙකු විසින් අත්සන් කර තිබේද? ඔව් /නැත
5. ඇමුණුම් සහ ව්‍යාපෘති ශක්‍යතා වාර්තාව ඇතුළුව අයදුම්පතේ පිටපත් 3ක් ඉදිරිපත් කර තිබේද? ඔව් /නැත

6. ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක්/ සමාගමේ බලයලත් නියෝජිතයාගේ විදේශ ගමන් බලපත්‍රයේ අදාළ පිටු.
**ඔව් /නැත**

7. අයදුම්පත්‍රය ඉදිරිපත් කිරීම සඳහා බලයලත් නියෝජිතයා පත් කිරීම සඳහා වූ අධ්‍යක්ෂ මණ්ඩල තීරණවල පිටපතක්:
**ඔව්/ නැත**

8. සමාගම් ලේඛන ඉදිරිපත් කිරීම : **(ඔව්/නැත)**

සාංගමික ව්‍යවස්ථාවලිය, ලියාපදිංචි කිරීමේ සහතිකය, නවතම වාර්ෂික ප්‍රතිලාභ: 15 පෝර්මය ඉදිරිපත් කරන ලද වෙනත් අදාළ පෝර්ම .........

9. ජාතික හැඳුනුම්පත්වල පිටපත්/ විදේශ ගමන් බලපත්‍රවල අදාළ පිටු, ප්‍රධාන විධායක නිලධාරී, අධ්‍යක්ෂවරුන් සහ කොටස් හිමියන්ගේ ජීව දත්ත සහ ඔවුන්ගේ පැවැත්මට අදාළ වෙනත් ලියකියවිලි. **ඔව්/ නැත**

10. කොටස් සහතික සහ අනෙකුත් අදාළ ලේඛනවල පිටපත්. **ඔව් /නැත**

2.9 ව්‍යාපෘති ශක්‍යතා වාර්තාව සකස් කිරීම සඳහා වන මාර්ගෝපදේශ (සේවා පාදක)

S17-1-B අයදුම්පතේ 4 වන වගන්තිය යටතේ අවශ්‍ය තාක්ෂණික ශක්‍යතා වාර්තාව සැකසීම සඳහා වන මාර්ගෝපදේශ මෙම කොටසට ඇතුළත් වේ.
මෙම වාර්තාව තාක්ෂණික, මූල්‍ය, විකුණුම් අලෙවිකරණය, පාරිභෝගික සේවා සහ ව්‍යාපෘතියේ ආරක්ෂාව සහ ඉල්ලා සිටින විදුලි සංදේශ සේවා ක්‍රියාත්මක කිරීමට, ක්‍රියාකරවීමට සහ සැපයීමට යෝජිත කළමනාකරණ ව්‍යුහය සඳහා වෙනම සවිස්තරාත්මක පරිච්ඡේදවලින් සමන්විත විය යුතුය.

2.9.1 තාක්ෂණික යෝජනා

2.9.1.1 විදුලි සංදේශ පද්ධති ජාල විස්තර

අ) විස්තරාත්මක ජාල රූපසටහන Core/Backbone ඇතුලත්ව (ස්විචවල පිහිටීම), Backhaul (Routes), ප්‍රවේශ / ඔප්ටිකල් මාර්ග ආරක්ෂණය - OLP , ජාල අතර භෞතික පිහිටීම (all Points of Presence), ප්‍රවේශ ඇතුළු අන්තර්සම්බන්ධතා ස්ථාන (Interconnection Points) සහ විදුලි සංදේශ පද්ධති නිර්වචනයට අයත් වෙනත් සංරචක පිළිබඳ විස්තර ඇතුළුව පද්ධතියේ එක් එක් සංරචක සපයන සියලුම පහසුකම් පාදක ක්‍රියාකරුවන් (FBO) සමඟ පවත්නා ගිවිසුම් වර්ග පිළිබඳ විස්තර සැපයිය යුතුය. පහසුකම් සැපයීම සඳහා එකඟ වූ කැමැත්ත ප්‍රකාශ කිරීමේ ලිපි සහ සිල්ලර/තොග අයකුම පැහැදිලි කළ යුතුය.

ආ) පහසුකම් පාදක ක්‍රියාකරුගේ (FBO) සහතිකය සහිතව ජාල රූප සටහන සමඟ සාක්ෂාත් කරගත හැකි වේගය සහ ධාරිතාව සඳහන් කරන්න.

ඇ) යෝජිත බිල්පත් ක්‍රමය, අනුගමනය කරන ලද බිල්පත් ප්‍රමිතීන් සහ බිල්පත් පද්ධතියේ නිරවද්‍යතාවය ඔප්පු කිරීමට පියවර ගැනීම.

ඈ) 2.9.1.1 හි විස්තර කර ඇති ජාලය සමඟ භාවිතා කළ යුතු සියලුම පර්යන්ත උපකරණවල (පාරිභෝගික පරිශ්‍ර උපකරණ) තාක්ෂණික පිරිවිතර ලබා දිය යුතුය. තවද, මෙහෙයුම් විස්තර, පවතින සම්බන්ධක සහ ශක්‍යතාවයන් විස්තර කළ යුතුය. උපකරණ නිෂ්පාදනය සඳහා වන පිරිවැය සහ පාරිභෝගිකයා සඳහා මිල ද සඳහන් කළ යුතුය.
පර්යන්ත උපකරණ හැර වෙනත් ඕනෑම විදුලි සංදේශ උපකරණයක් පද්ධතියට සම්බන්ධ කිරීම.

ඉ) ජාල කළමනාකරණය පිළිබඳ විස්තර සහ සමස්ත ජාල කාර්යක්ෂමතාව ප්‍රශස්ත කිරීම සඳහා යොදා ගත යුතු ප්‍රතිපත්ති.

ඊ) මෙහෙයුම් ආරම්භ කිරීමට අපේක්ෂිත දිනය, ක්‍රියාත්මක කිරීමේ කාලසටහන සහ වර්ධන සැලැස්ම.

2.9.1.2. යෝජිත සේවාවන් පිළිබඳ විස්තරය

අ) යෝජිත එක් එක් සේවා/වෙළඳපොල කොටසේ සවිස්තරාත්මක විස්තරයඃ
ආ) දැනටමත් ක්‍රියාත්මක වන පිටවීමේ සේවා සහ අපේක්ෂිත කර්මාන්ත බලපෑම් සහිතව හරස් ප්‍රත්‍යාස්ථතා විශ්ලේෂණය ඃ
ඇ) ගිණුම් වෙන් කිරීමේ හැකියාව (සේවා 1කට වඩා වැඩි නම්)ඃ
ඈ) සේවා ලබා ගැනීමේ හැකියාව, ප්‍රවේශ්‍යතාව, රඳවා ගැනීමේ හැකියාව සහ අඛණ්ඩතාව සම්බන්ධයෙන් සේවා ගුණාත්මකභාවය පිළිබඳ පරාමිතීන්ඃ
ඉ) පාරිභෝගිකයා සඳහා යෝජිත සේවා මට්ටමේ ගිවිසුමඃ
ඊ) ඉලක්කගත පාරිභෝගික පදනමඃ
උ) විශ්වීය සේවා වගකීම් සහ හදිසි සේවා සැපයීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ගඃ
ඌ) මහජනතාවට ලබා දෙන නාමාවලි තොරතුරු සේවා පිළිබඳ විස්තර (අදාළ අවස්ථාවල දී)ඃ

2.9.2 මූල්‍ය යෝජනාව

2.9.2.1 යෝජිත ප්‍රාග්ධන සහ අරමුදල් සැලසුම්
මෙහෙයුම සඳහා යෝජිත ප්‍රාග්ධනය සහ අරමුදල් සැලසුම් පිළිබඳ විස්තර ඇතුළුවඃ

අ) අයිතිකරුවන්ගේ කොටස් සහ වගකීම් ඇතුළුව එහි යෝජිත ප්‍රාග්ධන ව්‍යුහය පිළිබඳ සවිස්තරාත්මක විස්තරයක්. ආරම්භක ණය කොටස් අනුපාතය 2.0ට වඩා අඩුවෙන් පවත්වා ගත යුතුය.
ආ) අරමුදල් මූලාශ්‍ර සහ එක් එක් මූලාශ්‍රවලින් ලැබෙන ප්‍රමාණයන් (හිමිකරුවන්ගේ කොටස්, ණය, සමාගම් කොටස් විකිණීම, ණයකර ආදිය).
ඇ) අරමුදල් සැපයීමේ කාලය.
ඈ) අවිනිශ්චිත අරමුදල් මූලාශ්‍ර සඳහා ප්‍රතිපාදන සැලසීම.
ඉ) ණය සහ ණයකර සඳහා ආපසු ගෙවීමේ නියමයන් සහ කාලසටහන.
ඊ) ව්‍යාපෘතියේ වට්ටම් සහිත ආපසු ගෙවීමේ කාලය සඳහා කාර්තුමය පදනමින් ප්‍රාග්ධන සහ මෙහෙයුම් වියදම් (Cap Ex සහ Op Ex) පුරෝකථනය.

උ). ඉහත අයිතම (අ) සිට (ඊ) සම්බන්ධයෙන් සමාගමේ අතීත කාර්ය සාධනය (අදාළ නම්).

අයදුම්කරු ව්‍යාපාරය සහතික කිරීම සඳහා අභිප්‍රාය ලිපි, ඇපකර ලිපි, මූල්‍ය සහ අරමුදල් සැලසුම් සහ ණය පහසුකම් වැනි අදාළ ලේඛනමය සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

2.9.2.2 යෝජිත මූල්‍ය හා ආයෝජන සැලැස්ම. ඉදිරි වසර 10 සඳහා යෝජිත මූල්‍ය සැලැස්මේ විස්තර සහ වට්ටම් සහිත ආපසු ගෙවීමේ කාලය වසර 10ට අඩු විය යුතුයඃ

අ) ප්‍රක්ෂේපිත ලාභ අලාභ ගිණුම්, ශේෂ පත්‍ර සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශ. ලාභ අලාභ ගිණුම්, ශේෂ පත්‍ර සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සකස් කළ යුතුය. වත්කම් ක්ෂයවීම් ප්‍රතිපත්ති, ග්‍රාහකයන්ගේ ප්‍රක්ෂේපන, මෙහෙයුම් වියදම්වල වාර්ෂික වෙනස්කම් යනාදී සියලු උපකල්පන පැහැදිලිව විස්තර කළ යුතුය.
ආ) මුදල් ප්‍රවාහය, අභ්‍යන්තර ප්‍රතිලාභ අනුපාතය (IRR), ආයෝජනයේ වට්ටම් සහිත ආපසු ගෙවීමේ කාලසීමාව ඇතුළු අදාළ මූල්‍ය ප්‍රමිතිකවල පුරෝකථනයන්. තවද, ශුද්ධ වර්තමාන අගය (NPV) පිළිබඳ විස්තර සඳහන් කළ යුතුය.
ඇ) යොදවා ඇති ප්‍රාග්ධනය මත ප්‍රතිලාභ, වත්කම් මත ප්‍රතිලාභ, මෙහෙයුම් ලාභ ආන්තිකය, ශුද්ධ ලාභ ආන්තිකය, ප්‍රාග්ධන ආයෝජන අනුපාතය, ජංගම අනුපාතය (ජංගම වත්කම්/ ජංගම වගකීම්), සහ ණය කොටස් අනුපාතය ඇතුළුව ප්‍රක්ෂේපිත මූල්‍ය අනුපාත. එක් එක් අනුපාතය ගණනය කිරීමේදී භාවිතා කරන සූත්‍රය ද සැපයිය යුතුය.
ඈ) ඉහත අයිතම (අ) සිට (ඇ) දක්වා සම්බන්ධයෙන් සමාගමේ අතීත කාර්ය සාධනය (අදාළ නම්)
ඉ) අවදානම් විශ්ලේෂණය/පාලනය සහ සීමාවන් සහ උපාය මාර්ග ඃ

1. වෙළඳපොල අවදානම්
2. ඇවර කිරීමේ අවදානම
3. බංකොලොත් වීමේ අවදානම

2.9.3. විකුණුම් සහ අලෙවිකරණය

(අ) එක් එක් භූගෝලීය ප්‍රදේශය තුළ අපේක්ෂිත ග්‍රාහක වර්ධනය සහ පවරා ගැනීම සඳහා යොදා ගන්නා උපාය මාර්ග සහ අයක්‍රම අවශ්‍යතා පිළිබඳ කෙටි විස්තරයක්.

(ආ) ව්‍යාපාරයේ සිරස් කොටස් සහ අලෙවිකරණ ක්‍රමවේද ඇතුළුව වෙළඳපොලේ ප්‍රධාන ඉලක්කය (උදා. තොග හෝ සිල්ලර, නේවාසික හෝ ව්‍යාපාර) ඇතුළුව සේවාවන්හි විස්තීර්ණ විකුණුම් සැලැස්ම. පුරෝකථනය කරන ලද වාර්ෂික විකුණුම් අයවැයේ වියදම් සහ විස්තර දැක්විය යුතුය.

(ඇ) අලෙවි නියෝජිත ජාලයේ විස්තරය සහ ක්‍රියාත්මක වන ප්‍රදේශ ඇතුළු ගිවිසුම් (වෙළෙඳ ගිවිසුම් අමුණා තිබිය යුතුය) (තිබේ නම්)

(ඈ) තෙවන පාර්ශ්වයන් වෙත ලබා දී ඇති එවැනි මෙහෙයුමක ඕනෑම කොටසක් පිළිබඳ විස්තර.

(ඉ) විදුලි සංදේශ වෙළෙඳපොළ තුළ සහ ඉන් පිටත සමාගමේ අනෙකුත් වෙළෙඳ කටයුතු සහ අයදුම්කරුවන් අතර හරස් සහනාධාර ලබා නොදීමට වග බලා ගැනීම:

- ★ තොග සහ සිල්ලර කටයුතු.
- ★ විදුලි සංදේශ සහ විදුලි සංදේශ නොවන ක්‍රියාකාරකම්.
- ★ විදුලි සංදේශ උපකරණ නිෂ්පාදනය හෝ සැපයීම.
- ★ වෙනත් විදුලි සංදේශ කටයුතු.

2.9.4. පාරිභෝගික සේවාව සහ ආරක්ෂණය

අ) පාරිභෝගිකයාට සපයන ලද පාරිභෝගික පරිශ්‍ර උපකරණ පිළිබඳ විස්තර:

ආ) පාරිභෝගික පරිශ්‍ර උපකරණ නඩත්තු කිරීම:

ඇ) පාරිභෝගිකයන් සමග පවත්නා සේවා මට්ටම් ගිවිසුම් විස්තර (පිටපතක් අමුණන්න):

ඈ) පැමිණිලි මෙහෙයවීමේ ක්‍රමවේදය/ අවම දෝෂ නිෂ්කාශන කාලය:

ඉ) බංකොලොත් භාවයට එරෙහිව පාරිභෝගික ආරක්ෂාව (රක්ෂණ ආවරණය ආදිය)

ඊ) සේවාවේ ගුණාත්මකභාවය පිළිබඳ පැමිණිලි මෙහෙයවීම:

උ) බිල්පත් නිරවද්‍යතාවය සහතික කිරීම

ඌ) නියමයන් සහ කොන්දේසිවල විනිවිදභාවය සහ සේවා ගාස්තු:

2.9.5 ආයතනික කළමනාකරණය

2.9.5.1 යෝජිත ආයතනික ව්‍යුහය

අ. සමාගමේ ආයතනික ව්‍යුහය, කාර්ය මණ්ඩලය සහ පුහුණුව ඇතුළුව එක් එක් අංශයේ විස්තර

ආ. ඉදිරි වසර 5 සඳහා තාක්ෂණික, විකුණුම් සහ අලෙවිකරණය, මූල්‍ය, නීතිමය සහ අනෙකුත් ජ්‍යෙෂ්ඨ, මධ්‍යම සහ කනිෂ්ඨ මට්ටම් සඳහා වාර්ෂිකව උත්පාදනය කරන නව රැකියා සංඛ්‍යාව.

ඇ. අවම වශයෙන් අධ්‍යාපනික සහ වෘත්තීය සුදුසුකම් සහ පසුගිය වසර දහය සඳහා වෘත්තීය ඉතිහාසය ලබා දෙමින් යෝජිත ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්ව කණ්ඩායම් සාමාජිකයින් පිළිබඳ කෙටි විස්තරයක්.

ඈ. අදාළ විදුලි සංදේශ ජාලය ස්ථාපිත කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා අදාළ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම් සාමාජිකයින්ගේ විශේෂ පළපුරුද්ද.

2.10. ප්‍රකාශය

අයදුම්කරු විසින් අයදුම්පත්‍රයේ සපයා ඇති තොරතුරු සහ අයදුම් පත්‍රය සමග ඉදිරිපත් කරන ලද ශක්‍යතා වාර්තාවේ සඳහන් තොරතුරු වල නිරවද්‍යතාවය සහතික කර S17-1-B අයදුම් පත්‍රයේ ප්‍රකාශය අත්සන් කිරීම අවශ්‍ය කෙරේ.

## 03. උපලේඛනය 2

අ කොටස : පහසුකම් පාදක බලපත්‍ර අලුත් කිරීම

3.1. 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ (සංශෝධිත) පනත ප්‍රකාරව නිකුත් කරන ලද පහසුකම් පාදක බලපත්‍ර අලුත් කිරීම සඳහා වූ මාර්ගෝපදේශ.

3.1.1 විදුලි සංදේශ ක්‍රමයක් ක්‍රියා කරවීම සහ විදුලි සංදේශ සේවාවක් සැපයීම පිණිස 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ (සංශෝධිත) පනතේ 17 වැනි වගන්තිය යටතේ නිකුත් කර ඇති පහසුකම් පාදක බලපත්‍රය අලුත් කිරීම සඳහා ඉල්ලුම් කිරීමට කැමති විදුලි සංදේශ ක්‍රියාකරුවන් සඳහා විදුලි සංදේශ සේවා ක්‍රියාත්මක කිරීම සඳහා උපලේඛන 2/ අ කොටස මගින් මාර්ගෝපදේශ සහ තොරතුරු සපයයි.

3.1.2 බලපත්‍රය කල් ඉකුත් වීමට මාස නමයකට පෙර අලුත් කිරීම සඳහා වන අයැදුම්පත ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතුය . කල් ඉකුත් වීමට මාස නමයකට පෙර අයදුම්පත ඉදිරිපත් නොකළහොත්, කොමිෂන් සභාව විසින් බලපත්‍රය අලුත් නොකරනු ඇත. S 17-2-A ආකෘති පත්‍රයේ දක්වා ඇති පරිදි නියමිත ලෙස සම්පූර්ණ කරන ලද අයදුම්පත පිරික්සුම් ලැයිස්තුව සහ අවශ්‍ය සියලුම ලියකියවිලි සමග ඉදිරිපත් කළ යුතුය. ඉදිරි වසර පහ සඳහා සංවර්ධන සැලැස්ම S17-2-A ආකෘති පත්‍රයේ 8 වැනි අයිතමයේ දක්වා ඇති පරිදි විස්තරාත්මකව ඉදිරිපත් කළ යුතුය.

3.1.3 නිසි පරිදි සම්පූර්ණ කරන ලද S-17-2-A අයදුම් පත්‍රය ඉදිරිපත් කිරීමෙන් පසු ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වෙත ගෙවිය යුතු රුපියල් 200,000/= ක අයදුම්පත් ක්‍රියාවලි ගාස්තුව ගෙවන ලෙස විදුලි සංදේශ ක්‍රියාකරු සමාගම වෙත දැනුම් දෙනු ලැබේ. මෙම බලපත්‍ර ගාස්තුව ආපසු නොගෙවනු ලබන අතර මෙහිදී අයදුම්කරුවෙකුගේ සාර්ථකත්වය, අසාර්ථකත්වය යන්න හෝ බලපත්‍ර ක්‍රියාවලිය නොසැලකේ.

3.1.4 ප්‍රකාශය අත්සන් කරන සමාගමේ බලයලත් නියෝජිතයා විසින් අයදුම්පත්‍රයේ සෑම පිටුවක්ම සහ අදාළ සියලුම ලියකියවිලි කෙටි අත්සනක් යොදා ආරම්භ කළ යුතුය. විද්‍යුත් ආකෘතියට අනුව අයදුම්පත්‍රය සහ අදාළ ලියකියවිලි ඉදිරිපත් කිරීම ද නිර්දේශ කරනු ලැබේ. ක්‍රියාවලි ගාස්තුව ගෙවන තෙක් කිසිදු අයදුම්පතක් සලකා බලනු නොලැබේ.

3.1.5 සම්පූර්ණ කරන ලද අයදුම්පතේ පිටපත් ක්‍රියාවලි ගාස්තුව ගෙවූ කුවිතාන්සිය සමග 'විදුලි සංදේශ පද්ධතිය අලුත් කිරීම සඳහා වන අයදුම්පත' වශයෙන් පැහැදිලිව සටහන් කර ඇති ලියුම් කවරයක බහා පහත ලිපිනයට ලැබෙන සේ ඉදිරිපත් කළ යුතුයඃ

අධ්‍යක්ෂ ජනරාල් ,
ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව,
අංක 276, ඇල්විටිගල මාවත , කොළඹ 08.
දුරකථන : +94-112689345
ෆැක්ස් : +94-112689341
විද්‍යුත් තැපැල : dgtsl@trc.gov.lk

3.1.6 අතිරේක ලේඛන, අවශ්‍ය නම්, එවැනි ලේඛන අයදුම්පත් භාර ගැනීමේ දින සිට දින 14ක් ඇතුළත ඉදිරිපත් කළ යුතුය.

3.1.7 තවද, ඕනෑම කරුණක් සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද තොරතුරු පැහැදිලි කර ගැනීම සඳහා අවස්ථාවක් ඉල්ලා සිටිය හැක.

3.1.8 පහත සඳහන් කරුණු යටතේ බලපත්‍රය අලුත් කිරීම සඳහා ක්‍රියාකරු සමාගම සුදුසුකම් නොලබයි.

අ. ගෙවිය යුතු කිසියම් මුදලක් නොගෙවන්නේ නම් සහ ගෙවීම් කල් ඉකුත් වී ඇති බව කොමිෂන් සභාව විසින් ක්‍රියාකරු සමාගමට දැනුම් දීමෙන් අනතුරුව දින 14ක කාලයක් ඇතුලත එම මුදල නොගෙවීම .

ආ. පනත ප්‍රකාරව කොමිෂන් සභාවේ නියෝග වලට අනුකුල වීමට ක්‍රියාකරු අපොහොසත් වන්නේ නම් සහ එම නියෝගය අභියාචනා ක්‍රියාදාමයට යටත් නොවේ නම් සහ එම අසාර්ථකත්වය ක්‍රියාකරුට ලිඛිතව දැනුම් දීමෙන් පසු මාස 3ක් ඇතුළත එම අසාර්ථකත්වය නිවැරදි නොකිරීම.

ඈ. එවැනි උල්ලංඝනයක් පිළිබඳ කොමිෂන් සභාව විසින් දැනුම් දීමෙන් පසු දින 14 කට වඩා වැඩි කාලයක් සඳහා පනත යටතේ බලාත්මක වන යම් රීතියකට හෝ රෙගුලාසියකට අනුකූල වීමට ක්‍රියාකරු අපොහොසත් වීම.

ඇ. ක්‍රියාකරුගේ ක්‍රියාවන් ජාතික ආරක්ෂාවට අහිතකර බලපෑමක් ඇති කිරීමට ඉඩ තිබීම.

ඉ. කොමිෂන් සභාවේ පූර්ව අනුමැතියකින් තොරව බලපත්‍රයේ වලංගු කාලය තුළ ක්‍රියාකරු සමාගම විසින් විදුලි සංදේශ පද්ධති බලපත්‍රය නිකුත් කර ඇති සමාගමේ හිමිකාරිත්වය, අර්ධ වශයෙන් හෝ සම්පූර්ණයෙන් කිසියම් පුද්ගලයෙකුට/ ආයතනයකට විකිණීම, බදු දීම හෝ පැවරීම.

ඊ. බලපත්‍රය නිකුත් කිරීම ක්‍රියාකරු විසින් සපයන ලද සාවද්‍ය හෝ සාවද්‍ය තොරතුරු මත පදනම් වී ඇති බව අනාවරණය වීම.

උ. පෙර බලපත්‍ර කාලසීමාව තුළ ක්‍රියාකරු සමාගම විසින් සේවා ආරම්භ කර නොමැතිවීම.

ඌ. සේවය ආරම්භ කිරීමෙන් පසු වසරක සේවා කාලයක් තුළ විදුලි සංදේශ ක්‍රියාකරු සමාගමට ගනුදෙනුකරුවන් සඳහා එක් දිනකට වඩා වැඩි කාලයක් 5 වතාවකට වඩා වැඩි වාර ගණනක් සේවය නොසැපයීම හෝ දින 7කට වඩා වැඩි කාලයක් නොකඩවා සේවය සැපයීමට නොහැකිවීම.

එ. කොමිෂන් සභාව විසින් ලිඛිතව එම අසාර්ථකත්වය පිළිබඳව දැනුම් දීමෙන් පසු මාස තුනකට වඩා වැඩි කාලයක් කොමිෂන් සභාවේ කිසියම් නියෝගයකට අනුකූල වීමට ක්‍රියාකරු අපොහොසත් වීම.

ඒ. බලපත්‍රලාභී පද්ධතියේ ක්‍රියාකාරිත්වය සඳහා අවශ්‍ය වෙනත් බලපත්‍රයක් ලබා ගැනීමට විදුලි සංදේශ ක්‍රියාකරු සමාගම අපොහොසත් වීම.

ඔ. බහු සේවා අවසර බලපත්‍ර කාණ්ඩයේ නම්, බලපත්‍රය අළුත් කරන අවස්ථාවේදී ආරම්භ නොකළ හෝ මාස 2 කට වඩා වැඩි කාලයක් අත්හිටුවා ඇති යම් සේවා අවසරයක් අලුත් කිරීමට ක්‍රියාකරු සමාගම සුදුසුකම් නොලැබීම.

3.1.9 ඉහත 3.1.8 ට අනුව නුසුදුස්සෙකු ලෙස පෙනී ගියහොත්, ක්‍රියාකරු සමාගමට ලිඛිතව ඒ බව දැනුම් දෙනු ලැබේ. එසේ සුදුසුකම් නොලබන බවට දැනුම් දුන් දින සිට දින 14ක කාලයක් ඇතුළත, ක්‍රියාකරු සමාගමට එසේ නුසුදුස්සෙකු නොවන බවට අදාළ සියලු සාක්ෂි සහිතව කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කළ හැකිය. එවැනි අවස්ථාවක බලපත්‍රය අලුත් කිරීමේ අවසන් තීරණයේ අයිතිය කොමිෂන් සභාව සතුය.

3.1.10 ක්‍රියාකරුට අදාළ සුදුසුකම් ඇති බව පෙනී ගියහොත්, බලපත්‍රය අලුත් කිරීම සඳහා අමාත්‍යවරයා වෙත නිර්දේශ කිරීමට කොමිෂන් සභාව තීරණය කරනු ඇත. කොමිෂන් සභාව විසින් ක්‍රියාකරු විසින් ඉදිරිපත් කරන ලද ඕනෑම සංවර්ධන සැලැස්මක් අනුමත කිරීම හෝ පෙර කාර්ය සාධනය සතුටුදායක නොවන්නේ නම් සහ/හෝ ඉදිරි වසර පහක කාලසීමාවට හෝ එහි කොටසකට සුදුසු යැයි කොමිෂන් සභාව සලකන වෙනත් නිර්ණායක ඇත්නම් කොමිෂන් සභාව බලපත්‍රය අලුත්කිරීම පිණිස අවම සුදුසුකමක් වශයෙන් නව ව්‍යාපෘති හඳුන්වාදීමේ ඉලක්ක නියම කළ හැකිය. කෙසේ වෙතත්, රට තුළ විදුලි සංදේශ සේවා සංවර්ධනය කිරීම පිණිස , බලපත්‍ර වලංගු කාල සීමාව තුළ කොමිෂන් සභාව විසින් අවශ්‍ය යැයි සලකන ඕනෑම වේලාවක නව ව්‍යාපෘති හඳුන්වාදීමේ ඉලක්ක රැසක් නියම කිරීමට කොමිෂන් සභාවට අයිතිය ඇත.

3.1.11 3.1.10 හි නියම කර ඇති පරිදි බලපත්‍රය අලුත් කිරීම සඳහා අවම සුදුසුකමක් ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වා ඇති එවැනි ව්‍යාපෘති ඉලක්ක හෝ සංවර්ධන සැලැස්මක් තිබේ නම්, කොමිෂන් සභාව විසින් ඒ බව ක්‍රියාකරු වෙත ලිඛිතව දැනුම් දෙනු ලබන අතර දින 14 ක කාලයක් තුළ විදුලි සංදේශ ක්‍රියාකරු සමාගම විසින් ගිවිසුම/ප්‍රකාශය එවිය යුතුය. බලපත්‍රය අලුත් කිරීම සඳහා අවම සුදුසුකමක් ලෙස පෙර අවස්ථා වලදී සහ/හෝ බලපත්‍ර කාල සීමාව තුළදී ක්‍රියාකරු විසින් ලබා දී ඇති එවැනි ඉලක්ක සපුරා නොමැති නම්, කොමිෂන් සභාව විසින් නියම කර ඇති නියමයන් සහ කොන්දේසි අනුව බැංකු ඇපකරයක ආකාරයෙන් කාර්ය සාධන බැඳුම්කරයක් අවශ්‍ය විය හැකිය.

3.1.12 ව්‍යාපෘති ඉලක්ක/ සංවර්ධන සැලැස්ම සහ /හෝ කාර්ය සාධන බැඳුම්කර (ඇත්නම්) එකඟතා /ගිවිසුම් ඉදිරිපත් කිරීමේදී, ක්‍රියාකරු සමාගම විසින් ඉන්වොයිසියේ සඳහන් දින සිට දින 30 ක කාලයක් ඇතුළත බලපත්‍ර ගාස්තුව ගෙවීම අවශ්‍ය වේ. ඉන්වොයිසියේ. නියමිත කාලය තුළ ගෙවීම් සිදු නොකළහොත්, විදුලි සංදේශ ක්‍රියාකරු සමාගම නුසුදුස්සෙකු වන අතර අලුත් කිරීමේ ක්‍රියාවලිය අවසන් කරනු ලැබේ.

3.1.13 නියමිත කාල සීමාව තුළ ගාස්තුව ගෙවීමේදී, බලපත්‍රය ලබාදීමට කොමිෂන් සභාව විෂය භාර අමාත්‍යවරයාට නිර්දේශ කරනු ඇත. තවද, කොමිෂන් සභාව මහජනතාවගේ දැනගැනීම සඳහා බලපත්‍රය නිල වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කරනු ඇත.

3.1.14 රහස්‍යමය සහ වාණිජමය වශයෙන් වැදගත් තොරතුරු හැර සමාගම පිළිබඳ සෙසු තොරතුරු අලුත් කිරීමේ ක්‍රියාවලියේ අවසාන අදියරේදී කොමිෂන් සභාව විසින් ප්‍රකාශයට පත් කරනු ඇත. එවැනි රහස්‍ය තොරතුරු සම්බන්ධයෙන් පැහැදිලිව සඳහන් කර වෙනම කවරයක බහා ඉදිරිපත් කරන ලෙස අයදුම්කරුවන්ගෙන් කාරුණිකව ඉල්ලා සිටිමු.

3.1.15 කෙසේ වෙතත්, බලපත්‍රලාභියා විසින් විදුලි සංදේශ සේවා සැපයීම සඳහා අවශ්‍ය අනෙකුත් සියලුම බලපත්‍ර/අනුමැතීන් ලබා ගැනීම තරයේ අවශ්‍ය වේ.

3.2 අයදුම්පත්‍රය

පෝරමය S17-2-A

පැහැදිලිකිරීමේ සටහන් (පෝරමය S17-2-A)

- මෙම අයදුම් පත්‍රය සම්පූර්ණ කිරීමට පෙර, අයදුම්කරුවන් බලපත්‍ර මාර්ගෝපදේශ 02 උපලේඛනය සම්පූර්ණයෙන්ම කියවිය යුතුය.

- සියලුම අයදුම්කරුවන් විසින් අයදුම් පත්‍රය සම්පූර්ණ කළ යුතුය (S17-2-A).

- අයදුම්පත සම්පූර්ණයෙන්ම මුද්‍රිතව හෝ ඉංග්‍රීසි භාෂාවෙන් නම් කැපිටල් අකුරෙන් සම්පූර්ණ කළ යුතුය. ඉල්ලා සිටින තොරතුරු යෝජිත විදුලි සංදේශ පද්ධතියට අදාළ නොවේ නම්, කරුණාකර අදාළ නොවේ යන්න ලියන්න.

- ඉල්ලුම් කරන ලද තොරතුරු සැපයීමට ලබා දී ඇති ඉඩ ප්‍රමාණවත් නොවේ නම් අයදුම්කරුවන් අමතර පිටු ඇමිණිය යුතුය. අමතර පිටු වල තොරතුරු පැහැදිලිව ඉදිරිපත් කළ යුතු අතර මෙම පෝරමයට අනුකූලව අංකගත කළ යුතුය. අමුණා ඇති පිටු A4 ප්‍රමාණයේ කඩදාසි මත මුද්‍රණය කළ යුතුය.

- අයදුම්කරුවන් විසින් අයදුම්පත්‍රයේ කිසියම් නිවැරදි කිරීමක් හෝ වෙනස් කිරීමක් සිදු කළ විටෙකදී දිනය සහ කෙටි අත්සන යෙදිය යුතුය.

- අයදුම්කරුවන් විසින් ඇමුණුම් සහ ව්‍යාපෘති ශක්‍යතා වාර්තාව ඇතුළුව අයදුම්පත්‍රයේ පිටපත් 3ක් පහත සඳහන් ලිපිනයට ලැබෙන සේ ඉදිරිපත් කිරීම අවශ්‍ය වේ.

අධ්‍යක්ෂ ජනරාල් ,
ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව ,
අංක 276, ඇල්විටිගල මාවත , කොළඹ 08.
දුරකථනः +94-112689345
ෆැක්ස්ः +94-112689341
විද්‍යුත් තැපැල : dgtsl@trc.gov.lk

**1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ (සංශෝධිත) පනතේ 17 වැනි වගන්තිය යටතේ පහසුකම් පාදක විදුලි සංදේශ පද්ධති බලපත්‍රය අලුත් කිරීම සඳහා වන ඉල්ලුම්පත්‍රය**

1 අයදුම්කරු සම්බන්ධ විස්තර : සමාගමේ බලයලත් නියෝජිතයා (අයදුම්කරු) විසින් පහත තොරතුරු සැපයිය යුතුයः

1.1. සම්පූර්ණ නම :

1.2. උපන් දිනය :

1.3. ජාතික හැඳුනුම්පත් අංකය /විදේශ ගුවන් ගමන් බලපත්‍ර අංකයः

1.4. පුරවැසිභාවය :
1.5. ලිපිනය (ස්ථිර): පදිංචි ලිපිනය:
1.6. දුරකථන අංකය : (ස්ථාවර ): (ජංගම):
1.7. ෆැක්ස් අංකය:
1.8. විද්‍යුත් තැපැල් ලිපිනය :
කරුණාකර පරීක්ෂා කර කොටුවේ ( ✓ සලකුණ ) යොදන්න
☐ අයදුම්කරුට අවසරලබාදීමේ අධ්‍යක්ෂ මණ්ඩල තීරණය

2. සමාගමේ විස්තර :
2.1 සමාගමේ ලියාපදිංචි නම :
2.2 සමාගම ලියාපදිංචි කිරීමේ අංකය :
2.3 සංස්ථාගත කිරීමේ දිනය:
2.4 ලියාපදිංචි ලිපිනය:
2.5 සමාගමේ නිල දුරකථන අංකය :
2.6 ෆැක්ස් අංකය :
2.7 විද්‍යුත් තැපැල් ලිපිනය :
2.8 සමාගමේ නිල වෙබ් අඩවිය:
2.9 මව් සමාගම් හෝ ආශ්‍රිත සමාගම්වල හිමිකාරිත්වය පැහැදිලිව සඳහන් කිරීම ඇතුළුව ආයතනික හෝ කොටස් හිමි ව්‍යුහය පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු:
2.10 පොදු සමාගමක් (මව් සමාගම ඇතුළුව) නම් පොදු ලැයිස්තුගත කිරීම් පිළිබඳ විස්තර :
2.11 ව්‍යාපාර ගිණුම පවත්වාගෙන යන බැංකුවේ නම සහ ඒ සම්බන්ධ තොරතුරු:
2.12 කොටස් ප්‍රාග්ධනය (කොටස් කාණ්ඩය, එක් එක් කොටස් කාණ්ඩයේ අංකය සහ කොටස් වටිනාකම)
2.13 කොළඹ කොටස් වෙළඳපොලේ ලැයිස්තුගත කර ඇත්නම් කොටස් කාණ්ඩයේ විස්තර සපයන්න :
2.14 හවුල්කාරිත්වයකදී, විස්තර සපයන්න :
2.15 අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ ප්‍රධාන කළමනාකරණ කණ්ඩායමේ සවිස්තරාත්මක සංයුතිය සහ අධ්‍යක්ෂවරුන්ගේ සුදුසුකම් සහ වෘත්තීය ඉතිහාසය, පුද්ගල කොටස් හිමිකම තිබේ නම් ඒවා පිළිබඳ විස්තර (කෙටි විස්තරයක් සැපයිය යුතුය):
2.16 අනෙකුත් නියෝජිතායතන සහ උපදේශකයින් වෙත ගිවිසුම්ගත කර ඇති ක්‍රියාකාරකම් ලැයිස්තුව:
2.17 සමාගමේ වෘත්තීය උපදේශකයින්ගේ ලැයිස්තුව : (තාක්ෂණ, නීති, මූල්‍ය, විගණන )
2.18 දැනට සමාගමක් හෝ අනුබද්ධිත ආයතනයක් සතු විදුලි සංදේශ පද්ධති බලපත්‍ර (දේශීය හෝ විදේශීය) පිළිබඳ විස්තර:
2.19 එවැනි බලපත්‍රයක් ප්‍රත්‍යාදිෂ්ට කිරීම හෝ බලයලත් ආයතනයක් විසින් අයදුම් කිරීම ප්‍රතික්ෂේප කිරීම පිළිබඳ විස්තර:

කරුණාකර පහත සඳහන් ලියකියවිලි අමුණන්න:
සාංගමික ව්‍යවස්ථාවලිය, ව්‍යාපාරය ලියාපදිංචි කිරීමේ සහතිකය, නවතම වාර්ෂික ප්‍රතිලාභ : 15 පෝරමය සහ සපයා ඇති ඉහත විස්තර සම්බන්ධ වෙනත් සහතික කිරීමේ ලියකියවිලි

3 කොටස්හිමියන් පිළිබඳ විස්තර :

සියලුම කොටස්හිමියන් පිළිබඳ විස්තර පහත සඳහන් ආකෘතිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතුය.

3.1 සම්පූර්ණ නම:
3.2 උපන් දිනය :
3.3 ජාතික හැඳුනුම්පත් අංකය / විදේශ ගුවන් ගමන් බලපත්‍ර අංකය:
3.4 පුරවැසිභාවය :
3.5 ලිපිනය (ස්ථිර ): පදිංචිය :
3.6 දුරකථන අංකය : (ස්ථාවර ): ජංගම :
3.7 ෆැක්ස් අංකය:
3.8 විද්‍යුත් තැපැල් ලිපිනය :
3.9 කොටස් ප්‍රතිශතය:
3.10 කොටස් නිකුත් කළ දිනය : (කොටස් පිළිබඳ සහතිකපත්‍රය ඇමිණිය යුතුය)
3.11 ඈවර කිරීමට ගොස් ඇති කලින් අයිති සමාගම්වල විස්තර:
3.12 විදුලි සංදේශ බලපත්‍රයක් ලබා ගැනීම සඳහා කලින් අයිති සමාගමක් විසින් ඉදිරිපත් කරන ලද ඕනෑම රටක බලයලත් ආයතනයක් විසින් ප්‍රතික්ෂේප කරන ලද ඕනෑම අයදුම්පතක් පිළිබඳ විස්තර:

3.13 ඕනෑම රටක බලයලත් ආයතනයක් විසින් අවලංගු කරන ලද, සමාගමක් සතුව පැවති ඕනෑම විදුලි සංදේශ බලපත්‍රයක් පිළිබඳ විස්තරඃ

3.14 වෙනත් ඕනෑම ව්‍යාපාරික අවශ්‍යතාඃ

3.15 පෙර බලපත්‍ර කාල සීමාව තුළ කොටස් හිමියාගේ ව්‍යුහය/විස්තර වෙනස් වී තිබේදඃ (ඔව්/නැත)

3.16 'ඔව්' නම්, නිසි කරුණු දැක්වීමක් සහිතව කොටස් හිමියන් වෙනස් කිරීමට හේතුව පිළිබඳ සවිස්තරාත්මක විස්තරයක් සපයන්නඃ

3.17 පෙර බලපත්‍ර කාල සීමාව තුළ ආයතන ව්‍යුහයේ යම් වෙනසක් සිදුවී තිබේදඃ (ඔව්/නැත)

3.18 'ඔව්' නම් කරුණාකර වත්මන් සහ පෙර ආයතනික ව්‍යුහය පිළිබඳ සවිස්තරාත්මක විස්තරයක් අදාළ කරුණු සහිතව සපයන්නඃ

3.19 පෙර බලපත්‍ර කාලසීමාව තුළ අධ්‍යක්ෂ මණ්ඩලයේ යම් වෙනසක් සිදුවී ඇතිද යන වගඃ (ඔව්/නැත)

3.20 'ඔව්' නම් කරුණාකර වත්මන් සහ පෙර අධ්‍යක්ෂවරුන් පිළිබඳ සවිස්තරාත්මක විස්තරයක් සපයන්න (සංක්ෂිප්ත සාරාංශයක්) ඃ

3.21 බලපත්‍රය ප්‍රකාරව සපයනු ලබන සියලුම සේවා වර්ග (තිරස් සහ සිරස් ඇතුළුව) පිළිබඳ සවිස්තරාත්මක විස්තරයක් සපයන්නඃ

3.22 4.1 හි විස්තර කර ඇති සියලුම සේවා වර්ග සඳහා වෙනම ගිණුම් පවත්වාගෙන ගොස් තිබේද ඃ (ඔව්/නැත)

3.23 'නැති' නම් හේතු දක්වන්න ඃ

**4 සමාගමේ අතීත කාර්ය සාධනය පිළිබඳ විශ්ලේෂණය ඃ**

4.1 කරුණාකර පෙර බලපත්‍රයේ බලයලත් සේවාවන්හි තත්ත්වය සහ කාර්ය සාධනය විස්තර කරන්නඃ

| *අංකය* | *අවසරලත් සේවාව* | *ආරම්භක දිනය* | *ආවරණ ප්‍රදේශය* | *ග්‍රාහකයන් සංඛ්‍යාව* |
|---|---|---|---|---|
| | | | | |

4.2 කරුණාකර පසුගිය වසර පහ සඳහා එක් එක් සේවාවේ පහත දැක්වෙන කරුණු ප්‍රස්ථාරික නිරූපණයක් ආධාරයෙන් ඉදිරිපත් කරන්න ඃ

අ) විකුණුම් ආදායම
ආ) විකුණුම් පිරිවැය
ඇ) දළ ලාභය Gross
ඈ) ශුද්ධ ලාභය
ඉ) පොලී, බදු, ක්ෂයවීම් සහ ක්ෂයවීම් වලට පෙර ඉපැයීම් (EBITDA)
ඊ) වත්කම්
උ) වගකීම්
ඌ) අයිතිකරුවන්ගේ කොටස්
එ) වත්මන් අනුපාතය
ඒ) ණය / කොටස් අනුපාතය
ඔ) වත්කම් මත ප්‍රතිලාභ
ඕ) මාසික දායකත්ව වර්ධනය
ක) පාරිභෝගිකයින් සේවාවකට දායක වීම නැවැත්වීමේ අනුපාතය සහ හේතු
ග) භාවිත කරන මිනිත්තු ප්‍රමාණයේ වර්ධනය ඃ
ජ) එක් පරිහරණය කරන්නෙකුගේ සාමාන්‍ය ආදායමේ (ARPU) වර්ධනය

4.3. හඳුනාගත් අවදානම් සහ සීමාවන් සහ භාවිත කරන පාලන උපාය මාර්ග

4.3.1. වෙළඳපල අවදානම
4.3.2. ද්‍රවශීලතා අවදානම
4.3.3. බංකොලොත්වීමේ අවදානම

4.4. බලපත්‍රයේ කාලය තුළ සමාගමේ ආර්ථික කාර්යක්ෂමතාව විශ්ලේෂණයඃ

4.4.1. වෙන් කිරීමේ කාර්යක්ෂමතාවය
4.4.2. ගතික කාර්යක්ෂමතාවය
4.4.3. x -කාර්යක්ෂමතාවය
4.4.4. නිෂ්පාදන කාර්යක්ෂමතාවය

4.5. අභ්‍යන්තර කාර්ය සාධන විශ්ලේෂණය (Ansof, Botson Box හෝ ඕනෑම ප්‍රශස්ත ක්‍රමයක්)

4.5.1. බාහිර කාර්ය සාධන විශ්ලේෂණය (PESTLE, Porters 5 Forces, 8KF විශ්ලේෂණය හෝ වඩා ප්‍රශස්ත ක්‍රමයක්)
4.5.2. සේවාව ක්‍රියාත්මක කිරීම සහ සැපයීම සම්බන්ධයෙන් 3වන පාර්ශව සමඟ කිසියම් ගිවිසුම් තිබේද (ඔව්/නැත)
4.5.3. 'ඔව්' නම් කරුණාකර එම සියලුම ගිවිසුම්වල පිටපත් ඉදිරිපත් කරන්න ඃ

**5. ඊළඟ බලපත්‍ර කාල සීමාව සඳහා සමාගමේ ප්‍රක්ෂේපිත කාර්ය සාධනය**

5.1 පොදු

අ) නිසි කරුණු දැක්වීමක් සහිතව ව්‍යාපාරයේ කිසියම් පුළුල් කිරීමක් / විශේෂාංගීකරණයක් කර තිබේද? ඔව් /නැත
ආ) 'ඔව්' නම් කරුණාකර පුළුල් කිරීමේ සැලැස්ම සපයන්නඃ
ඇ) වත්කම් ක්ෂයකිරීම සහ හිලව් කිරීම මෙන්ම ප්‍රතිස්ථාපනය සහ වැඩිදියුණු කිරීමේ සැලසුම් ඃ

5.2. යෝජිත ව්‍යාපාරවල අවදානම් සහ යෝජනා කරන ලද උපාය මාර්ග

අ) වෙළෙඳපොළ
ආ) ද්‍රවශීලතාව
ඇ) බංකොලොත්භාවය

5.3. ඉදිරි වසර 5/10 සඳහා පහත විස්තර ඉදිරිපත් කළ යුතු අතර අරමුදල් පිළිබඳ සාක්ෂි සමඟ වට්ටම් කළ ආපසු ගෙවීමේ කාලය වසර 5/10 ට අඩු විය යුතුය (අදාළ නම්)ඃ

අ) ආයෝජන සහ අරමුදල් මූලාශ්‍රඃ
ආ) හදිසි අරමුදල් සැලසුම්ඃ
ඇ) ඊළඟ බලපත්‍ර කාල සීමාව ආරම්භයේදී ණය / කොටස් අනුපාතයඃ
ඈ) යෝජිත මූල්‍ය සැලැස්මේ විස්තරඃ

(අ.) ප්‍රක්ෂේපිත ලාභ අලාභ ගිණුම්, ශේෂ පත්‍ර සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශ. ලාභ අලාභ ගිණුම්, ශේෂ පත්‍ර සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සකස් කළ යුතුය. වත්කම් ක්ෂයවීම් ප්‍රතිපත්ති, ග්‍රාහකයන්ගේ පුරෝකථන, මෙහෙයුම් වියදම්වල වාර්ෂික වෙනස්කම් යනාදී සියලු උපකල්පන පැහැදිලි කළ යුතුය.

(ආ.) මුදල් ප්‍රවාහය, අභ්‍යන්තර ප්‍රතිලාභ අනුපාතය (IRR), ආයෝජනයේ වට්ටම් සහිත ආපසු ගෙවීමේ කාලසීමාව ඇතුළු අදාළ මූල්‍ය ප්‍රමිතිවල පුරෝකථනයන්. තවද, ශුද්ධ වර්තමාන අගය (NPV) විස්තර දැක්විය යුතුය. ව්‍යාපෘතිය ලාභදායී වීම සඳහා අපේක්ෂිත කාල රාමුව පැහැදිලිව දැක්විය යුතුය (අදාළ නම්).

(ඇ.) යොදවා ඇති ප්‍රාග්ධනය මත ප්‍රතිලාභ, වත්කම් මත ප්‍රතිලාභ, මෙහෙයුම් ලාභ ආන්තිකය, ශුද්ධ ලාභ ආන්තිකය, ප්‍රාග්ධන ආයෝජන අනුපාතය, ජංගම අනුපාතය, සහ ණය කොටස් අනුපාතය ඇතුළුව ප්‍රක්ෂේපිත මූල්‍ය අනුපාත. එක් එක් අනුපාතය ගණනය කිරීමේදී භාවිතා කරන සූත්‍රය ද සැපයිය යුතුය.

**6. පාරිභෝගික සේවා සහ ආරක්ෂාව පිළිබඳ යෝජිත වැඩිදියුණු කිරීම්**

අ) පාරිභෝගිකයාට සපයන ලද පාරිභෝගික පරිශ්‍ර උපකරණ පිළිබඳ විස්තරඃ

ආ) පාරිභෝගික පරිශ්‍ර උපකරණ නඩත්තු කිරීමඃ

ඇ) පාරිභෝගිකයන් සමග ඇති කරගත් සේවා මට්ටමේ ගිවිසුම් විස්තරඃ

ඈ) පැමිණිලි හැසිරවීමේ ක්‍රමවේදය/ අවම දෝෂ නිෂ්කාශන කාලයඃ

ඉ) බංකොලොත් භාවයට එරෙහිව පාරිභෝගික ආරක්ෂාව (රක්ෂණ ආවරණය ආදිය)ඃ

ඊ) සේවා තත්ත්වය පිළිබඳ පැමිණිලි මෙහෙයවීමඃ

උ) බිල්පත් නිරවද්‍යතාවය සහතික කිරීමඃ

ඌ) සේවා අයකුම සහ සේවා කොන්දේසිවල විනිවිදභාවයඃ

**7. නව සේවා හඳුන්වාදීමේ පූර්ව ඉලක්ක**

අවසරලත් සෑම සේවාවක් සඳහාම ආවරණය, ධාරිතාව සහ ආයෝජනය සම්බන්ධයෙන් පහත ආකෘතිය ප්‍රකාරව පූර්ව බලපත්‍ර කාල සීමාව තුළ සාක්ෂාත් කර ගත් වාර්ෂිකව නව සේවා හඳුන්වාදීමේ ඉලක්ක ඉදිරිපත් කරන්න.

නව සේවා හඳුන්වාදීමේ විස්තර (පූර්ව) - සේවා

| වර්ෂය | දිස්ත්‍රික්කයේ නම | PoP සංඛ්‍යාව | PoP සම්බන්ධී-කරණය | ධාරිතාවය | භාවිතා කරන ලද තාක්ෂණය | කරන ලද ආයෝජන | සේවාව | ජනගහණ ආවරණය | සමස්ථ සක්‍රීය දායකත්වය | තනි සක්‍රීය දායකත්වය | ග්‍රාහකත්වය නැවැත්වීමේ අනුපාතය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |
| | | | | | | | | | | | |

අයදුම්කරු විසින් ඉහත වගුවේ දක්වා ඇති තොරතුරු ප්‍රකාරව සඳහන් කර ඇති තොරතුරු සමග ආවරණ සිතියම් (මෘදු පිටපත) සැපයිය යුතුය.

**8. ඉදිරි කාල සීමාව සඳහා යෝජිත නව සේවා හඳුන්වාදීමේ ඉලක්ක**

අවසරලත් එක් එක් සේවාව සඳහා ආවරණය, ධාරිතාව සහ ආයෝජනය හෝ කිසියම් විශේෂ අවශ්‍යතාවයක් සම්බන්ධයෙන් පහත ආකෘතිය ප්‍රකාරව මීළඟ බලපත්‍ර කාල සීමාව තුළ සාක්ෂාත් කර ගැනීමට යෝජිත වාර්ෂික නව සේවා හඳුන්වාදීමේ ඉලක්ක ඉදිරිපත් කරන්න. කොමිෂන් සභාව විසින් නව සේවා හඳුන්වාදීමේ අවසන් ඉලක්ක සහ අවශ්‍ය සහතිකය තීරණය කරනු ඇත.

නව සේවා හඳුන්වාදීමේ විස්තර (යෝජිත ) - සේවා

| වර්ෂය | දිස්ත්‍රික්කයේ නම | PoP සංඛ්‍යාව | PoP සම්බන්ධී-කරණය | ධාරිතාවය | භාවිතා කළ තාක්ෂණය | කරන ලද ආයෝජනය | සේවාව | ජනගහණ ආවරණය | සමස්ථ සක්‍රීය දායකත්වය | තනි සක්‍රීය දායකත්වය | ග්‍රාහකත්වය නැවැත්වීමේ අනුපාතය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |
| | | | | | | | | | | | |

අයදුම්කරු විසින් ඉහත වගුවේ දක්වා ඇති තොරතුරු ප්‍රකාරව සඳහන් කර ඇති තොරතුරු සමඟ ආවරණ සිතියම් (මෘදු පිටපත) සැපයිය යුතුය.

9. **සවිස්තරාත්මක වර්තමාන ජාල රූප සටහන :**
පහත සඳහන් කරුණු ඇතුළත් වෙනම වාර්තාවක් ඉදිරිපත් කළ යුතුය.

අ Core/Backbone (ස්විච් ස්ථාන ඇතුළුව), Backhaul (මාර්ග), ප්‍රවේශය/ඔප්ටිකල් මාර්ග ආරක්ෂණය (OLP), ජාල දෙකක් හෝ කිහිපයක් අතර භෞතික පිහිටීම, අන්තර් සම්බන්ධතා ලක්ෂ්‍ය සහ විදුලි සංදේශ පද්ධති නිර්වචනයට අයත් වෙනත් ඕනෑම සංරචකයන් ඇතුළුව සවිස්තරාත්මක ජාල රූප සටහන.

ආ එක් එක් කොටසෙහි ජාල රූප සටහන සමග සාක්ෂාත් කර ගත් වේගය සහ ධාරිතාව සඳහන් කර අදාළ සම්ප්‍රේෂණ මාධ්‍ය සමග එක් එක් කොටසෙහි භාවිතා වන සියලුම තාක්ෂණයන් පිළිබඳව කරුණු සහිතව ඉදිරිපත් කළ යුතුය. අදාළ කොටස් පුළුල් පරාස සැපයුම්කරුවන් අතර හුවමාරු කර ගැනීමේ අනුපාතය පිළිබඳ විස්තර සපයන්න.

ඇ. ස්ථාපන ප්‍රමිති ඇතුළු එක් එක් ජාල කොටස්වලට අනුකූල ජාල තාක්ෂණ ප්‍රමිති පිළිබඳ විස්තර සපයන්න .

ඈ. බිල්පත් ක්‍රමය, අනුගමනය කරන ලද බිල්පත් ප්‍රමිතීන් සහ බිල්පත් පද්ධතියේ නිරවද්‍යතාවය ඔප්පු කිරීමට ගන්නා පියවර ඉදිරිපත් කරන්න.

ඉ. ඉදිරි වසර පහ සඳහා භූගෝලීය ජාල ආවරණය සහ වාර්ෂික ව්‍යාප්ති සැලැස්ම පිළිබඳ සවිස්තරාත්මක සිතියම සපයන්න.

ඊ. සේවා සැපයීමෙහි ලා තෙවන පාර්ශ්වයෙන් කිසියම් යටිතල පහසුකමක් බද්දට ගැනීම, කුලියට ගැනීම.

උ. තෙවන පාර්ශවයක් සඳහා කිසියම් යටිතල පහසුකමක් බදු දීම, කුළියට දීම.

10. **ප්‍රකාශය**

............................................................ වන මම මෙම අයදුම් පත්‍රයේ සහ ශක්‍යතා වාර්තාවේ සපයා ඇති සියලුම තොරතුරු සත්‍ය සහ නිවැරදි බව මෙයින් සහතික කරමි. 1996 අංක 27 දරන පනතින් සංශෝධිත 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත ප්‍රකාරව කොමිෂන් සභාව විසින් සාදන ලද සියලුම රීති, විධිවිධාන, තීරණ සහ බලපත්‍රයේ සියලුම විධිවිධාන සහ නියමයන් සහ කොන්දේසිවලට අවනත බව මෙයින් ප්‍රතිඥා දෙමි. බලපත්‍රය අවලංගු කිරීමේ කොටසේ දක්වා ඇති ඕනෑම කොන්දේසියක් උල්ලංඝනය කරමින් වැරදි තොරතුරු මත පදනම්ව බලපත්‍රයක් නිකුත් කර ඇති බව පෙනී ගියහොත් බලපත්‍රය අවලංගු කිරීමට මගේ විරුද්ධත්වයක් නැත.

සමාගමේ බලයලත් නියෝජිකයාගේ අත්සන : ..........................

දිනය :....................

උපලේඛනය 2/ ආ කොටස : සේවා පාදක විදුලි සංදේශ ක්‍රියාකරු බලපත්‍ර අළුත් කිරීම

3.3 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ (සංශෝධිත) පනත ප්‍රකාරව නිකුත් කරන ලද සේවා පාදක බලපත්‍ර අළුත් කිරීම සඳහා මාර්ගෝපදේශ :

3.3.1 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ සංශෝධිත පනතේ 17 වැනි වගන්තිය යටතේ නිකුත් කරන ලද සේවා පාදක බලපත්‍රය අලුත් කිරීම සඳහා ඉල්ලුම් කිරීමට අපේක්ෂා කරන විදුලි සංදේශ ක්‍රියාකරුවන්ට විදුලි සංදේශ පද්ධතියක් ක්‍රියාත්මක කිරීම සහ විදුලි සංදේශ සේවා සැපයීම පිණිස මෙම කොටස මාර්ගෝපදේශ සහ තොරතුරු සපයයි.

3.3.2 බලපත්‍රය කල් ඉකුත් වීමට මාස නමයකට පෙර අලුත් කිරීමේ අයදුම්පත ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතුය. S17-2-B ආකෘති පත්‍රයේ දක්වා ඇති පරිදි නියමිත පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත පිරික්සුම් ලැයිස්තුව සහ අවශ්‍ය සියලුම ලියකියවිලි සමග ඉදිරිපත් කළ යුතුය.

3.3.3 නිසි පරිදි සම්පූර්ණ කරන ලද S17-2-B අයදුම් පත්‍රය ඉදිරිපත් කිරීමෙන් පසු ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වෙත ගෙවිය යුතු රුපියල් 200,000/= ක අයදුම්පත් ක්‍රියාවලි ගාස්තුව ගෙවන ලෙස ක්‍රියාකරු සමාගමට දැනුම් දෙනු ලැබේ. ක්‍රියාවලි ගාස්තුව ආපසු නොගෙවනු ලබන අතර බලපත්‍ර ක්‍රියාවලියේදී අයදුම්කරුවෙකුගේ සාර්ථකත්වය හෝ අසාර්ථකත්වය මෙහි දී සැළකිල්ලට නොගනී.

3.3.4 ප්‍රකාශය අත්සන් කරන සමාගමේ බලයලත් නියෝජිතයා විසින් අයදුම්පත්‍රයේ සෑම පිටුවක්ම සහ අදාළ සියලුම ලියකියවිලි සිය කෙටි අත්සන යොදා ආරම්භ කළ යුතුය. මීට අමතරව අයදුම්පත සහ වෙනත් වාර්තා/ ලියකියවිලි ඉලෙක්ට්‍රොනික ආකෘතියෙන් ද ඉදිරිපත් කළ හැකිවේ. ක්‍රියාවලි ගාස්තුව ගෙවන තෙක් කිසිදු අයදුම්පතක් සලකා බලනු නොලැබේ.

3.3.5 සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රයේ පිටපත් සහ වෙනත් අමතර වාර්තා /ලියකියවිලි සමග ක්‍රියාවලි ගාස්තු කුවිතාන්සිය 'විදුලි සංදේශ පද්ධති බලපත්‍රය අලුත් කිරීම සඳහා වන අයදුම්පත' ලෙස පැහැදිළිව සටහන් කළ ලියුම් කවරයක බහා පහත ලිපිනයට ලැබෙන සේ ඉදිරිපත් කළ යුතුයඃ

අධ්‍යක්ෂ ජනරාල් ,
ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව ,
අංක 276, ඇල්විටිගල මාවත, කොළඹ 08.
දුරකථනඃ +94-112689345
ෆැක්ස්ඃ +94-112689341
විද්‍යුත් තැපෑල : dgtsl@trc.gov.lk

3.3.6 අතිරේක ලියකියවිලි, අවශ්‍ය නම්, එවැනි ලියකියවිලි අයදුම්පත භාරගත් දින සිට දින 14ක් ඇතුළත ඉදිරිපත් කළ යුතුය.

3.3.7 තවද, ඕනෑම කරුණක් සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද තොරතුරු පැහැදිලි කර ගැනීම සඳහා අවස්ථාවක් ඉල්ලා සිටිය හැක.

3.3.8 පහත සඳහන් කරුණු යටතේ බලපත්‍රය අලුත් කිරීම සඳහා ක්‍රියාකරු සමාගම සුදුසුකම් නොලබයි.

අ) ගෙවිය යුතු කිසියම් මුදලක් නොගෙවන්නේ නම් සහ ගෙවීම් කල් ඉකුත් වී ඇති බව කොමිෂන් සභාව විසින් විදුලි සංදේශ ක්‍රියාකරුට දැනුම් දීමෙන් පසු දින 14ක කාලයක් ගතවීත් එම මුදල නොගෙවීම.

ආ) පනත ප්‍රකාරව කොමිෂන් සභාවේ නියෝගයක් පිළිපැදීමට ක්‍රියාකරු සමාගම අපොහොසත් වීම සහ එම නියෝගය අභියාචනා ක්‍රියාවලියට යටත් නොවීම මෙන්ම කොමිෂන් සභාව විසින් එම අසාර්ථකත්වය ක්‍රියාකරු සමාගම වෙත ලිඛිතව දැනුම් දී මාස 3ක් ඇතුළත එය නිවැරදි නොකිරීම;

ඇ) පනත යටතේ දැනට ක්‍රියාත්මක වන යම් රීතියකට හෝ රෙගුලාසියකට අනුකූල වීමට ; එවැනි උල්ලංඝනයන් පිළිබඳ කොමිෂන් සභාව විසින් දැනුම් දීමෙන් පසු දින 14කට වඩා වැඩි කාලයක් ගතවීත් ක්‍රියාකරු සමාගම අපොහොසත් වීම.

ඈ) ක්‍රියාකරුගේ ක්‍රියාවන් ජාතික ආරක්ෂාවට අහිතකර බලපෑමක් ඇති කිරීමට ඉඩ තිබීම;

ඉ) විදුලි සංදේශ පද්ධති බලපත්‍රය නිකුත් කර ඇති සමාගමේ අයිතිය ක්‍රියාකරු විසින් කොමිෂන් සභාවේ පූර්ව අනුමැතියකින් තොරව බලපත්‍රයේ වලංගු කාල සීමාව තුළ කිසියම් පුද්ගලයෙකුට/ ආයතනයකට අර්ධ වශයෙන් හෝ සම්පූර්ණයෙන් විකිණීම, බදු දීම හෝ පැවරීම සිදුකිරීම;

ඊ) ක්‍රියාකරු විසින් සපයන ලද සාවද්‍ය හෝ වැරදි තොරතුරු මත පදනම් වී බලපත්‍රය නිකුත් කර ඇති බව පෙනී යාම.

උ) පෙර බලපත්‍ර කාලය තුළ ක්‍රියාකරු සමාගම සේවා සැපයීම ආරම්භ කර නොතිබීම.

ඌ) සේවාව ආරම්භ කිරීමෙන් පසු අඛණ්ඩව දින 7කට වඩා වැඩි කාලයක් හෝ වසරක් ඇතුළත 5 වතාවකට වඩා දිනකට වඩා වැඩි කාලයක් සේවා සැපයීමට ක්‍රියාකරු සමාගමට නොහැකි වීම.

එ) කොමිෂන් සභාව විසින් ලිඛිතව එම අසාර්ථකත්වය පිළිබඳව දැනුම් දීමෙන් පසු මාස තුනකට වඩා වැඩි කාලයක් කොමිෂන් සභාවේ කිසියම් නියෝගයකට අනුකූල වීමට දූරකථන ක්‍රියාකරු සමාගම අපොහොසත් වීම.

ඒ) බලපත්‍රලාභී පද්ධතියේ ක්‍රියාකාරිත්වය සඳහා අවශ්‍ය වෙනත් බලපත්‍රයක් ලබාගැනීම ක්‍රියාකරු සමාගම අපොහොසත් වීම.

ඔ) බහු සේවා අවසර බලපත්‍ර කාණ්ඩයේ නම්, බලපත්‍රය අලුත් කරන අවස්ථාවේ දී ආරම්භ කර නොමැති හෝ මාස 2කට වැඩි කාලයක් සේවාව අත්හිටුවා තිබූ යම් සේවා අවසරයක් අලුත් කිරීමට ක්‍රියාකරු සමාගම සුදුසුකම් නොලබයි.

3.3.9 ඉහත 3.3.8 ප්‍රකාර නුසුදුස්සෙක් නම්, විදුලි සංදේශ ක්‍රියාකරු සමාගමට ඒ බව ලිඛිතව දැනුම් දෙනු ලැබේ. එලෙස නුසුදුසු බවට දැනගත් දින සිට දින 14 ක කාලයක් ඇතුළත, එකී අපොහොසත් වීමට වැරදිකරු නොවන බවට විදුලි සංදේශ ක්‍රියාකරු සමාගම විසින් අදාළ සියලු සාක්ෂි සහිතව කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කළ හැකිය. එවැනි අවස්ථාවක බලපත්‍රය අලුත් කිරීමේ අවසන් තීරණය කොමිෂන් සභාව සතුවේ.

3.3.10 ක්‍රියාකරු සමාගම සුදුසුකම් ලබා ඇති බව පෙනී ගියහොත්, බලපත්‍රය අලුත් කිරීම සඳහා අමාත්‍යවරයා වෙත නිර්දේශ කිරීමට කොමිෂන් සභාව තීරණය කරනු ඇත. කෙසේ වෙතත්, බලපත්‍රය අලුත් කිරීම සඳහා අවසරය ලබාදීමේ අවම කාරණයක් ලෙස බලපත්‍රය අලුත් කරන අවස්ථාවේදී හෝ විශේෂ නියාමන කරුණු යටතේ බලපත්‍රයේ වලංගු කාල සීමාව තුළ ඕනෑම අවස්ථාවක නව සේවා ඉලක්ක/සංවර්ධන සැලැස්ම සකස් කිරීමේ අයිතිය කොමිෂන් සභාව සතුවේ.

3.3.11 ක්‍රියාකරු සමාගම විසින් බලපත්‍ර ගාස්තුව ගෙවීම අවශ්‍ය වන අතර ඉන්වොයිසිය නිකුත් කළ දින සිට දින 30ක කාලයක් ඇතුළත එම ගාස්තුව ගෙවිය යුතුය. නියමිත කාලය තුළ ගෙවීම් සිදු නොකළහොත්, එම ක්‍රියාකරු සමාගම නුසුදුස්සෙකු වන අතර බලපත්‍රය අලුත් කිරීමේ ක්‍රියාවලිය අවසන් කරනු ලැබේ.

3.3.12 නියමිත කාල සීමාව තුළ ගාස්තුව ගෙවූ පසුව , බලපත්‍රය ලබාදීමට කොමිෂන් සභාව විෂය භාර අමාත්‍යවරයාට නිර්දේශ කරනු ඇත. තවද, කොමිෂන් සභාව මහජනතාවගේ දැනගැනීම සඳහා සිය නිල වෙබ් අඩවියේ බලපත්‍රය ප්‍රසිද්ධ කරනු ඇත.

3.3.13 බලපත්‍රය අලුත් කිරීමේ ක්‍රියාවලියේ අවසන් අදියරේ දී රහස්‍යමය සහ වාණිජමය වශයෙන් වැදගත් තොරතුරු හැර සමාගම පිළිබඳ තොරතුරු කොමිෂන් සභාව විසින් ප්‍රකාශයට පත් කරනු ඇත. එවැනි රහස්‍ය තොරතුරු පැහැදිලිව සඳහන් කර වෙනම ආවරණයක බහා ඉදිරිපත් කරන ලෙස අයදුම්කරුවන්ගෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.

3.3.14 කෙසේ වෙතත්, බලපත්‍රලාභියා විසින් විදුලි සංදේශ සේවා සැපයීම සඳහා අවශ්‍ය අනෙකුත් සියලුම බලපත්‍ර/අනුමැතීන් ලබා ගැනීම තරයේ අවශ්‍ය වේ.

3.4 අයැදුම්පත

S17-2-B පෝර්මය

පැහැදිලි කිරීමේ සටහන් (S17-2-B පෝර්මය)

- මෙම අයැදුම්පත සම්පූර්ණ කිරීමට පෙර, අයදුම්කරුවන් විසින් බලපත්‍ර මාර්ගෝපදේශ 02 උපලේඛනය ආ සම්පූර්ණයෙන්ම කියවිය යුතුය.
- සියලුම අයැදුම්කරුවන් විසින් අයැදුම්පත (S17-2-B). සම්පූර්ණ කළ යුතුය.
- අයැදුම්පත සම්පූර්ණයෙන්ම මුද්‍රිතව හෝ ඉංග්‍රීසි භාෂාවෙන් නම් කැපිටල් අකුරින් සම්පූර්ණ කළ යුතුය. ඉල්ලා සිටින තොරතුරු යෝජිත විදුලි සංදේශ පද්ධතියට අදාළ නොවේ නම්, කරුණාකර අදාළ නොවේ යන්න ලියන්න.
- ඉල්ලුම් කරන ලද තොරතුරු සැපයීමට ලබා දී ඇති ඉඩ ප්‍රමාණවත් නොවේ නම් අයදුම්කරුවන් අමතර පිටු ඇමිණිය යුතුය. අමතර පිටුවල තොරතුරු පැහැදිලිව ඉදිරිපත් කළ යුතු අතර මෙම පෝරමයට අනුකූලව අංකගත කළ යුතුය. අමුණා ඇති පිටු A4 ප්‍රමාණයේ කඩදාසි මත මුද්‍රණය කළ යුතුය.

- අයදුම්කරුවන් විසින් අයදුම්පත්‍රයේ කිසියම් නිවැරදි කිරීමක් හෝ වෙනස් කිරීමක් සිදු කළ විටෙකදී කෙටි අත්සන සහ දිනය යෙදිය යුතුය.
- අයදුම්කරුවන් විසින් ඇමුණුම් සහ ව්‍යාපෘති ශක්‍යතා වාර්තාවක් ඇතුළුව අයදුම්පත්‍රයේ පිටපත් 3ක් පහත සඳහන් ලිපිනයට ලැබෙන සේ ඉදිරිපත් කළ යුතු වේ.

අධ්‍යක්ෂ ජනරාල්,
ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව,
අංක 276, ඇල්විටිගල මාවත, කොළඹ 08.
දුරකථන : +94-112689345
ෆැක්ස් : +94-112689341
විද්‍යුත් තැපෑල : dgtsl@trc.gov.lk

**1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ (සංශෝධිත) පනතේ 17 වැනි වගන්තිය ප්‍රකාරව විදුලි සංදේශ පද්ධති බලපත්‍රය (සේවා පාදක කරගත්) අලුත් කිරීම සඳහා වන ඉල්ලුම් පත්‍රය**

1. **අයදුම්කරුගේ විස්තර** : සමාගමේ බලයලත් නියෝජිතයා (අයදුම්කරු) විසින් පහත තොරතුරු සැපයිය යුතුය:

1.1. සම්පූර්ණ නම :
1.2. උපන් දිනය :
1.3. ජාතික හැඳුනුම්පත් අංකය/විදේශ ගුවන් ගමන් බලපත්‍ර අංකය:
1.4. පුරවැසිභාවය :
1.5. ලිපිනය (ස්ථිර): පදිංචිය:
1.6. දුරකථන අංකය: (ස්ථාවර ): ජංගම:
1.7. ෆැක්ස් අංකය:
1.8. විද්‍යුත් තැපැල් ලිපිනය:

කරුණාකර පරීක්ෂා කර කොටුවේ ( ✓ සලකුණ ) යොදන්න

☐ අයදුම්කරුට අවසරලබාදීමේ අධ්‍යක්ෂ මණ්ඩල තීරණය

**2. සමාගමේ විස්තර :**

2.1. සමාගමේ ලියාපදිංචි නම:
2.2. සමාගමේ ලියාපදිංචි අංකය :
2.3. සංස්ථාගත කිරීමේ දිනය :
2.4. ලියාපදිංචි ලිපිනය:
2.5. සමාගමේ නිල දුරකථන අංකය:
2.6. ෆැක්ස් අංකය :
2.7. විද්‍යුත් තැපැල් ලිපිනය:
2.8. සමාගමේ නිල වෙබ් අඩවිය:
2.9 ආයතනික හා කොටස් හිමි ව්‍යුහය ඇතුළු මව් සමාගම් හෝ හිමිකාරිත්වය පැහැදිලිව පෙන්නුම් කරන ආශ්‍රිත සමාගම්වල සම්බන්ධතාවය පිළිබඳ විස්තර:
2.10 පොදු සමාගමක් (මව් සමාගමක් ඇතුළුව) නම් පොදු ලැයිස්තුගත කිරීම් පිළිබඳ විස්තර:
2.11 ව්‍යාපාර ගිණුම පවත්වාගෙන යන බැංකුවේ නම සහ ඇමතුම් තොරතුරු:
2.12 කොටස් ප්‍රාග්ධනය (කොටස් කාණ්ඩය, එක් එක් කොටස් කාණ්ඩයේ අංකය සහ කොටස් වටිනාකම)
2.13 කොළඹ කොටස් වෙළඳපොලේ ලැයිස්තුගත කර ඇත්නම් කොටස් කාණ්ඩයේ විස්තර සපයන්න:
2.14 හවුල්කාරිත්වයකදී, විස්තර සපයන්න:
2.15 අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ ප්‍රධාන කළමනාකරණ කණ්ඩායමේ සවිස්තරාත්මක සංයුතිය සහ අධ්‍යක්ෂවරුන්ගේ වෘත්තීමය ඉතිහාසය සමග පුද්ගල කොටස් හිමිකම තිබේනම්, ඒ පිළිබඳ විස්තර (කෙටි විස්තරයක් ඇමිණිය යුතුය):
2.16 වෙනත් ආයතන සහ උපදේශකයින් වෙත ගිවිසුම්ගත කර ඇති ක්‍රියාකාරකම් ලැයිස්තුව:
2.17 සමාගමේ වෘත්තීය උපදේශකයින්ගේ ලැයිස්තුව: (තාක්ෂණික, නීතිමය, මුල්‍ය, විගණක)

2.18 දැනට සමාගම හෝ අනුබද්ධිත ආයතනයක් සතු විදුලි සංදේශ පද්ධති බලපත්‍ර (දේශීය හෝ විදේශීය) පිළිබඳ විස්තරඃ

2.19 එවැනි බලපත්‍රයක් ප්‍රත්‍යාදිෂ්ට කිරීම හෝ බලයලත් ආයතනයක් විසින් අයදුම්කිරීම ප්‍රතික්ෂේප කිරීම පිළිබඳ විස්තරඃ

*කරුණාකර පහත සඳහන් ලියකියවිලි අමුණන්නඃ*

සමාගමේ ව්‍යවස්ථාවලිය, සංස්ථාගත කිරීමේ සහතිකය, නව වාර්ෂික ප්‍රතිලාභ ඃ 15 පෝර්මය සහ සපයා ඇති ඉහත විස්තර සම්බන්ධයෙන් වෙනත් සනාථ කිරීමේ ලියකියවිලි.

**3. කොටස් හිමියන් පිළිබඳ විස්තර ඃ**

සියලුම කොටස් හිමියන් පිළිබඳ විස්තර .

3.1. සම්පූර්ණ නම ඃ

3.2. උපන් දිනය ඃ

3.3. ජාතික හැඳුනුම්පත් අංකය /විදේශ ගුවන් ගමන් බලපත්‍ර අංකය ඃ

3.4. පුරවැසිභාවය ඃ

3.5. ලිපිනය (ස්ථිර)ඃ පදිංචිය ඃ

3.6. දුරකථන අංකය ඃ (ස්ථාවර)ඃ ජංගම ඃ

3.7. ෆැක්ස් අංකය ඃ

3.8. විද්‍යුත් තැපැල් ලිපිනයඃ

3.9. කොටස් ප්‍රතිශතයඃ

3.10. කොටස් නිකුත් කළ දිනයඃ

(කොටස් සහතික ඇමිණිය යුතුය)

3.11. ඈවර කිරීමට ගොස් ඇති කලින් අයිති සමාගම්වල විස්තරඃ

3.12. කිසියම් රටක බලයලත් ආයතනයක් විසින් ප්‍රතික්ෂේප කරන ලද කලින් අයිති සමාගමක් විසින් ඉදිරිපත් කරන ලද විදුලි සංදේශ බලපත්‍රය සඳහා වන ඕනෑම අයදුම්පතක් පිළිබඳ විස්තරඃ

3.13. කිසියම් රටක බලයලත් ආයතනයක් විසින් ප්‍රතික්ෂේප කරන ලද සමාගමක් විසින් ඉදිරිපත් කරන ලද විදුලි සංදේශ බලපත්‍රය සඳහා වන සියලුම අයැදුම්පත් පිළිබඳ විස්තරඃ

3.14. වෙනත් ඕනෑම ව්‍යාපාරික අවශ්‍යතා ඃ

3.15 පෙර බලපත්‍රයේ කාල සීමාව තුළ කොටස් හිමියාගේ ව්‍යුහය/විස්තර වෙනස් වී තිබේද? ඃ (**ඔව්/නැත**).

3.16 'ඔව්' නම්, කොටස් හිමියන් වෙනස් කිරීමට හේතුව පිළිබඳ සවිස්තරාත්මක විස්තරයක් නිසි කරුණු සහිතව ඉදිරිපත් කරන්නඃ

3.17 පෙර බලපත්‍රයේ කාලසීමාව තුළ සංවිධාන ව්‍යුහයේ කිසියම් වෙනසක් සිදුවී තිබේද? ඃ (ඔව් /නැත)

3.18 'ඔව්' නම් කරුණාකර වත්මන් සහ පෙර ආයතනික ව්‍යුහය පිළිබඳ සවිස්තරාත්මක විස්තරයක් කරුණු සහිතව ඉදිරිපත් කරන්න ඃ

3.19 පෙර බලපත්‍ර කාලසීමාව තුළ අධ්‍යක්ෂ මණ්ඩලයේ යම් වෙනසක් සිදුවී ඇත්නම්ඃ ඃ (**ඔව්/නැත**)

3.20 'ඔව්' නම් කරුණාකර වත්මන් සහ පෙර අධ්‍යක්ෂවරුන් පිළිබඳ සවිස්තරාත්මක විස්තරයක් සපයන්න (සංක්ෂිප්ත සාරාංශය)ඃ

3.21 බලපත්‍රයට අනුව (තිරස් සහ සිරස් ඇතුළුව) සපයනු ලබන සියලුම වර්ගයේ සේවාවන් පිළිබඳ සවිස්තරාත්මක විස්තරයක් සපයන්නඃ

3.22 7 හි විස්තර කර ඇති සියලුම වර්ගයේ සේවාවන් සඳහා වෙනම ගිණුම් පවත්වාගෙන ගොස් තිබේදඃ (**ඔව්/නැත**)

3.23 'නැත' නම් හේතු දක්වන්න ඃ

**4. සමාගමේ අතීත කාර්ය සාධනය පිළිබඳ විශ්ලේෂණය :**

4.1. කරුණාකර පෙර බලපත්‍රයේ අවසරලත් සේවාවන්හි තත්ත්වය සහ කාර්ය සාධනය විස්තර කරන්න :

| අංකය | බලයලත් සේවාව | ආරම්භ කරන දිනය | ආවරණ ප්‍රදේශය (එක් එක් දිස්ත්‍රික්කයේ භෞතික පිහිටීම සහ සිතියම) | ග්‍රාහකයන් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| | | | | |

4.2. කරුණාකර එක් එක් සේවාව සඳහා පසුගිය වසර පහත සඳහන් කරුණු සම්බන්ධ සංඛ්‍යාලේඛන කරුණු සහිතව ප්‍රස්ථාර නිරූපණය ආධාරයෙන් ඉදිරිපත් කරන්න.

(අ) අලෙවි ආදායම :
(ආ) විකුණුම් පිරිවැය :
(ඇ) දළ ලාභය :
(ඈ) ශුද්ධ ලාභය :
(ඉ) EBITDA (පොලිය, බදු , ක්ෂයවීම් , ණය හිලව් කිරීම යනාදියට පෙර ඉපැයීම් :
(ඊ) වත්කම් :
(උ) වගකීම් :
(ඌ) හිමිකරුවන්ගේ සම කොටස් :
(එ) ජංගම අනුපාතය :
(ඒ) ණය/සම කොටස් අනුපාතය :
(ඔ) වත්කම් මත ප්‍රතිලාභ :
(ඕ) මාසික දායකත්ව වර්ධනය :
(ක) පාරිභෝගිකයා සේවා දායකත්වය නතර කිරීමේ වාර්ෂික ප්‍රතිශත අනුපාතය හේතු සහිතව :
(ග) භාවිතයේ මිනිත්තු වර්ධනය :
(ජ) පාරිභෝගිකයෙකුගේ සාමාන්‍ය ආදායමේ වර්ධනය :

4.3. හඳුනාගත් අවදානම් සහ සීමාවන් සහ භාවිතා කරන පාලන උපාය මාර්ග

4.3.1. වෙළඳපල අවදානම්
4.3.2. ද්‍රවශීලතා අවදානම්
4.3.3. බංකොලොත්වීමේ අවදානම්

4.4. සේවාව ක්‍රියාත්මක කිරීම සහ සැපයීම සම්බන්ධයෙන් 3 වන පාර්ශවයන් සමඟ යම් ගිවිසුම් තිබේද (ඔව්/නැත)

4.5. 'ඔව්' නම් කරුණාකර එවැනි ගිවිසුම් සියල්ලේ පිටපත් ඉදිරිපත් කරන්න:

**5. ඊළඟ බලපත්‍ර කාල සීමාව සඳහා සමාගමේ ප්‍රක්ෂේපිත කාර්ය සාධනය.**

5.1. ඊළඟ බලපත්‍ර කාලසීමාව සඳහා කාර්ය සැලසුම්/ඉලක්ක විස්තරාත්මකව පැහැදිලි කරන්න.

5.2. ව්‍යාපාරයේ කිසියම් පුළුල් කිරීමක්/ විවිධාංගීකරණයක් තිබේද? ඔව් /නැත

5.3. 'ඔව්' නම් කරුණාකර සවිස්තරාත්මක ව්‍යාප්ති සැලැස්මක් ඉදිරිපත් කරන්න:

5.4. කරුණාකර පසුගිය ඇගයුම් කරුණු සංසන්දනය කරමින් මීළඟ කාල සීමාව සඳහා ඉලක්ක කාර්ය සාධනය විස්තර කරන්න.

5.5. වත්කම් ක්ෂය කිරීම සහ හිලව් කිරීම සහ ප්‍රතිස්ථාපන සහ වැඩිදියුණු කිරීම් සඳහා සැලසුම් (අදාළ නම්)ඃ

5.6. යෝජිත ව්‍යාපාරවල අවදානම් සහ යෝජනා කරන ලද උපාය මාර්ග

(අ) වෙළඳපල
(ආ) ද්‍රවශීලතාවය
(ඇ) බංකොලොත්භාවය

5.7. ඉදිරි වසර 10 සඳහා පහත විස්තර අරමුදල් පිළිබඳ තහවුරු කිරීම් සහිතව ඉදිරිපත් කළ යුතු අතර වට්ටම් කළ ආපසු ගෙවීමේ කාලය වසර 10කට වඩා අඩු විය යුතුය (අදාළ නම්)ඃ

(අ) ආයෝජන සහ අරමුදල් මූලාශ්‍ර ඃ
(ආ) හදිසි අරමුදල් සැලසුම් ඃ
(ඇ) මීළඟ බලපත්‍ර කාල සීමාව ආරම්භයේදී ණය / කොටස් අනුපාතය ඃ
(ඈ) යෝජිත මූල්‍ය සැලැසුම් පිළිබඳ විස්තර ඃ

i) ප්‍රක්ෂේපිත ලාභ අලාභ ගිණුම්, ශේෂ පත්‍ර සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශ. ලාභ අලාභ ගිණුම්. ශේෂ පත්‍ර සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සකස් කළ යුතුය. වත්කම් ක්ෂයවීම් ප්‍රතිපත්ති, ග්‍රාහකයන්ගේ ප්‍රක්ෂේපන, මෙහෙයුම් වියදම්වල වාර්ෂික වෙනස්කම් යනාදී සියලු උපකල්පන පැහැදිලිව දැක්විය යුතුය.

ii) මුදල් ප්‍රවාහය, අභ්‍යන්තර ප්‍රතිලාභ අනුපාතිකය (IRR), ආයෝජනයේ වට්ටම් සහිත ආපසු ගෙවීමේ කාලසීමාව ඇතුළු අදාළ මූල්‍ය ප්‍රමිති පිළිබඳ පුරෝකථන . තවද, ශුද්ධ වර්තමාන අගය (NPV) පිළිබඳ විස්තර සඳහන් කළ යුතුය. ව්‍යාපෘතිය ලාභදායී වීම සඳහා අපේක්ෂිත කාල රාමුව පැහැදිලිව දැක්විය යුතුය (අදාළ නම්).

iii) සේවයේ යොදවා ඇති ප්‍රාග්ධනය මත ප්‍රතිලාභ, වත්කම් මත ප්‍රතිලාභ, මෙහෙයුම් ලාභ ආන්තිකය, ශුද්ධ ලාභ ආන්තිකය, ප්‍රාග්ධන ආයෝජන අනුපාතය, වත්මන් අනුපාතය සහ ණය කොටස් අනුපාතය ඇතුළුව ප්‍රක්ෂේපිත මූල්‍ය අනුපාත. එක් එක් අනුපාතය ගණනය කිරීමේදී භාවිතා කරන සූත්‍රය ද සැපයිය යුතුය.

**6. පාරිභෝගික සේවා සහ ආරක්ෂාව පිළිබඳ යෝජිත වැඩිදියුණු කිරීම්**

(අ) පාරිභෝගිකයාට සපයන ලද පාරිභෝගික පරිශ්‍ර උපකරණ පිළිබඳ විස්තරඃ
(ආ) පාරිභෝගික පරිශ්‍ර උපකරණ නඩත්තු කිරීමඃ
(ඇ) පාරිභෝගිකයන් සමඟ පවත්නා සේවා මට්ටමේ ගිවිසුම් විස්තරඃ
(ඈ) පැමිණිලි මෙහෙයවීමේ ක්‍රමවේදය/ අවම දෝෂ නිෂ්කාශන කාලයඃ
(ඉ) බංකොලොත් භාවයට එරෙහිව පාරිභෝගික ආරක්ෂාව (රක්ෂණ ආවරණ යනාදිය)
(ඊ) සේවා තත්ත්වය පිළිබඳ පැමිණිලි මෙහෙයවීමඃ
(උ) බිල්පත් නිරවද්‍යතාවය සහතික කිරීම
(ඌ) කොන්දේසි සහ සේවා ගාස්තුවල විනිවිදභාවය

**7. පූර්ව මූල්‍ය බැඳීම් (ඇත්නම්) සහ එවැනි මූල්‍යමය බැඳීම් සඳහා ගිවිසුම් සම්බන්ධයෙන් සාක්ෂි විස්තර කරන්න.**

**8. පවතින ජාල විස්තරඃ**

වත්මන් ජාල ආකෘතිය සම්බන්ධයෙන් පහත සඳහන් දෑ අඩංගු වෙනම වාර්තාවක් ඉදිරිපත් කළ යුතුයඃ

(අ) Core/Backbone (ස්විචවල ස්ථාන ඇතුළුව), Backhaul (මාර්ග), ප්‍රවේශය/ ඔප්ටිකල් මාර්ග ආරක්ෂණය (OLP), ජාල දෙකක් හෝ කිහිපයක් අතර භෞතික පිහිටීම, ප්‍රවේශය ඇතුළු අන්තර් සම්බන්ධතා ලක්ෂ්‍ය සහ විදුලි සංදේශ පද්ධති නිර්වචනයට ඇතුළත් වන වෙනත් ඕනෑම සංරචක ඇතුළත් විස්තරාත්මක ජාල රූප සටහන, විස්තර සහ ගිවිසුම් වර්ගය ඇතුළුව සහ පද්ධතියේ එක් එක් ජාල සංරචක සපයන සියලුම පහසුකම් පාදක ක්‍රියාකරුවන් (FBO) සම්බන්ධ විස්තර සහ ගිවිසුම් වර්ග සහ එම පහසුකම් සැපයීම සඳහා එකඟ වූ ලිපි සහ සිල්ලර/තොග අයකුම පැහැදිලි කළ යුතුය.

(ආ) පහසුකම් පාදක ක්‍රියාකරුගේ (FBO) අනුමැතිය සහිතව ජාල රූප සටහන සහ සාක්ෂාත් ගත් වේගය සහ ධාරිතාව සඳහන් කරන්න.

(ඇ) යොදා ගත් බිල්පත් ක්‍රමය, බිල්පත් ප්‍රමිතීන් සහ බිල්පත් පද්ධතියේ නිරවද්‍යතාවය ඔප්පු කිරීමේ පියවර.

**9. ප්‍රකාශය**

............................................................ වන මම මෙම අයදුම් පත්‍රයේ සහ ශක්‍යතා වාර්තාවේ සපයා ඇති සියලුම තොරතුරු සත්‍ය සහ නිවැරදි බව මෙයින් සහතික කරමි. 1996 අංක 27 දරන පනතින් සංශෝධිත 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත ප්‍රකාරව කොමිෂන් සභාව විසින් සාදන ලද සියලුම රීති, විධිවිධාන, තීරණ සහ බලපත්‍රයේ සියලුම විධිවිධාන සහ නියමයන් සහ කොන්දේසි වලට අවනත බව මෙයින් ප්‍රතිඥා දෙමි. බලපත්‍රය ප්‍රත්‍යාදිෂ්ට කිරීමේ කොටසේ දක්වා ඇති ඕනෑම කොන්දේසියක් උල්ලංඝනය කරමින් වැරදි තොරතුරු මත පදනම්ව බලපත්‍රයක් නිකුත් කර ඇති බව පෙනී ගියහොත් බලපත්‍රය ප්‍රත්‍යාදිෂ්ට කිරීමට මගේ විරුද්ධත්වයක් නැත.

සමාගමේ බලයලත් නියෝජිතයාගේ අත්සන : ...........................

දිනය :.....................

## 4. උපලේඛනය 3

4.1. විදුලි සංදේශ පද්ධතියක් ක්‍රියාත්මක කරන සමාගමේ හිමිකාරිත්වය පැවරීම සඳහා කොමිෂන් සභාවේ පූර්ව අනුමැතිය ලබා ගැනීමේ ක්‍රියා පටිපාටිය:

විදුලි සංදේශ පද්ධතියක් ක්‍රියාත්මක කිරීම සහ විදුලි සංදේශ සේවා සැපයීම පිණිස 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ සංශෝධිත පනතේ 17 වැනි වගන්තිය ප්‍රකාරව නිකුත් කරන ලද විදුලි සංදේශ පද්ධති බලපත්‍රයක් හිමි සමාගමක හිමිකාරිත්වය පැවරීම සඳහා කොමිෂන් සභාවේ පූර්ව අනුමැතිය ලබා ගැනීම පිණිස මෙම වගන්තිය මගින් මාර්ගෝපදේශ සහ ක්‍රියා පටිපාටි සපයයි.

i. බලපත්‍රයේ මුල් ප්‍රදානයේ සිට පළමු වසර තුනක කාලය තුළ සමාගමේ හිමිකාරිත්වය පැවරීමට විදුලි සංදේශ ක්‍රියාකරු සමාගමක් සුදුසුකම් නොලබයි.

ii. ඉහත අයිතම 4.1 (i) අනුව සුදුසුකම් ලබා ඇති ක්‍රියාකරුවෙකු විසින් හිමිකාරිත්වය පැවරීමට කැමති නම්, අදාළ සියලුම ලියකියවිලි සමග නිසි පරිදි පිරවූ S17-3 අයැදුම්පත මූලිකවම ඉදිරිපත් කළ යුතුය.

iii. කොමිෂන් සභාව විසින් හිමිකාරිත්වය පැවරීමේ අවශ්‍යතාවය නිසි ලෙස සලකා බලනු ඇති අතර කොමිෂන් සභාව එසේ පැවරීමට තීරණය කරන්නේ නම්, අයදුම්පත අනුමැතිය සඳහා ආරක්ෂක අමාත්‍යාංශයට සහ අනෙකුත් අදාළ ආයතන වෙත යොමු කරනු ලැබේ. එලෙස අනුමැතිය ලැබෙන්නේ නම්, කොමිෂන් සභාව විසින් නියම කර ඇති නිර්ණායක මත පදනම්ව හිමිකාරත්වය පැවරීම අනුමත කළ හැකි අතර, එම පැවරීමේ ඉදිරි ක්‍රියාමාර්ගය සඳහා බලපත්‍රලාභියාට අනුමැතිය ලබාදීමේ ලිපියක් නිකුත් කරනු ඇත. කෙසේ වෙතත්, අයිතිය පැවරීමේ අනුමැතිය සම්බන්ධයෙන් කොමිෂන් සභාවේ තීරණය අවසාන තීරණය වේ.

iv. බලපත්‍රලාභියා විසින් ලිඛිතව එකඟතාව ප්‍රකාශ කළ යුතු අතර කොමිෂන් සභාව අවශ්‍ය යැයි සලකන ඕනෑම අංශයක් සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් අමතර කොන්දේසි පැනවිය හැක.

v. නියාමන අවශ්‍යතාවය මත කිසියම් ඉල්ලීමක් ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය කොමිෂන් සභාව සතු වේ. (ඇත්නම්)

**4.2. අයැදුම්පත**

S17-3

**1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතේ 17 වැනි වගන්තිය ප්‍රකාරව නිකුත් කරන ලද විදුලි සංදේශ පද්ධති බලපත්‍රය හිමි සමාගමක හිමිකාරිත්වය පැවරීම අනුමත කිරීම සඳහා වන ඉල්ලුම් පත්‍රය**

1. අයදුම්කරු සම්බන්ධ විස්තර : පහත සඳහන් තොරතුරු සමාගමක බලයලත් නියෝජිතයකු (අයදුම්කරු) විසින් සැපයිය යුතුය:

1.1. සම්පූර්ණ නම:
1.2. උපන් දිනය :
1.3. ජාතික හැඳුනුම්පත් අංකය /විදේශ ගුවන් ගමන් බලපත්‍ර අංකය :
1.4. පුරවැසිභාවය :
1.5. ලිපිනය (ස්ථිර ): පදිංචිය :
1.6. දුරකථන අංකය : (ස්ථාවර ): ජංගම :
1.7. ෆැක්ස් අංකය :
1.8. විද්‍යුත් තැපැල් ලිපිනය :

*කරුණාකර පරීක්ෂාකර පහත සඳහන් කොටුවේ ( ✓ ලකුණ ) යොදන්න*

☐ අයදුම්කරුට අවසර ලබාදීමේ අධ්‍යක්ෂ මණ්ඩල තීරණය

2. **සමාගමේ වර්තමාන විස්තර :**

2.1. සමාගමේ ලියාපදිංචි නම :
2.2. සමාගමේ ලියාපදිංචි අංකය :
2.3. සංස්ථාගත කිරීමේ දිනය :
2.4. ලියාපදිංචි ලිපිනය :
2.5. සමාගමේ නිල දුරකථන අංකය:
2.6. ෆැක්ස් අංකය :
2.7. විද්‍යුත් තැපැල් ලිපිනය:
2.8. සමාගමේ නිල වෙබ් අඩවිය :
2.9. ව්‍යාපාර ගිණුම පවත්වාගෙන යන බැංකුවේ නම සහ සම්බන්ධතා තොරතුරු:
2.10 කොටස් ප්‍රාග්ධනය (කොටස් කාණ්ඩය, එක් එක් කොටස් කාණ්ඩයේ අංකය සහ කොටස් වටිනාකම)
2.11 කොළඹ කොටස් වෙළඳපොලේ ලැයිස්තුගත කර ඇත්නම් කොටස් කාණ්ඩයේ විස්තර සපයන්න :
2.12 හවුල්කාරිත්වයකදී, විස්තර සපයන්න:
2.13 වත්මන් අධ්‍යක්ෂවරුන්ගේ සුදුසුකම් සහ වෘත්තීය ඉතිහාසය (විධිමත් ලේඛනයක් ඇමිණිය යුතුය):
2.14 වෙනත් ආයතන සහ උපදේශකයින් වෙත ගිවිසුම්ගත කර ඇති ක්‍රියාකාරකම් ලැයිස්තුව:
2.15 සමාගමේ වත්මන් වෘත්තීය උපදේශකයින්ගේ ලැයිස්තුව: (තාක්ෂණික, නීති, මූල්‍ය, විගණන)
2.16 දැනට සමාගමක් හෝ අනුබද්ධිත ආයතනයක් සතු විදුලි සංදේශ පද්ධති බලපත්‍ර (දේශීය හෝ විදේශීය) පිළිබඳ විස්තර:

3. **වර්තමාන කොටස් හිමිකරුවන්ගේ විස්තර :**
පහත සඳහන් ආකෘතිය ප්‍රකාරව සියලුම කොටස් හිමිකරුවන්ගේ විස්තර ඉදිරිපත් කළ යුතුය.

3.1 සම්පූර්ණ නම:
3.2 උපන් දිනය:
3.3 ජාතික හැඳුනුම්පත් අංකය / ගුවන් ගමන් බලපත්‍ර අංකය:
3.4 පුරවැසිභාවය :
3.5 ලිපිනය (ස්ථිර) : පදිංචිය :
3.6 දුරකථන අංකය : (ස්ථාවර ): ජංගම :
3.7 ෆැක්ස් අංකය :

3.8 විද්‍යුත් තැපැල් ලිපිනය :
3.9 කොටස් ප්‍රතිශතය :
3.10 කොටස් නිකුත් කළ දිනය :
(කොටස් සහතික ඇමිණිය යුතුය)
3.11 ඇවර කිරීමට ගොස් ඇති කලින් අයිති සමාගම්වල විස්තරඃ
3.12 කිසියම් රටක බලයලත් ආයතනයක් විසින් ප්‍රතික්ෂේප කරන ලද සමාගමක් විසින් ඉදිරිපත් කරන ලද විදුලි සංදේශ බලපත්‍රය සඳහා වන සියලුම අයැදුම්පත් පිළිබඳ විස්තර :
3.13 ඕනෑම රටක බලයලත් ආයතනයක් විසින් ප්‍රත්‍යාදිෂ්ට කරන ලද සමාගම සතුව පැවති සියලුම විදුලි සංදේශ බලපත්‍ර පිළිබඳ විස්තරඃ
3.14 වෙනත් සියලුම ව්‍යාපාරික අවශ්‍යතා :

කරුණාකර පහත විස්තර අමුණන්න :
සාංගමික ව්‍යවස්ථාවලිය, සංස්ථාගත කිරීමේ සහතිකය, නව වාර්ෂික ප්‍රතිලාභ : 15 පෝර්මය සහ සපයා ඇති ඉහත විස්තර සම්බන්ධයෙන් සනාථ කළ හැකි වෙනත් ලියකියවිලි

3.15 කොටස් පැවරීම/නිකුත් කිරීම/වෙනස් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනාවක් තිබේද ඔව්/නැත
(කරුණාකර සහතික කළ පිටපත් අමුණන්න)

3.16 යෝජිත කොටස් හිමිකරුවන් පිළිබඳ විස්තර

පහත සඳහන් ආකෘතිය ප්‍රකාරව යෝජිත කොටස් හිමිකරුවන් පිළිබඳ විස්තර ඉදිරිපත් කළ යුතුය.

අ) සම්පූර්ණ නම :
ආ) උපන් දිනය :
ඇ) ජාතික හැඳුනුම්පත් අංකය/විදේශ ගුවන් ගමන් බලපත්‍ර අංකය :
ඈ) පුරවැසිභාවය :
ඉ) ලිපිනය (ස්ථිර) : පදිංචිය :
ඊ) දුරකථන අංකය : (ස්ථාවර) : ජංගම :
උ) ෆැක්ස් අංකය :
ඌ) විද්‍යුත් තැපැල් ලිපිනය :
එ) කොටස් ප්‍රතිශතය :
ඒ) ඇවර කිරීමට ගොස් ඇති කලින් අයිති සමාගම්වල විස්තරඃ
ඔ) කිසියම් රටක බලයලත් ආයතනයක් විසින් ප්‍රතික්ෂේප කරන ලද සමාගමක් විසින් ඉදිරිපත් කරන ලද විදුලි සංදේශ බලපත්‍රය සඳහා වන සියලුම අයැදුම්පත් පිළිබඳ විස්තර :
ඕ) ඕනෑම රටක බලයලත් ආයතනයක් විසින් අවලංගු කරන ලද සමාගමක් සතුව පැවති ඕනෑම විදුලි සංදේශ බලපත්‍රයක් පිළිබඳ විස්තරය :
ක) වෙනත් ඕනෑම ව්‍යාපාරික අවශ්‍යතා :
(එම මිලදී ගැනීම සඳහා කැමැත්ත ප්‍රකාශ කිරීමේ ලිපිය අමුණා තිබිය යුතුය)
ග) ව්‍යාපාරයක් ලෙස විදුලි සංදේශ කර්මාන්තයට සම්බන්ධ වීම සම්බන්ධ අත්දැකීම් සහ කාර්ය සාධනය විස්තරාත්මකව පැහැදිලි කරන්න.

3.17 අවසාන සම්පූර්ණ කොටස් හිමි ව්‍යුහය/විස්තරඃ
3.18 නිසි සාධාරණීකරණයක් සහිතව කොටස් හිමියා වෙනස් කිරීමට හේතුව පිළිබඳව නිසි කරුණු දැක්වීමක් සහිතව සවිස්තරාත්මක විස්තරය සපයන්න :
3.19 සංවිධාන ව්‍යුහයේ කිසියම් යෝජිත වෙනස්කම් තිබේදඃ (ඔව්/නැත)
3.20 'ඔව්' නම් කරුණාකර වර්තමාන සහ යෝජිත ආයතනික ව්‍යුහය සහ යෝජිත වෙනස්කම් පිළිබඳ සවිස්තරාත්මක විස්තරයක් සපයන්නඃ
3.21 අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජිත වෙනස්කම් තිබේදඃ (ඔව්/නැත)ඃ
3.22 'ඔව්' නම් කරුණාකර වර්තමාන සහ යෝජිත අධ්‍යක්ෂවරුන් (සංක්ෂිප්ත සාරාංශය) සහ යෝජිත වෙනස්කම් පිළිබඳ සවිස්තරාත්මක විස්තරයක් සපයන්නඃ
3.23 දැනට සිටින කාර්ය මණ්ඩලයේ කිසියම් යෝජිත වෙනස්කම් තිබේදඃ
3.24 ඔව් නම් කරුණාකර සෑම තනතුරක/තනතුරු කාණ්ඩයක වර්තමාන සහ යෝජිත කාර්ය මණ්ඩලයේ වෙනස්වීම් පිළිබඳ සවිස්තරාත්මක විස්තරයක් කරුණු සහිතව සපයන්න :
3.25 සමාගමේ වත්මන් වත්කම් සහ වගකීම්වල කිසියම් යෝජිත වෙනස්කම් තිබේදඃ (ඔව්/නැත)
3.26 'ඔව්' නම් කරුණාකර වත්කම් සහ බැරකම්වල වර්තමාන සහ යෝජිත වෙනස්කම් පිළිබඳ සවිස්තරාත්මක විස්තරයක් හේතු සහිතව ලේඛනගත සාක්ෂි සමඟ ඉදිරිපත් කරන්න :

3.27 සමාගමේ වර්තමාන සාංගමික ව්‍යවස්ථාවලියේ කිසියම් යෝජිත වෙනස්කම් තිබේද: (ඔව්/නැත)

3.28 'ඔව්' නම් කරුණාකර සමාගමේ සංගමයේ ලිපිවල වර්තමාන සහ යෝජිත වෙනස්කම් පිළිබඳ සවිස්තරාත්මක විස්තරයක් හේතු සහිතව ඉදිරිපත් කරන්න:

3.29 කරුණාකර යෝජිත වෙනත් වෙනස්කම් හේතු සහිතව ඉදිරිපත් කරන්න:

3.30 අයිතිය පැවරීම සම්බන්ධයෙන් හේතු සහිතව සවිස්තරාත්මක විස්තරයක් සපයන්න :

.......................................................................................................................................

.......................................................................................................................................

(කරුණාකර වෙන වෙනම කොළ භාවිතා කරන්න)

4. සමාගමේ පසුගිය කාර්යසාධනය පිළිබඳ විශ්ලේෂණය:

4.1 කරුණාකර එක් එක් සේවාව සඳහා පසුගිය වසර පහක පහත සඳහන් කරුණු සම්බන්ධ සංඛ්‍යාලේඛන කරුණු සහිතව ප්‍රස්ථාර නිරූපණය ආධාරයෙන් ඉදිරිපත් කරන්න.

අ) අලෙවි ආදායම :
ආ) විකුණුම් පිරිවැය :
ඇ) දළ ලාභය :
ඈ) ශුද්ධ ලාභය :
ඉ) EBITDA ( පොලීය, බදු, ක්ෂයවීම්, ණය හිලව් කිරීම යනාදියට පෙර ඉපැයීම්) :
ඊ) වත්කම් :
උ) වගකීම් :
ඌ) හිමිකරුවන්ගේ සම කොටස් :
එ) ජංගම අනුපාතය :
ඒ) ණය/සම කොටස් අනුපාතය :
ඔ) වත්කම් මත ප්‍රතිලාභ :
ඕ) මාසික දායකත්ව වර්ධනය :
ක) පාරිභෝගිකයා සේවා දායකත්වය නතර කිරීමේ වාර්ෂික ප්‍රතිශත අනුපාතය හේතු සහිතව :
ග) භාවිතයේ මිනිත්තු වර්ධනය :
ජ) පාරිභෝගිකයෙකුගේ සාමාන්‍ය ආදායමේ වර්ධනය :

4.2 හඳුනාගත් අවදානම් හා සීමාවන් සහ භාවිත කරන පාලන උපාය මාර්ග
4.2.1. වෙළඳපල අවදානම්
4.2.2. ද්‍රවශීලතා අවදානම්
4.2.3. බංකොලොත්වීමේ අවදානම්

4.3 සමාගමේ ආර්ථික කාර්යක්ෂමතාවය පිළිබඳ විශ්ලේෂණ
4.3.1 වෙන් කිරීමේ කාර්යක්ෂමතාව
4.3.2 ගතික කාර්යක්ෂමතාව
4.3.3 x - කාර්යක්ෂමතාව
4.3.4 නිෂ්පාදන කාර්යක්ෂමතාව

4.4 අභ්‍යන්තර කාර්ය සාධන විශ්ලේෂණය (Ansof, Boston Box හෝ ඕනෑම ප්‍රශස්ත ක්‍රමයක්)

4.5 බාහිර කාර්ය සාධන විශ්ලේෂණය (PESTLE, Porters 5 Forces, 8KF විශ්ලේෂණය හෝ වඩා ප්‍රශස්ත ක්‍රමයක්).

4.6. සේවාව ක්‍රියාත්මක කිරීම සහ සැපයීම සම්බන්ධයෙන් 3 වන පාර්ශවයන් සමඟ යම් ගිවිසුම් තිබේද (ඔව්/නැත)

4.7 'ඔව්' නම් කරුණාකර එවැනි සියලුම ගිවිසුම්වලට අදාළ පිටපත් ඉදිරිපත් කරන්න:

5. සමාගමේ ප්‍රක්ෂේපිත කාර්ය සාධනය

අ. නිසි හේතු සහිතව ව්‍යාපාරයේ ඕනෑම විවිධාංගීකරණයක් සම්බන්ධයෙන් නිසි කරුණු සහිතව ඉදිරිපත් කරන්න

ආ. වත්කම් ක්ෂය කිරීම සහ හිලව් කිරීම සහ ප්‍රතිස්ථාපන සහ වැඩිදියුණු කිරීම් සඳහා සැලසුම්:

ඇ. යෝජිත ව්‍යාපාරික අවදානම් සහ යෝජනා කරන ලද උපාය මාර්ග

i. වෙළඳපල
ii. ද්‍රවශීලතාවය
iii. බංකොලොත්භාවය

ඈ. ඉදිරි වසර 10 සඳහා පහත සඳහන් මූල්‍ය තොරතුරු අරමුදල් පිළිබඳ සාක්ෂි සහිතව ඉදිරිපත් කළ යුතුය:

i. ආයෝජන සහ අරමුදල් මූලාශ්‍ර:
ii. හඳිසි අරමුදල් සැලසුම්:
iii. මීළඟ බලපත්‍ර කාලය ආරම්භයේදී ණය / කොටස් අනුපාතය:
iv. යෝජිත මූල්‍ය සැලැස්ම පිළිබඳ විස්තර:
v. ප්‍රක්ෂේපිත ලාභ අලාභ ගිණුම්, ශේෂ පත්‍ර සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශ. ලාභ අලාභ ගිණුම්, ශේෂ පත්‍ර සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සකස් කළ යුතුය. වත්කම් ක්ෂයවීම් ප්‍රතිපත්ති, ග්‍රාහකයන්ගේ ප්‍රක්ෂේපන, මෙහෙයුම් වියදම්වල වාර්ෂික වෙනස්කම් යනාදී සියලුම උපකල්පන පැහැදිලිව විස්තර කළ යුතුය.
vi. මුදල් ප්‍රවාහය, අභ්‍යන්තර ප්‍රතිලාභ අනුපාතිකය (IRR), ආයෝජනයේ වට්ටම් සහිත ආපසු ගෙවීමේ කාලසීමාව ඇතුළු අදාළ මූල්‍ය ප්‍රමිතිවල පුරෝකථනයන්. තවද, ශුද්ධ වර්තමාන අගය (NPV) විස්තර දැක්විය යුතුය. ව්‍යාපෘතිය ලාභදායී වීම සඳහා අපේක්ෂිත කාල රාමුව පැහැදිලිව දැක්විය යුතුය (අදාළ නම්)
vii. යොදවා ඇති ප්‍රාග්ධනය මත ප්‍රතිලාභ, වත්කම් මත ප්‍රතිලාභ, මෙහෙයුම් ලාභ ආන්තිකය, ශුද්ධ ලාභ ආන්තිකය, ප්‍රාග්ධන ආයෝජන අනුපාතය, වත්මන් අනුපාතය, සහ ණය කොටස් අනුපාතය ඇතුළුව ප්‍රක්ෂේපිත මූල්‍ය අනුපාත. එක් එක් අනුපාතය ගණනය කිරීමේදී භාවිතා කරන සූත්‍රය ද සැපයිය යුතුය.

6. පාරිභෝගික සේවා සහ ආරක්ෂණය

අ. පාරිභෝගිකයාට සපයන ලද පාරිභෝගික පරිශ්‍ර උපකරණ (CPE) පිළිබඳ විස්තර :
ආ. පාරිභෝගික පරිශ්‍ර උපකරණ (CPE) නඩත්තු කිරීම :
ඇ. පාරිභෝගිකයන් සමඟ පවත්නා සේවා මට්ටම් ගිවිසුම් පිළිබඳ විස්තර :
ඈ. පැමිණිලි මෙහෙයවීමේ ක්‍රමවේදය/ අවම දෝෂ නිෂ්කාශන කාලය :
ඉ. බංකොලොත්භාවයට එරෙහිව පාරිභෝගික ආරක්ෂාව (රක්ෂණ ආවරණය යනාදිය) :
ඊ. සේවා ගුණාත්මකභාවය පිළිබඳ පැමිණිලි මෙහෙයවීම :
උ. බිල්පත් නිරවද්‍යතාවය සහතික කිරීම :
ඌ. කොන්දේසි සහ සේවා ගාස්තු වල විනිවිදභාවය :

7. ව්‍යාපෘති වාර්තාව

තාක්ෂණික විස්තර (විස්තීර්ණ ජාල විස්තර), මෙහෙයුම් විස්තර, සියලුම සේවා විස්තර සහ අනෙකුත් පාර්ශ්වකරුවන්ගේ විස්තර යනාදිය පැහැදිලි කරමින් වාර්තාවක් ඉදිරිපත් කළ යුතුය. දැනට පවතින සේවාව ක්‍රියාත්මක කිරීමට වඩා වෙනස් නම්, ඒ පිළිබඳ වැඩිදුර විස්තර අවශ්‍ය නම් ඉදිරිපත් කරන ලෙස කොමිෂන් සභාව විසින් ඉල්ලා සිටිය හැක.

8. ප්‍රකාශය

.............................................................. වන මම මෙම අයදුම් පත්‍රයේ සපයා ඇති සියලුම තොරතුරු සත්‍ය සහ නිවැරදි බව මෙයින් සහතික කරන අතර බලපත්‍රය ප්‍රත්‍යාදිෂ්ට කිරීමේ කොටසේ දක්වා ඇති ඕනෑම කොන්දේසියක් උල්ලංඝනය කරමින් වැරදි තොරතුරු මත පදනම්ව බලපත්‍රයක් නිකුත් කර ඇති බව පෙනී ගියහොත් බලපත්‍රය ප්‍රත්‍යාදිෂ්ට කිරීමට මගේ විරුද්ධත්වයක් නැත.

සමාගමේ බලයලත් නියෝජිතයාගේ අත්සන : ..........................

දිනය :....................

5. උපලේඛනය 4

5.1. 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ සංශෝධිත පනත ප්‍රකාරව නිකුත් කරන ලද (පහසුකම් / සේවා පදනම් කරගත්) බලපත්‍ර/ බලපත්‍ර කොන්දේසි වෙනස් කිරීමේ ක්‍රියා පටිපාටිය. විදුලි සංදේශ පද්ධතියක් ක්‍රියාත්මක කිරීමට සහ විදුලි සංදේශ සේවාවක් සැපයීම සඳහා 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ සංශෝධිත පනතේ 17 වැනි වගන්තිය ප්‍රකාරව නිකුත් කරන ලද බලපත්‍රයේ කිසියම් කොටසක් හෝ කිසියම් බලපත්‍ර කොන්දේසියක් වෙනස් කිරීම සම්බන්ධයෙන් ක්‍රියා පටිපාටිය සහ තොරතුරු මෙම කොටස මඟින් සපයයි. බලපත්‍රයක් වෙනස් කිරීම බලපත්‍රයේ පවතින කොටස සංශෝධනය කිරීම හෝ ඉවත් කිරීම හෝ බලපත්‍රයට නව කොටසක් එක් කිරීම විය හැකිය. බලපත්‍ර කොන්දේසි(ය) වෙනස් කිරීමේ ක්‍රියා පටිපාටිය සහ බලපත්‍ර කොන්දේසි හැර වෙනත් බලපත්‍රයේ වෙනත් කොටසක් වෙනස් කිරීමේ ක්‍රියා පටිපාටිය පහත දක්වා ඇත. යම් වෙළඳපල කොටසක බලපත්‍ර කොන්දේසි එවැනි සියලුම විදුලි සංදේශ ක්‍රියාකරු සමාගම් වලට පොදුවේ අදාළ වන අතර ක්‍රියාකරු සමාගමකට එවැනි වෙනස් කිරීමක් අවශ්‍ය නම්, එම වෙනස් කිරීම සියලුම ක්‍රියාකරු සමාගම් වලට බලපානු ඇති අතර එම වෙනස් කිරීම සිදු කළ හැක්කේ සමාන සේවාවන් සපයන සියලුම ක්‍රියාකරු සමාගම්වල එකඟතාව ප්‍රකාශ කළහොත් පමණි.

5.1.1. බලපත්‍ර කොන්දේසි සංශෝධනය කිරීම

5.1.1.1. ක්‍රියාකරු සමාගම විසින් ඉල්ලා ඇති වෙනස් කිරීම

i. ක්‍රියාකරු සමාගමේ මතය අනුව නම්, බලපත්‍රයේ කොන්දේසි (ය) ශ්‍රී ලංකාවේ විදුලි සංදේශ සේවා සංවර්ධනයට සහ ඍජුව හෝ වක්‍රව රටට සමාජ හා ආර්ථික ප්‍රතිලාභ ගෙන ඒමට බාධාවක් හෝ බාධාවක් වී ඇති විටෙකදී .ඉහත සඳහන් තත්ත්වයන් සහ අවශ්‍ය වෙනස් කිරීම් පිළිබඳ සවිස්තරාත්මක විස්තරයක් ලබා දෙමින් බලපත්‍ර කොන්දේසි (ය) සංශෝධනය කරන ලෙස කොමිෂන් සභාව වෙත ලිඛිත ඉදිරිපත් කළ හැකිය. එසේම, අයදුම්කරුට පමණක් සීමා වූ බලපත්‍ර කොන්දේසිවල යම් විෂමතාවයක් නිවැරදි කිරීමට ක්‍රියාකරු සමාගමකට එවැනි ඉල්ලීමක් කළ හැකිය.

ii. කොමිෂන් සභාව එසේ තීරණය කරන්නේ නම්, එවැනි කොන්දේසි (ය) සංශෝධනය කිරීම සඳහා විදුලි සංදේශ ක්‍රියාකරු සමාගම විසින් ඉදිරිපත් කරන ලද සාධාරණ හේතු විශ්ලේෂණය කිරීමෙන් පසුව, දින තිහක් ඇතුළත බලපත්‍ර කොන්දේසි (ය) වෙනස් කිරීම සම්බන්ධයෙන් මහජන සහ පාර්ශ්වකරුවන්ගේ අදහස් කැඳවමින් ජාතික පුවත්පත්වල දැන්වීමක් පළ කරනු ලැබේ.

iii. පනතේ 18 වැනි වගන්තිය ප්‍රකාරව අමාත්‍යවරයා වෙත සංශෝධන සම්බන්ධයෙන් නිර්දේශ කිරීමට පෙර මහජනතාව වෙත කෙරෙන දැනුම්දීමට ප්‍රතිචාර වශයෙන් ලැබෙන සැලකිරීම් හෝ විරෝධතා කොමිෂන් සභාව විසින් සලකා බලනු ඇත.

iv. මහජනතාව විසින් ඉදිරිපත් කරන ලද විරෝධතා සාධාරණීකරණය කිරීම සඳහා පිළිගතහැකි හේතු කොමිෂන් සභා විමර්ශනයේදී අනාවරණය කර නොගත්තේ නම්, විෂමතාවයක් නිවැරදි කිරීමට නොවේ නම්, සියලුම විදුලි සංදේශ ක්‍රියාකරු සමාගම්වල එකඟතාවය ඇතිව බලපත්‍ර කොන්දේසි (ය) වෙනස් කිරීම අමාත්‍යවරයා වෙත නිර්දේශ කරනු ලැබේ.

v. අමාත්‍යවරයාගේ එකඟතාවය ලැබීමෙන් පසු, කොමිෂන් සභාව බලපත්‍ර කොන්දේසි (ය) වෙනස් කිරීම ක්‍රියාත්මක කරනු ලබන අතර, ක්‍රියාකරු සමාගම(ම්) වෙත ලිඛිතව දන්වා එය නිල වෙබ් අඩවියේ ප්‍රසිද්ධ කරනු ඇත.

5.1.1.2. කොමිෂන් සභාව විසින් සිදු කරන සංශෝධන

i. කොමිෂන් සභාව එසේ තීරණය කරන්නේ නම්, කොමිෂන් සභාවේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා එහි බලය ක්‍රියාත්මක කිරීමේදී බලපත්‍ර කොන්දේසි (ය) වෙනස් කිරීමක් අවශ්‍ය නම්, කොමිෂන් සභාව විසින් ක්‍රියාකරු සමාගම (ම්) වෙත සංශෝධන වර්ගය, පවතින කොන්දේසි ඉවත් කිරීම නව කොන්දේසි (ය) පැනවීම සහ එම කොන්දේසි බලපාන කාලසීමාව කල්තියා දැනුම් දිය හැකිය.

ii. සංශෝධනය කළ දිනයේ සිට දින 30ක් ඇතුළත කොමිෂන් සභාවේ සලකා බැලීම සඳහා ක්‍රියාකරු සමාගම් විසින් එම සංශෝධනය කිරීම් සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කළ හැකිය.

iii. කොමිෂන් සභාව විසින් විදුලි සංදේශ ක්‍රියාකරු සමාගම (ම්) විසින් කරන ලද සැලකිරීම් සලකා බලනු ඇත. කෙසේ වෙතත්, බලපත්‍ර කොන්දේසි (ය) සංශෝධනය කිරීම සම්බන්ධයෙන් කොමිෂන් සභාවේ තීරණය අවසාන වේ. කොමිෂන්

සභාව එසේ තීරණය කරන්නේ නම්, බලපත්‍ර කොන්දේසි (ය) සංශෝධනය කිරීම අඛණ්ඩව කරගෙන යාමට, බලපත්‍රය ප්‍රසිද්ධ කළ දින සිට දින තිහක් ඇතුළත බලපත්‍ර කොන්දේසි (ය) සංශෝධනය කිරීම සම්බන්ධයෙන් මහජනතාවගේ සහ පාර්ශ්වකරුවන්ගේ අදහස් විමසීම සඳහා ජාතික පුවත්පත්වල දැන්වීමක් ප්‍රකාශයට පත් කෙරේ.

iv. පනතේ 18 වැනි වගන්තිය ප්‍රකාරව අමාත්‍යවරයාට සංශෝධන සම්බන්ධයෙන් නිර්දේශ කිරීමට පෙර මහජනතාවට දැනුම්දීමට ප්‍රතිචාර වශයෙන් ලැබෙන සැලකිරීම් හෝ විරෝධතාවයන් කොමිෂන් සභාව විසින් සලකා බලනු ඇත.

v. මහජනතාව විසින් ඉදිරිපත් කරන ලද විරෝධතා සාධාරණීකරණය කිරීම සඳහා පිළිගතහැකි හේතු කොමිෂන් සභා විමර්ශනයේදී අනාවරණය කර නොගත්තේ නම්, අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනීම පිණිස බලපත්‍ර කොන්දේසි (ය) සංශෝධනය සම්බන්ධයෙන් අමාත්‍යවරයා වෙත නිර්දේශ කරනු ලැබේ.

vi. අමාත්‍යවරයාගේ අනුමැතිය ලැබීමෙන් පසු, කොමිෂන් සභාව බලපත්‍ර කොන්දේසි(ය) සංශෝධනය කිරීම ක්‍රියාත්මක කරනු ලබන අතර, විදුලි සංදේශ ක්‍රියාකරු සමාගම (ම්) වෙත ලිඛිතව දන්වා එය නිල වෙබ් අඩවියේ ප්‍රසිද්ධ කරනු ඇත.

5.1.2. බලපත්‍රයේ කොන්දේසි හැර බලපත්‍රයේ වෙනත් ඕනෑම කොටසක් සංශෝධනය කිරීම

බලපත්‍ර කොන්දේසි හැර බලපත්‍රයේ යම් කොටසක්/වගන්තියක් සංශෝධනය කිරීමට අවශ්‍ය නම්, එවැනි සංශෝධනය කිරීම් සඳහා ගරු නීතිපතිවරයාගේ නීති උපදෙස් වලට යටත්ව 5.1.1.1 සහ 5.1.1.2 වගන්තිවල දක්වා ඇති ක්‍රියා පටිපාටිය අනුගමනය කළ යුතුය.

## 6. උපලේඛනය 5

6.1. 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ සංශෝධිත පනත ප්‍රකාරව නිකුත් කරන ලද (පහසුකම්/සේවාව මත පදනම් වූ) බලපත්‍ර අවලංගු කිරීමේ ක්‍රියා පටිපාටිය

6.1.1. 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ සංශෝධිත පනතේ 17 වැනි වගන්තිය ප්‍රකාරව විදුලි සංදේශ පද්ධතියක් ක්‍රියාත්මක කිරීම සහ විදුලි සංදේශ සේවා(ව) සැපයීමේ බලපත්‍ර ප්‍රත්‍යාදිෂ්ට කිරීමේ ක්‍රියා පටිපාටිය සහ තොරතුරු මෙම කොටස මඟින් සපයයි.

6.1.2 මෙම වගන්තියේ විස්තර කර ඇති ඕනෑම අවස්ථාවක කොමිෂන් සභාව විසින් බලපත්‍රය ප්‍රත්‍යාදිෂ්ට කරන අවස්ථාවකදී, ගෙවන ලද බලපත්‍ර ගාස්තුව (කොටස් පදනමක් මත හෝ වෙනත් පදනමක් මත) ආපසු ගෙවනු නො ලැබේඃ

6.2. බලපත්‍රය ප්‍රත්‍යාදිෂ්ට කිරීමේ කොන්දේසි

කොමිෂන් සභාව විසින් පහත සඳහන් කොන්දේසි යටතේ බලපත්‍රය ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබිය හැකිය ;

i. විදුලි සංදේශ ක්‍රියාකරු සමාගම විසින් බලපත්‍රය අවලංගු කළ යුතු බවට අමාත්‍යවරයා සමඟ ලිඛිතව එකඟ වීම;

ii. ගෙවිය යුතු යම් මුදලක් නොගෙවන්නේ නම් සහ ගෙවීම් කල් ඉකුත් වී ඇති බව කොමිෂන් සභාව විසින් ක්‍රියාකරු සමාගම වෙත දැනුම් දීමෙන් පසු දින 14ක කාලයක් ගත වුවද එම මුදල නොගෙවා පැවතීම ;

iii. පනත ප්‍රකාරව කොමිෂන් සභාවේ නියෝගයක් පිළිපැදීමට විදුලි සංදේශ ක්‍රියාකරු සමාගම අපොහොසත් වන්නේ නම් සහ එම නියෝගය අභියාචනා ක්‍රියාදාමයට යටත් නොවේ නම් සහ එම අපොහොසත්වීම ක්‍රියාකරු සමාගම වෙත ලිඛිතව දැනුම්දීමෙන් පසුව මාස 3ක් ඇතුළත එම අසාර්ථකත්වය නිවැරදි නොකිරීම ;

iv. එවැනි උල්ලංඝනය කිරීමක් පිළිබඳ කොමිෂන් සභාව විසින් දැනුම් දීමෙන් පසු දින 14 කට වඩා වැඩි කාලයක් සඳහා පනත යටතේ බලාත්මක වන යම් රීතියක් හෝ රෙගුලාසියකට අනුකූල වීමට ක්‍රියාකරු සමාගම අපොහොසත් වීම;

v. විදුලි සංදේශ ක්‍රියාකරු සමාගමේ ක්‍රියාවන් ජාතික ආරක්ෂාවට අහිතකර බලපෑමක් ඇති කිරීමට ඉඩ තිබීම;

vi. විදුලි සංදේශ ක්‍රියාකරු සමාගම විසින් විදුලි සංදේශ පද්ධති බලපත්‍රය නිකුත් කර ඇති සමාගමේ හිමිකාරිත්වය කොමිෂන් සභාවේ පූර්ව අනුමැතියකින් තොරව බලපත්‍රයේ වලංගු කාල සීමාව තුළ කිසියම් පුද්ගලයෙකුට/ ආයතනයකට අර්ධ වශයෙන් හෝ සම්පූර්ණයෙන් විකිණීම, බදු දීම හෝ පැවරීම සිදු කිරීම;

vii. බලපත්‍රය නිකුත් කිරීම විදුලි සංදේශ ක්‍රියාකරු සමාගම විසින් සපයන ලද සාවද්‍ය හෝ වැරදි තොරතුරු මත පදනම් වී ඇති බව පෙනී යාම;

viii. බලපත්‍රය ප්‍රදානය කිරීමෙන් වසර දෙකක් ඇතුළත ක්‍රියාකරු සමාගම විසින් සේවා සැපයීම ආරම්භ කර නොමැති වීම;

ix. සේවාව ආරම්භ කිරීමෙන් පසු අඛණ්ඩව දින 7කට වඩා වැඩි කාලයක් හෝ වසරක් ඇතුළත 5 වතාවකට වඩා එක් දිනකට වඩා වැඩි කාලයක් සේවා සැපයීමට ක්‍රියාකරු සමාගම අපොහොසත් වීම;

x. කොමිෂන් සභාව විසින් අසාර්ථක වූ බවට ලිඛිතව දැනුම් දීමෙන් පසු මාස තුනකට වඩා වැඩි කාලයක් කොමිෂන් සභාවේ කිසියම් නියෝගයකට අනුකූල වීමට ක්‍රියාකරු සමාගම අපොහොසත් වීම;

xi. වසරකට වැඩි කාලයක් බලපත්‍රලාභී පද්ධතියේ ක්‍රියාකාරිත්වය සඳහා අවශ්‍ය වෙනත් බලපත්‍රයක් ලබා ගැනීමට ක්‍රියාකරු සමාගම අපොහොසත් වීම.

6.3 බලපත්‍ර ප්‍රත්‍යාදිෂ්ට කිරීමේ සහ බලපත්‍ර සම්බන්ධ අභියාචනා ඉදිරිපත් කිරීමේ ක්‍රියා පටිපාටිය

6.3.1. 6.2 (i) වගන්තිය හැර වෙනත් ඕනෑම අවස්ථාවක, කොමිෂන් සභාව විසින් බලපත්‍රය ප්‍රත්‍යාදිෂ්ට කිරීමට අමාත්‍යවරයාට නිර්දේශ කිරීම පිණිස කොමිෂන් සභාවේ අදහස සහ උල්ලංඝනය කරන ලද කොන්දේසි සම්බන්ධයෙන් ක්‍රියාකරු සමාගමට දැනුම් දිය යුතු අතර, කොමිෂන් සභාව විසින් එම බලපත්‍රය ප්‍රත්‍යාදිෂ්ට නොකිරීමට හේතු පැහැදිලි කිරීම සඳහා ක්‍රියාකරු සමාගමට දින 30ක් ලබා දිය යුතුය.

6.3.2. නියමිත කාල සීමාව තුළ විදුලි සංදේශ ක්‍රියාකරු සමාගම විසින් ඒ සම්බන්ධයෙන් පිළිගත හැකි හේතු ඉදිරිපත් කරන්නේ නම්, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එම කාරණය සම්බන්ධයෙන් විමර්ශනය කර කොමිෂන් සභාව වෙත නිර්දේශ ඉදිරිපත් කිරීමට කමිටුවක් පත් කළ හැකිය.

6.3.3. කමිටුවේ තීරණය හේතු සහිතව ක්‍රියාකරු සමාගම වෙත දන්වනු ලැබේ. කෙසේ වෙතත්, එම දැනුම්දීමේ දිනයේ සිට දින 14 ක් ඇතුළත ක්‍රියාකරු සමාගමට කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කළ හැකිය.

6.3.4. කමිටුවේ තීරණය සහ කමිටුවේ තීරණය මත ක්‍රියාකරු සමාගම විසින් කරන ලද අභියාචනය මත පදනම්ව බලපත්‍රය ප්‍රත්‍යාදිෂ්ට කිරීම සඳහා අමාත්‍යවරයා වෙත නිර්දේශ කිරීමේ අවසන් තීරණය කොමිෂන් සභාව සතුවේ.

6.3.5. කොමිෂන් සභාව එසේ බලපත්‍රය ඉල්ලා අස්කර ගැනීමට තීරණය කරන්නේ නම්, දින 30ක බලපත්‍රය ප්‍රත්‍යාදිෂ්ට කිරීමේ නිවේදනයට අත්සන් කරන ලෙස කොමිෂන් සභාව අමාත්‍යවරයාට ලිඛිතව නිර්දේශ කළ යුතු අතර දින 30කට පසු එම බලපත්‍රය ඉල්ලා අස්කර ගැනීමට ක්‍රියාකරු සමාගමට හැකිවේ .

6.3.6. විදුලි සංදේශ ක්‍රියාකරු සමාගම් විසින් අමාත්‍යවරයා වෙත තවදුරටත් කරුණු ඉදිරිපත් කළ හැකි අතර 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ සංශෝධිත පනතේ 17 වැනි වගන්තිය ප්‍රකාරව නිකුත් කරන ලද බලපත්‍රය ප්‍රත්‍යාදිෂ්ට කිරීම සම්බන්ධයෙන් අමාත්‍යවරයාගේ තීරණය අවසාන තීරණය වේ.

6.3.7. අමාත්‍යවරයා එසේ බලපත්‍රය ප්‍රත්‍යාදිෂ්ට කිරීමට තීරණය කරන්නේ නම්, නිකුත් කළ බලපත්‍රයේ මුල් පිටපත ක්‍රියාකරු සමාගම විසින් භාර දීමට සිදුවේ.

6.3.8. බලපත්‍රය ප්‍රත්‍යාදිෂ්ට කිරීම පිළිබඳව පොදු මහජනතාවගේ දැනගැනීම සඳහා ජාතික පුවත්පත්වල දැන්වීමක් පළකිරීමට කොමිෂන් සභාව ක්‍රියා කරනු ඇත.

6.3.9. විදුලි සංදේශ පද්ධතියේ සියලුම ජාල කොටස් මුද්‍රා තැබීමට කොමිෂන් සභාව ක්‍රියා කළ යුතුය.

6.4. බලපත්‍ර භාරදීම

6.4.1. විදුලි සංදේශ සේවා ක්‍රියාත්මක කිරීමට සහ සැපයීමට තවදුරටත් සම්බන්ධ නොවන්නේ නම්, ක්‍රියාකරු සමාගමට සිය බලපත්‍ර (ය) භාර දීමට කටයුතු කළ හැකිය.

6.4.2. ක්‍රියාකරු සමාගම විසින් සිය බලපත්‍රය භාරදීමේ අදහස ලිඛිත දැනුම්දීමක් මගින් ඉදිරිපත් කිරීමට අවශ්‍ය වේ, එහි දී එම ලිඛිත ඉල්ලීම සමඟ බලපත්‍රය (වල) මුල් පිටපත (ත්) ඇමිණිය යුතුය.

6.4.3. බලපත්‍රයක් භාරදීම වෙනස් කළ නොහැක.

6.4.4. විවිධ විදුලි සංදේශ සේවා සැපයීම පිණිස පද්ධති බලපත්‍රයක් ලබා ගැනීමට වෙනත් ඉල්ලීමක් සිදුකරන අවස්ථාවකදී කොමිෂන් සභාවට ක්‍රියාකරුගේ වගකිවයුතු ක්‍රියාකලාපය මෙමගින් පිළිබිඹු කෙරෙන බැවින් බලපත්‍රය අලුත් කිරීමට පෙර බලපත්‍රය භාරදීමට ක්‍රියාකරන මෙන් සිය වගකීම් සපුරාලීමට අසමත් විදුලි සංදේශ ක්‍රියාකරු සමාගම් සඳහා අවවාද කරනු ලැබේ.

EOG 10 - 0256

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.